

# සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්

## වාර්ෂික වාර්තාව 2017

ප්‍රවර්ධිත සැපයුමක්

# අන්තර්ගතය


## 01
### ආයතනික දළ විශ්ලේෂණය

දැක්ම හා මෙහෙවර 01
අප ගැන 02
කාර්යසාධන වැදගත් අවස්ථා 05
වසර දෙස බැල්මක් 06
සම්මාන සහ ප්‍රදානයන් 08

## 10
### අපේ නායකත්වය

සභාපතිතුමාගේ පණිවිඩය 10
කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ පණිවිඩය 12
අධ්‍යක්ෂ මණ්ඩලය 14
කළමනාකරණ කණ්ඩායම 18

## 21
### කළමනාකරණ සාකච්ඡා හා විග්‍රහය

මෙහෙයුම් පරිසරය 22
මූල්‍ය ප්‍රාග්ධනය 24
නිෂ්පාදිත ප්‍රාග්ධනය 30
මානව ප්‍රාග්ධනය 33
සමාජීය හා සම්බන්ධතා ප්‍රාග්ධනය 40
ස්වභාවික ප්‍රාග්ධනය 46

## 48
### පාලනය සහ අනුකූලතාව

ආයතනික පාලනය 49
අවදානම් කළමනාකරණය 54
අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 61
විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව 64

## 67
### මූල්‍ය තොරතුරු

විගණකාධිපති වාර්තාව 68
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 71
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය 72
ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය 73
මුදල් ප්‍රවාහ ප්‍රකාශය 74
මූල්‍ය ප්‍රකාශන වලට සටහන් 75
වසර පහක මූල්‍ය සාරාංශය 104

ආයතනික තොරතුරු ඇතුල් කවරයේ පිටුපස

# දැක්ම

දකුණු ආසියාවේ වඩාත්ම කාර්යක්ෂම තෙල් ක්‍රියාකරවුම් පර්යන්ත්‍රය බවට පත්වීම.

# මෙහෙවර

පාර්ශව කරුවන්ගේ අපේක්ෂාවන් ඉටු කරමින් දිවයිනේ වඩාත්ම කාර්යක්ෂම හා ක්‍රියාකාරී සේවාවක් පවත්වා ගැනීමටත්, පාරිභෝගික අවශ්‍යතා සපුරාලමින් සපයන්නා වූ ඛණිජ තෙල් නිෂ්පාදන ධාරිතාවේ ගුණාත්මකභාවය සහතික කරමින්, අඛණ්ඩව වර්ධනයකින් යුතු පාරිභෝගිකයා තෘප්තිමත් කරන්නා වූ සේවයක් සැලසීමටත්, කැපවීමටත්, මහජන හා පාරිභෝගිකයන්ගේ ප්‍රතිචාර හා මාර්ගෝපදේශකත්වය මත පදනම් වූ පරිසරයට ගෞරවය දක්වමින් හා එහි ප්‍රමිතීන් සුරකිමින්, නීතිගරුක තෘප්තිමත් මනා පුහුණුවක් හා කැපවීමකින් යුත්, ශ්‍රම බලකායේ සහභාගිත්වය ලබාදීමත්, අපගේ මෙහෙවරය.



# අප ගැන

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජය සතු ව්‍යාපාරික ආයතන පොදු සමාගම්වලට හැරවීමේ පනතේ 2 (1) වගන්තිය ප්‍රකාරව විධිමත් ලෙස සංස්ථාපනය කරන ලද සමාගමක් වන අතර එයට 2003 ඔක්තෝබර් 13 දිනැති අංක 1310/8 දරණ රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ වඩාත් පූර්ණ ලෙස විස්තර කර ඇති තෙල් පර්යන්ත, ගබඩා පහසුකම්, නළ මාර්ග සහ ඉන්ධන ප්‍රවාහන වාහන යනාදියෙන් සමන්විත පොදු භාවිත පහසුකම්වල අයිතිය ඇත.

ශ්‍රී ලංකාවේ ඛණිජ තෙල් නිෂ්පාදන හැසිරවීම සඳහා වූ උසස් තත්ත්වයේ යටිතල පහසුකම්වලින් සමන්විත ඛණිජ තෙල් තොග ගබඩා කිරීමේ හා බෙදා හැරීමේ නියුක්ත සමාගමක් වන්නෙමු. තරඟකාරී සහ යහපත් ලෙස ඉන්ධන ගබඩා කිරීම හා බෙදාහැරීම ගොඩ නැගීම තුළින් ශ්‍රී ලංකා සංවර්ධන ගමන්මඟට සහයවීම සඳහා අපගේ බැඳීම පෙන්වා දෙමින් අපගේ පාර්ශවකාර වටිනාකම් කොටස අඛණ්ඩව ශක්තිමත්කරමින් සිටින්නෙමු.

මෙම සමාගම එහි ප්‍රාග්ධන කොටසින් 2/3 ක් අයත් ලංකා ඛණිජ තෙල් සංස්ථාවේ පරිපාලිත සමාගමක් වන අතර ඉතිරිය ඉන්දියන් තෙල් සමාගමට අයත් වේ. බලශක්ති ක්ෂේත්‍රය තුළ පාරිසරික තිරසාරත්වය සහතික කරමින් කොටස්කරුවෙක් වීමට මව් සමාගමේ ආසන්න වශයෙන් අත්දැකීම සහ පළපුරුද්ද තුළින් සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ප්‍රතිලාභ ලබයි.

රටේ සිල්ලර පාරිභෝගිකයින්ගේ සහ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය තුළ සම්බන්ධ විවිධ කාර්මික අංශයන් හී තොග පාරිභෝගිකයින් විශාල සංඛ්‍යාවකගේ බලශක්ති සපුරාලීම ලංකා ඛණිජ තෙල් සංස්ථාවට සහ ඉන්දියන් තෙල් සමාගමට අයත් දිවයින පුරා පිහිටි ඉන්ධන පිරවුම්හල් දහසකට පමණ අපි සේවය කරන්නෙමු. මේ සඳහා සමාගමේ විවිධ කටයුතුවල ක්‍රියාකාරී ලෙස සහභාගිවන 3000ක පමණවන සේවකයින් සමගින් ගබඩා කිරීමේ, බෙදාහැරීම් ජාලයේ නියුක්ත තොග ගබඩා 11ක් ප්‍රධාන පර්යන්ත දෙකට සහය වේ.

### ප්‍රධාන පර්යන්තයන්

- කොලොන්නාව නිමාව හා මුතුරාජවෙල පර්යන්තය

### තොග ගබඩා

- අනුරාධපුර
- මඩකලපුව
- හපුතලේ
- බදුල්ල
- ගාල්ල
- කන්කසන්තුරේ
- කොටගල
- මාතර
- සරසවි උයන
- කුරුණෑගල
- පේරාදෙනිය



කොලොන්නාව නිමාව පෙට්‍රෝලියම් නිෂ්පාදන 12ක් මෙහෙයවන අතර මුතුරාජවෙල පෙට්‍රෝලියම් නිෂ්පාදන 5ක් මෙහෙයවයි.

කොලොන්නාව හා මුතුරාජවෙල ප්‍රධාන පර්යන්තයන් දෙක මෙහෙයවන ලංකා ඛනිජ තෙල් සංස්ථාව සහ ඉන්දියන් තෙල් සමාගම යන අලෙවිකරණ සමාගම් වෙනුවෙන් පෙට්‍රෝලියම් නිෂ්පාදන බෙදාහැරීම සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි බෙදාහැරීමේ කාර්යය භාරගන්නා අතර දිවයින පුරා පෙට්‍රෝලියම් නිෂ්පාදන බෙදාහැරීම ශක්තිමත් කරයි. CPSTL විසින් බාහිර තොග ගබඩා 11ක් සහ අභ්‍යන්තර දුම්රිය ගබඩා මෙහෙයවමින් සිටී. මෙවැනි ස්ථානවලට සහ අභ්‍යන්තර දුම්රිය ගබඩාව වෙත නිෂ්පාදන නැවත පිරවීම CPSTL සහ ප්‍රධාන පර්යන්තයන්හී කුලියට ගත් මාර්ග බවුසර් භාවිතයෙන් කොලොන්නාව නිමාව තුළ පිහිටි දුම්රිය බොගී තුළින් සිදුවේ. ගුවන්යානා ඉන්ධන කොලොන්නාවේ නිමාවේ පමණක් ගබඩා කරන අතර දුම්රිය මගින් කටුණායක බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපලට මාරු කරනු ලැබේ. ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් මෙහෙයවනු ලබන රත්මලාන සහ අනෙකුත් ගුවන් ක්ෂේත්‍රයන් ඔවුන්ගේ අවශ්‍යතාවය මාර්ගයෙන් ලබා ගනී. සල්ප අඩු දැවි තෙල් මුතුරාජවෙල නිමාවේ පමණක් ගබඩා කරන අතර විශේෂ නළ මාර්ගයක් තුළින් කෙරවලපිටිය බලශක්ති පිරියතට මාරු කරනු ලැබේ.





කොලොන්නාවේ නිමාවට පිරිපහදුවෙන් සහ කොළඹ වරායේ ඩොල්පින් ජැටියේදී මුදාහරින ලද ආනයනික තෙල් පටවන නැව් තුළින් නිෂ්පාදන ලැබේ. මුතුරාජවෙල පර්යන්තය වෙත කෙරවලපිටිය තීරය පිට ආසන්න වශයෙන් කිමී 6ක් දුර පිහිටි SPBM තුළින් ආනයනික කාර්ගෝ පමණක් ලැබේ.

| ව්‍යාපාරික සිරස | ස්ථානගතකිරීම |
|---|---|
| ඔටෝමෝටිඩ් ඉන්ධන ගබඩාව | මෙට්රික් ටොන් 450,000ක් පමණ වන ආනයන සහ පිරිපහදු විවිධ වර්ගයේ පෙට්‍රෝලියම් කොලොන්නාව සහ මුතුරාජවෙල සහ දිවයින පුරා ගබඩාවල අපි තැන්පත් කරමු. |
| ඔටෝමෝටිව් ඉන්ධන බෙදාහැරීම | වර්තමානයේ අපි දිවයින පුරා මෙරට ඔටෝමෝටිඩ් පෙට්‍රෝලියම් නිෂ්පාදනවලින් 85%ක් අපි ලබා දෙන්නෙමු. |
| මාර්ග ටැන්කර් | ප්‍රධාන බෙදාහැරීම් මාර්ගය මාර්ග ටැන්කර් වන අතර එය දිවයින පුරා පෙට්‍රෝලියම් නිෂ්පාදන ප්‍රවාහනයෙන් 66%කට ආසන්නව දායක වේ. |
| දුම්රිය වැගන් | දෙවන ප්‍රධාන බෙදාහැරීම් මාර්ගය වන්නේ දුම්රිය මාර්ග ප්‍රවාහනය වන අතර එය දිවයින පුරා පෙට්‍රෝලියම් නිෂ්පාදන ප්‍රවාහනයෙන් 17%කට ආසන්නව දායක වේ. |
| නළ මාර්ගය | අනෙක් බෙදාහැරීමේ මාර්ගය නළ මාර්ග මාරුකිරීම් වන අතර එය ප්‍රධාන වශයෙන් කැලණි තිස්ස සහ කෙරවලපිටිය සහ සපුගස්කන්ද පිරිපහදුව සඳහාය. |


කන්කසන්තුරේ තොග ගබඩාව
අනුරාධපුර තොග ගබඩාව
මඩකලපුව තොග ගබඩාව
කුරුණෑගල තොග ගබඩාව
පේරාදෙනිය තොග ගබඩාව
මුතුරාජවෙල පර්යන්තය
සරසවි උයන තොග ගබඩාව
කොලොන්නාව පර්යන්තය
කොටගල තොග ගබඩාව
බදුල්ල තොග ගබඩාව
හපුතලේ තොග ගබඩාව
ගාල්ල තොග ගබඩාව
මාතර තොග ගබඩාව

# කාර්යසාධන වැදගත් අවස්ථා

| ප්‍රාග්ධනය | | | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|
| මූල්‍ය ප්‍රාග්ධනය | **ක්‍රමෝපායික ප්‍රමුඛතාව : මූල්‍ය වර්ධනය** | | | | |
| | ආදායම | ශ්‍රීලංරු | 14,176 | 12,663 | 11,687 |
| | මෙහෙයුම් ලාභය | ශ්‍රීලංරු | 3,208 | 2,406 | 1,917 |
| | බදු පෙර ලාභය/අලාභය | ශ්‍රීලංරු | 3,273 | 2,330 | 1,716 |
| | බදු පසු ලාභය/අලාභය | ශ්‍රීලංරු | 2,717 | 1,949 | 1,407 |
| | ස්කන්ධය මත ඉපයීම | % | 11% | 9% | 7% |
| | **මූල්‍ය ස්ථාවරත්වය** | | | | |
| | මුළු වත්කම් | ශ්‍රීලංරු | 29,991 | 28,059 | 27,270 |
| | මුළු වගකීම් | ශ්‍රීලංරු | 4,828 | 5,208 | 5,881 |
| | කොටස්හිමි අරමුදල | ශ්‍රීලංරු | 25,163 | 22,851 | 21,389 |
| | මුදල් හා මුදලට සමාන දෑ | ශ්‍රීලංරු | 1,474 | 2,455 | 748 |
| | **කොටස්හිමියන්ගේ තොරතුරු** | | | | |
| | කොටසක ඉපයීම | ශ්‍රීලංරු | 3.73 | 2.32 | 1.83 |
| | කොටසක ලාභාංශය (ගෙවූ) | ශ්‍රීලංරු | 0.54 | 0.65 | - |
| | කොටසක ශුද්ධ වත්කම් අගය | ශ්‍රීලංරු | 33 | 30 | 29 |
| | ආර්ථික අගය එකතු කිරීම | ශ්‍රීලංරු | 1,394 | 799 | 507 |
| නිෂ්පාදිත ප්‍රාග්ධනය | **ක්‍රමෝපායික ප්‍රමුඛතාව : මෙහෙයුම් අනර්ඝත්වය** | | | | |
| | දේපල, පිරියත හා උපකරණ | | | | |
| | පර්යන්ත ගබඩා | ගණන | 14 | 14 | 14 |
| | ප්‍රාග්ධන වියදම | ශ්‍රීලංරු | 833 | 913 | 224 |
| මානව ප්‍රාග්ධනය | **ක්‍රමෝපායික ප්‍රමුඛතාව : ජනතාව තුළ ආයෝජනය** | | | | |
| | මුළු සේවකයින් | ගණන | 3,045 | 3,118 | 2,964 |
| | කාන්තා නියෝජනය | ගණන | 343 | 351 | 338 |
| | සේවකයින්ට ගෙවීම් | ශ්‍රීලංරු.මි | 5,570 | 5,782 | 5,307 |
| | සේවක බෙදීම් අනුපාතය | % | 1% | 1% | 1% |
| | පුහුණු තුළ ආයෝජනය | ශ්‍රීලංරු.මි | 32 | 30 | 27 |
| | මුළු පුහුණු පැයගණන | පැය | 21,832 | 26,088 | 17,928 |
| | සාමාන්‍ය පුහුණු පැය/සේවකයා | පැය | 9 | 11 | 9 |
| | සේවකයෙකුට ආදායම | ශ්‍රීලංරු.මි | 4.67 | 4.06 | 3.93 |
| | සේවකයෙකුට ශුද්ධ ලාභය (අලාභය) | ශ්‍රීලංරු.මි | 0.90 | 0.63 | 0.47 |
| සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය | වක්‍ර සේවකයින් (ආසන්න වශයෙන්) | ගණන | 105 | 114 | 121 |
| | පාරිභෝගික ස්පර්ශක ස්ථාන | ගණන | 40 | 40 | 40 |
| | ආයතනික සමාජීය වගකීම් තුළ ආයෝජනය | ශ්‍රීලංරු.මි | 6.10 | 5.70 | 16.80 |
| | ප්‍රතිලාභීන් ගණන (ආසන්න වශයෙන්) | ගණන | 8,500 | 7,000 | 12,000 |
| | රජයට දායකත්වය | ශ්‍රීලංරු.මි | 2,175 | 1,895 | 1,303 |
| ස්වාභාවික ප්‍රාග්ධනය | **ක්‍රමෝපායික ප්‍රමුඛතාව : තිරසාරත්වය** | | | | |
| | බලශක්ති පරිභෝජනය | කි.වොට් | 2,904,300 | 2,914,112 | 2,942,078 |
| | ජල පරිභෝජනය | කි.ලී | 275,720 | 268 ,120 | 249,150 |

# වසර දෙස බැල්මක්

## විකුණුම් පරිමාව

**5,447,413**

(කි.ලි)

## වත්කම් පදනම

**30**

ශ්‍රීලං රු.බි.

## මෙතෙක් ඉහළම ආදායම

**14** ශ්‍රීලං රු.බි.

## මෙතෙක් ඉහළම බදු පසු ආදායම

**2.8** ශ්‍රීලං රු.බි.

ආදායම (ශ්‍රීලං. රු.මි.)




බදු පසු ලාභය (ශ්‍රීලං. රු.මි.)




විකුණුම් පරිමාව (කි.ලි)



මුළු වත්කම් (ශ්‍රීල.රු.බි)




පිරිවැටුම් වත්කම් (%)




වර්තක අනුපාතය (කාලය)




කොටස්හිමි අරමුදල (ශ්‍රීලං රුමි.)




ස්කන්ධය මත ඉපයීම (% )




තෝලන අනුපාතය (කාලය)




කොටසක ශු.ව.අගය (ශ්‍රීලං රු)



# සම්මාන සහ ප්‍රදානයන්

අපගේ බැඳීම නැවත තහවුරු කරමින්, මූල්‍ය වර්ෂය පුරාම ගෞරව ප්‍රදානයන් කිහිපයක් සමඟ අප පිළිගෙන ඇත.

**CNCI කර්මාන්ත අනර්ඝත්ව සම්මාන උත්සවයේදී ජාතික ලෝකඩ සම්මානය සහ ඉහළම අනර්ඝත්ව සම්මානය**

අඛණ්ඩව දෙවන වරටත්, ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය විසින් සංවිධානය කරන ලද කර්මාන්ත අනර්ඝත්වය සඳහා ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලයේ කර්මාන්ත අනර්ඝත්ව උත්සවයේදී ජාතික මට්ටමේ රාජ්‍ය අංශය සහ ඉහළම ජයග්‍රහකයා පිළිබඳ ලෝකඩ සම්මානය සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් විසින් දිනා ගන්නා ලදී.

**සමාජ සංවාදය සහ සේවා ස්ථාන සහයෝගිතාව පිළිබඳ ලෝකඩ සම්මානය -2017**

කම්කරු අමාත්‍යංශයේ මානව සම්පත් සංවර්ධන අංශයේ සමාජ සංවාදය සහ සේවා ස්ථානවල සහයෝගිතා ඒකකය විසින් සංවිධානය කළ සමාජ සංවාදය සහ සේවා ස්ථානවල සහයෝගිතා සම්මානය 2017 මහා පරිමාණ සේවා අංශය යටතේ ලෝකඩ සම්මානය සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් විසින් දිනා ගන්නා ලදී.



## සම්මාන සහ ප්‍රදානයන් (ඉතිරි කොටස)












# සභාපතිතුමාගේ පණිවිඩය



"2017 දී, CPSTL 2016 වසරට වඩා 12%ක වර්ධනයක් සමගින් විකුණුම් පරිමාව තුළ ශ්‍රීලංරු.බි.14ක් උපයන ලදී. ලාභය ශ්‍රීලංරුමි 6,775ක් වූ අතර, එය පෙර වසරට වඩා 13%ක වැඩිවීමකි. ශුද්ධ ලාභය ශ්‍රීලං.රු.මිලියන් 2,717ක් වූ අතර එය 2016ට වඩා 39%ක වැඩිවීමකි. 2017 වසරේදී ගෙවන ලද 2016 ලාභාංශය වන කොටසකට ශ්‍රී.ලංරු 0.54 මේ දක්වා ගෙවන ලද ඉහළම අගය වේ. ස්ථාවර ලාභාංශ ප්‍රතිපත්තියක් සහ යහපත් ව්‍යාපාර කාර්යසාධනය කොටස් හිමියන්ගේ ඉපයීම් උපරිම කිරීමට සහතිකවීමක් වන අතර CPSTL හි කොටස්හිමියන්ගේ ප්‍රතිපත්තිය ප්‍රධාන ප්‍රතිඡ්ඨාවකි."

## සභාපතිතුමාගේ පණිවිඩය (ඉතිරි කොටස)

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්, සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් සඳහා තවත් සුවිශේෂී වසරක් පිළිබඳ නිවේදනය කිරීමට ලැබීම මාහට ගෞරවයකි.

2017 වසරේ එහි කාර්යසාධනය තුළ සැලකියයුතු වර්ධනයක් සමඟ 2018 නව මූල්‍ය වර්ෂයට පියවර තැබුවෙමි. මෙම වසර තුළ අපගේ අරමුණ වන්නේ ලාභදායිතාව සහ මහජන සේවාව තුළ වඩා ඉහල අනර්ඝත්වයක් අත්කර ගැනීමයි.

රටතුළ ප්‍රමුඛතම ඛණිජ තෙල් නිෂ්පාදන මෙහෙයවන සමාගම ලෙස අපි වක්‍රව සහ ඍජුව ගණනය කළ නොහැකි ආකාරයකින් අප රටේ පුරවැසියන් මිලියන 21ක දෛනික ජීවිත ස්පර්ශ කරමු. අපගේ ප්‍රධාන වගකීම වන්නේ අවසාන පරිශිලකයින්ට මෙන්ම අපගේ බෙදාහරින්නන් සහ පර්යන්ත පහසුකම භාවිතා කරන්නන් වෙත පහසු බාධා රහිත ලෙස ඛණිජ තෙල් නිෂ්පාදන සැපයීමයි. අපගේ මනාව පුහුණු කළ ශ්‍රම බලකායේ කැපවීම නොමැතිව මෙම අරමුණු අත්කරගැනීමට අපහසු වනු ඇත. අපගේ පාරිභෝගිකයින් සහ අපගේ සේවකයින් සුරක්ෂිත කිරීම, පරිසරය ආරක්ෂා කිරීම සහ රටේ ආර්ථිකයට දායකවීම අප ගොඩ නගන සහ අප විසින් කරගෙන යන ව්‍යාපාරයේ ප්‍රධාන කුළුණු තුන වේ.

### අපගේ කාර්යසාධනය

මූල්‍ය ස්ථාවරත්වය යනු වර්ධනය සහ සංවර්ධනය සඳහා දායක වෙන CPSTL, ශක්තිය වේ. වාර්ෂික අයවැය සකස් කිරීම සඳහා ක්‍රමෝපායික අරමුණු සමඟ ඉදිරියට යමින් සමාගම හා සමගාමී කාර්යය සැලැස්මක් සමඟ ශූන්‍යතාව පදනම් අයවැයක් හඳුන්වාදීමට මෙයට හේතු වේ. වාර්ෂික අයවැයේ සියලූම සංරචක පිරිවැය ඵලදායී, අදාළ බව සහතික කිරීමට සහ, වර්ධිත ඉතුරුම් ඉදිරියට ගෙන යාමට මෙන්ම ඵලදායී මූල්‍ය විනය ඇති කිරීමට මෙය සහය වේ.

සමාලෝචිත වසර තුළ, CPSTL එහි යහපත් සමස්ත කාර්යසාධනය පවත්වාගෙන වර්ධනය කරන ලදී. වසරේ මුළු විකුණුම් 2016 සිට සියයට 12ක වර්ධනයක් පෙන්නුම් කරමින් ශ්‍රීලංරු.බි.14ක් විය. දළ ලාභය ශ්‍රීලංරුම් 6,775ක් වූ අතර, එය පෙර වසරට වඩා 13%ක වැඩිවීමකි. ශුද්ධ ලාභය ශ්‍රීලං.රු.මිලියන් 2,717ක් වූ අතර එය 2016ට වඩා 39%ක වැඩිවීමකි. 2017 වසරේදී ගෙවන ලද 2016 ලාභාංශය වන කොටසකට ශ්‍රී.ලංරු 0.54 මේ දක්වා ගෙවන ලද ඉහළම අගය වේ. ස්ථාවර ලාභාංශ ප්‍රතිපත්තියක් සහ යහපත් ව්‍යාපාර කාර්යසාධනය කොටස් හිමියන්ගේ ඉපයීම් උපරිම කිරීමට සහතිකවීමක් වන අතර CPSTL හි කොටස්හිමියන්ගේ ප්‍රතිපත්තිය ප්‍රධාන ප්‍රතිෂ්ඨාවකි.

2017දී, ක්‍රමෝපායික වැඩසටහන් ගණනාවක් අපි සකස්කළ අතර, අනාගතයේදී CPSTL සඳහා ඒවායේ සැලකියයුතු බලපෑමක් ඇතිවිය හැක. වසර තුළ භාරගනු ලැබූ ප්‍රධාන ව්‍යාපෘතිවලට කොලොන්නාව නිමාවේ ඝන මීටර් 15,000 ටැංකිය, දුම්රිය හරස් මාර්ග හරහා පොළවට සමාන්තරව ඍජු වීදීමේ ක්‍රමය හඳුන්වාදෙමින් කොළඹ වරායේ ඩොල්පින් ජැටියේ සිට කොලොන්නාව නිමාව දක්වා අගල් 12. නළ මාර්ගයේ සියයට 97.5ක් නිමකිරීම ඇතුළත්ය. සියයට 40 කින් කොලොන්නාව නිමාවේ ධාරිතාව වැඩි කිරීමට ටැංකි අංගනයක් ආරම්භ කිරීම, මුතුරාජවෙල යටිතල පහසුකම් සංවර්ධනය, කොලොන්නාව නිමාවේ ටැංකි කිහිපයක් සඳහා අභ්‍යන්තර පාවෙන වාහලවල් ස්ථාපනය, 2014 වසරේ සිට හවුල් පරීක්ෂණ සමූහයේ අවශ්‍යතාවයක් වූ කලාප අංක 03 හි ගුවන් යානා පිරිවුම් පහසුකම් සඳහා ඉන්ධන පෙරීමේ පද්ධතිය ස්ථාපනය කිරීම මේවායින් කිහිපයකි.

අපගේ අතීත සාර්ථකත්වය අනුව යමින්, අපි අනාගතය දෙස උද්යෝග යෙන් බලන්නෙමු. 2018 සඳහා බොහෝ අපේක්ෂිත අරමුණු අප සතුවන අතර අපගේ ආයතනික අවංකකම කැප නොකර ඒවා අත්කරගතහැකි බව මට විශ්වාසය. සැබැවින්ම අපගේ අරමුණ වන්නේ යහපත්ව කටයුතු කිරීම සඳහා සදාචාර සහ විනිවිද මෙහෙයුම් සමඟ ඵලදායිතාව සහ ලාභදායිත්වය එකතු කිරීමයි.  යහපාලනය පිළිබඳ මූලධර්මයට අනුකූලව, අභ්‍යන්තර සහ බාහිර විගණන කාර්යයන් හී ස්ථිර සමාලෝචනය හරහා වගවීමට CPSTL බැඳී සිටී.

අපගේ සමාජ අනුකලනය ශක්තිමත් කිරීමට සහ සමාජය කෙරෙහි අපගේ වගකීම ඉටුකිරීමට අපගේ ආයතනික සමාජීය වගකීම් කටයුතු අපි භාවිතා කර ඇත. අපගේ කාර්යසාධනය හඳුනා ගනිමින්, ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය විසින් සංවිධානය කරන ලද කර්මාන්ත අනර්ඝත්වය සඳහා ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලයේ කර්මාන්ත අනර්ඝත්ව උත්සවයේදී ජාතික මට්ටමේ රාජ්‍ය අංශය සහ ඉහළම ජයග්‍රහකයා පිළිබඳ රිදී සම්මානය සහ සමාජ සංවාදය සහ සේවා ස්ථානවල සහයෝගිතාවය පිළිබඳ ලෝකඩ සම්මානය අපවෙත පිරිනමා ඇත.

### ස්තූතිය පුදකිරීම

ඵලදායිව සහ අවංකම මෙන්ම යහපත් ආයතනික පාලන ව්‍යවහාරයන්ට අනුකූලව CPSTL මෙහෙයවන බව සහතික කිරීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මම ස්තූතිය පුදකර සිටිමි.

CPSTL සේවකයින් එහි අඛණ්ඩ සාර්ථකත්වය සහතික කිරීමේදී අවසාන තීරකයින් වන බැවින් ඔවුන් වඩාත් වටිනා සහ අත්‍යවශ්‍ය වත්කම වන බව සමාගම විසින් නිහතමානව පිළිගනී. CPSTL සමස්ත සේවකයින්ගේ අනර්ඝ කාර්යසාධනය වෙනුවෙන් මගේ අගයකිරීම සහ කෘතඥතාවය පළ කර සිටිමි. සමාගම තුළ කාර්මික සම්බන්ධතා වාතාවරණය ඵලදායිතාව සහ ලාභදායිතාව කරා හවුල් බැඳිම සමඟ සුහදශිලී ආකාරයෙන් පැවතීම මට සතුටකි.

මා කෙරෙහි විශ්වාශය තැබීම සහ ලබාදෙන ලද මඟපෙන්වීම වෙනුවෙන් ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍ය ගරු අර්ජුන රණතුංහ මහතා සහ නියෝජ්‍ය අමාත්‍ය, ආචාර්ය අනෝමා ගමගේ මහත්මිය වෙත මගේ අවංක කෘතඥතාව පළ කර සිටීමට මම මෙය අවස්ථාව කරගනිමි. එමෙන්ම අමාත්‍යංශයේ ලේකම්, උපාලි මාරසිංහ මහතාට සහ ඔහුගේ කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ සහයෝගය වෙනුවෙන් ස්තූතිය පුද කිරීමට කැමැත්තෙමි. එමෙන්ම මාගේ සහය අධ්‍යක්ෂවරුන්, CPSTL හි කළමනාකාරිත්වය සහ සේවකයින් වෙත ඔවුන්ගේ දායකත්වය සහ සාර්ථකත්වය වෙනුවෙන් ස්තූතිය පුදකර සිටීමට මම මෙය අවස්ථාව කරගනිමි. තවද, අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් වෙත ඔවුන්ගේ පක්ෂපාතිත්වය සහ අනුග්‍රහය වෙනුවෙන් මගේ කෘතඥතාව පළකර සිටිමි.

එක්සත්කම පිළිබඳ හැඟීමෙන් සහ කැපවීමේ අධිෂ්ඨානය සමඟ නව වසර තුළ නව අභියෝගවලට අපි මුහුණ දෙමු.



**ධම්මික රණතුංග**
**සභාපති**

# කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ පණිවිඩය



"ප්‍රාග්ධන යටිතල පහසුකම් නිසි සැලසුම් සහ ඵලදායී අපයෝජනට සමඟ මෙහෙයුම් කාර්යසාධනය තුළ ශක්තිමත් වර්ධනය වාර්ෂිකව 39.4%ක වර්ධනයක් සමඟ රුපියල් ක් මිලියන 2,717 ක බදු පසු ශුද්ධ ලාභයක් ලබාගැනීමට සහය විය. ලාභ තුළ මෙම සුවිශේෂි වර්ධනය අපගේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පිළිබිඹු කරන පරිදි සමාලෝචිත කාලසීමාව යටතේ ක්‍රියාත්මක කරන ලද මනා ක්‍රමෝපායන්ට ගලපාගත හැකි වූ බව වාර්තා කිරීමට ලැබීම මට සතුටකි."

# කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ පණිවිඩය (ඉතිරි කොටස)

ඛනිජ තෙල් නිෂ්පාදන පර්යන්ත කර්මාන්තය තුළ අඛණ්ඩව පැවති අභියෝගාත්මක වෙළෙඳපොල තත්ත්වයන් යටතේ වුවත්, 2017 දී ස්ථාවර මූල්‍ය හා මෙහෙයුම් ප්‍රතිඵල ඇතිකළ සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි තවත් සුවිශේෂී කාර්යසාධන වසරක් පිළිබඳ වාර්තා කිරීමට ලැබීම මට සතුටකි.

CPSTL හි කාර්යසාධන සංදර්භය ශ්‍රී ලංකා ආර්ථිකය තුළ මිශ්‍රිත භාග්‍ය ලෙස, 2017 වසර පුරා ඛනිජ තෙල් නිෂ්පාදන වෙළෙඳපොල සඳහා අවිනිශ්චිත සහ ගතික වෙනස ආදර්ශ පාඨ විය. මෙම පසුබිමට ප්‍රතිවිරුද්ධව, පරිමාවන් හි සැලකියයුතු වර්ධනය සහ ශක්තිමත් ලාභදායිතාව සමඟ 2017 දෙසැම්බර් 31 දක්වා මාස 12ක කාලසීමාව තුළ CPSTL විසින් ශක්තිමත් මූල්‍ය කාර්යසාධනයක් අත්කර ගන්නා ලදී.

මෙම වසර, අපගේ සම්පිණ්ඩණයන් දෙක කෙරෙහි ඉහළ අවධානයක් යොමු කිරීමට අපි අපේක්ෂා කළෙමු. වර්තමාන මෙහෙයුම් සහ නියාමන වාතාවරණය තුළ ගතිකත්වය හමුවේ අපගේ ව්‍යාපාරය ඉදිරියට ගෙනයාමට වඩාත් තාර්කික අවස්ථාවන්ට ඉඩ දෙමින් ව්‍යුහය, විෂයපථය, පරිමාණය සහ පිරිවැය පිළිබඳ අපි බරපතල තීරණ ගත්තෙමු. අවදානම් ගැනීම සහ සේවා අනර්ඝත්වය සඳහා අපගේ බැඳීම නැවත සහතික කරමින් සහ අපගේ මෙහෙයුම් තුළ කාර්යක්ෂමතාවය ඉදිරියට ගෙන යමින් ප්‍රවීනත්වය ශක්තිමත් කරමින් අපගේ වැදගත් සාර්ථක සාධක පිළිබඳ අපි අවධානය යොමු කළෙමු.

වෙළෙඳපොල තුළ ඵලදායීව සහ කාර්යක්ෂමව රඳා පැවතීම සඳහා අපගේ උත්සාහයන්ට සහයවන අපගේ පද්ධතිය සහ ක්‍රියාවලිය එනම්, නව්‍යකරණය සහ නිර්මාණශීලිත්වය මෙන්ම වඩාත් වැදගත් ලෙස අපගේ දක්ෂ කණ්ඩායම කෙරෙහි අපි විශ්වාසය තැබුවෙමු.

## කාර්යසාධන දළ විශ්ලේෂණය

CPSTL විසින් 2017 මූල්‍ය වර්ෂය තුළ සැලකියයුතු වර්ධනයක් වාර්තා කිරීමට ලැබීම මට සතුටකි. 12%ක වාර්ෂික වර්ධනයක් නියෝජනය කරන රු.බි.14ක ආදායම අපගේ පරිමාවන් හී සහ අප මෙහෙයවන ඛනිජ තෙල් නිෂ්පාදන බෙදාහැරීමේ වර්ධනය තුළින් අත්කරගන්නා ලදී.

මෙහෙයුම් වර්ධනයන් පිළිබඳ අපගේ අඛණ්ඩ අවධානය හා බැඳුණු ආදායම් වර්ධනය 40%ක වර්ධනයක් සමඟ 2017 මූල්‍ය වර්ෂය සඳහා රු.මි. 3,273ක බදු පෙර ලාභයක් වාර්තාකිරීමට සමත් විය.

විධිමත් සැලසුම් කිරීම සහ ප්‍රාග්ධන යටිතල පහසුකම් ඵලදායීව භාවිතා කිරීම සමඟ මෙහෙයුම් කාර්යසාධනයෙහි ශක්තිමත් වර්ධනය වාර්ෂිකව 39.4%ක සමගින් රු.මි. 2,717ක බදු පසු ශුද්ධ ලාභයක් ලබාගැනීමට හේතු විය. ලාභ තුළ මෙම සුවිශේෂී වර්ධනය අපගේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පිළිබිඹුවන පරිදි සමාලෝචිත කාලසීමවා තුළ ක්‍රියාත්මක කරන ලද මනාව සැලසුම්කළ ක්‍රමෝපායන්ට ආරෝපනය කළහැකි බව වාර්තා කිරීම මට සතුටකි.

## කොටස්හිමියන්ට ලාභාංශ

2017 මූල්‍ය වර්ෂය තුළ CPSTL විසින් අත්කරගත් අනර්ඝ මූල්‍ය කාර්යසාධනයට අනුව යමින්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කොටසකට ලාභාංශය ශත පනස් හතරක් (54) බවට පරිවර්තනය කරමින් රු.මි.405ක් වන ලාභාංශ නිර්දේශ කිරීමට යෝජනා කරන ලද බව වාර්තා කිරීමට ලැබීම මට සතුටකි. 15%ක ලාභාංශයක් ගෙවන ලද 2016 වසරට සාපේක්ෂව මෙම ලාභාංශය 17%ක වැඩිවීමකි.

## ශ්‍රී ලංකා රජයට දායකත්වයන්

CPSTL හි මූල්‍ය කාර්යසාධනයේ වර්ධනය සහ වේගය වැඩිවීම ශ්‍රී ලංකා රජයට සහ ආර්ථිකයට සැලකියයුතු දායකත්වයක් බවට පරිවර්තනය කර ඇති බව වාර්තා කිරීමට ලැබීම මට ගෞරවයකි. 2017 වසරේ කාලසීමාව තුළ, CPSTL විසින් සෘජු බදු තුළ රු.මි.451ක දායකත්වය ලබාදෙමින් සහ 15%ක වාර්ෂික වර්ධනයක් නියෝජනය කරන මුළු ගෙවීම රු.මි. 2,175ක් වන පරිභෝජන බදුවල රු.මි. 1,724ක් එකතු කරමින් රජයේ බදු ආදායමට දායක වී ඇත.

## අනාගත දැක්ම

භාවිතාකල හැකි ආදායමේ වර්ධිත මට්ටම් සමඟ ජීවන තත්ත්වය වර්ධනය කිරීම් සහිත ආර්ථික සෞභාග්‍ය කරා ලඟාවීමට අප ජාතියේ හැකියාව හා බැඳුණු ගෝලීය ආර්ථිකය තුළ දක්කට ඇති වඩාත් ශුභවාදී ප්‍රවනතා සමඟ, මධ්‍ය කාලීනව වඩාත් විශ්වාසී ව්‍යාපාර පරිසරයක් අප බලාපොරොත්තු වෙමු. සැබැවින්ම, අපගේ වර්තමාන මෙහෙයුම් පරිසරය තුළ පවත්නා සමාජ-දේශපාලනික සහ ආර්ථික අවිනිශ්චිතතාවන් තුළනය කිරීම අත්‍යවශ්‍යය.

මෙම නැගීඑන ආර්ථික පසුබිම තුළ, දිවයින තුළ ප්‍රමුඛ ඛනිජ තෙල් නිෂ්පාදන මෙහෙයවන සමාගම වශයෙන්, අවස්ථාවන් උදාකිරීම, වඩා ඉහළ ස්ථාන වර්ධනය කර අත්කරගැනීමට විශාල හැකියාවක් අප සතුය. ඉදිරි වර්ෂ තුළ අපගේ ජයග්‍රාහී සාධක මත තවදුරටත් ආයෝජනය කර ගොඩ නගා අපගේ මෙහෙයුම් සහ ව්‍යාපාරය තුළ කේන්ද්‍රිය ක්‍රමෝපායක් ඉදිරියට ගෙන යන්නෙමු.

## අගය කිරීම

සමාගම වෙනුවෙන් අගය කිරීමේදී, සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය සහ අනෙකුත් නිලධාරීන් විසින් අප වෙත දක්වන ලද සහයෝගය වෙනුවෙන් ස්තුතිය පුද කිරීමට මම කැමැත්තෙමි.

CPSTL හි සියලූම සාමාජිතයින් විසින් මා වෙත දෙන ලද දක්ෂ සහ අගනා මඟපෙන්වීම සහ සහයෝගය නොමැතිව CPSTL සාර්ථකත්වය කරා ගෙනයාමට මට නොහැකි වනු ඇත. දක්ෂ සහයෝගය සහ අගනා දායකත්වය සහ 2017 අභියෝගාත්මක වසර පුරා මා සමඟ පෙනී සිටීම වෙනුවෙන් සෑම සාමාජිකයෙක් වෙත මම ස්තූතිය පුදකර සිටීමට කැමැත්තෙමි.

ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යංශයේ ගරු අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමිය සහ අනෙකුත් නිලධාරීන් වෙත ස්තූතිය පළකර සිටිමට මෙම මෙය අවස්ථාව කර ගනිමි.

එමෙන්ම, අපගේ සභාපති, ධම්මික රණතුංග මහතාට සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සියලූම සාමාජිකයින්ට ඔවුන්ගේ දැඩි වෙහෙස සහ සමාගමේ අභිප්‍රාය කරා නොසැලෙන බැඳීම වෙනුවෙන් මාගේ අගයකිරීම ප්‍රකාශ කර සිටිමු. CPSTL හී කාර්ය මණ්ඩලය ඔවුන්ගේ ස්ථිර සාදාචාර වැඩ සහ වැඩකිරීම සඳහා ඇති බැඳීම තුළින් සමාගමේ වර්ධනයට දායකවිය. ඔවුන් සියලූම දෙනා වෙත මම ස්තූතිවන්ත වන අතර ඔවුන්ගේ කැපවීම වෙනුවෙන් මාගේ අගයකිරීම මෙලෙස සටහන් කර සිටිමි. අවසාන වශයෙන්, අපගේ කොටස් හිමියන් දෙදෙනා, ව්‍යාපාරික හවුල්කරුවන් සහ පාරිභෝගිකයින්ට අපගේ හැකියාවන් කොරෙහි විශ්වාසය තැබිම වෙනුවෙන් මාගේ ස්තූතිය පුදකරමි. ආයතනික යහපාලන ප්‍රමිති පවත්වාගැනීම තුළින්, ස්ථාපිත ආයතනයක් ලෙස අපගේ අවංකකම පවත්වා ගනිමින් අපගේ ඉදිරි වර්ධන ගමන් මගේ ස්ථිරව ඉදිරියට යාම සඳහා පියවර තබමින් ඔබගේ විශ්වාසය වෙත තවදුරටත් ගෞරවය පුදකරමි.

සියලූම පාර්ශ්වකරුවනි,
ඔබට ස්තූතියි.

මෙයට විශ්වාසී,



**සංජීව විජේරත්න**
**කළමනාකාර අධ්‍යක්ෂ**

# අධ්‍යක්ෂ මණ්ඩලය



ධම්මික රණතුංග මහතා
සභාපති



සංජීව විජේරත්න මහතා
කළමනාකාර අධ්‍යක්ෂ



කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය
අධ්‍යක්ෂ



ශ්‍යාම් බෝරා මහතා
අධ්‍යක්ෂ



අනුප් ජයින් මහතා
අධ්‍යක්ෂ



රන්ධීර් සිං මහතා
අධ්‍යක්ෂ



නිමල් ජයසුන්දර මහතා
අධ්‍යක්ෂ



උදිත ගුණවර්ධන මහතා
අධ්‍යක්ෂ

# අධ්‍යක්ෂ මණ්ඩලය (ඉතිරි කොටස)

## ධම්මික රණතුංග මහතා
**සභාපති**

ධම්මික රණතුංග මහතා ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ නියෝජිත ආයතන වන, ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි සභාපති වේ. තොරතුරු තාක්ෂණය, අලෙවි හා කළමනාකරණය, ක්‍රිකට් පරිපාලනය, අන්තර්ජාලය/ඊ වානිජ්‍ය සහ වරාය අමාත්‍යාංශය සහා ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ප්‍රධාන රජයේ ආයතනවල ඉහළ කළමනාකාරිත්වය ආවරණය කරමින් වෘත්තීය ප්‍රවීනතා රාශියක් තුළ වසර 37ක පළපුරුද්ද ඔහු සතුය.

ධම්මික රණතුංග මහතා වැඩසටහන්කරණය සහ පද්ධති විශ්ලේෂණ හා පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද රැස්කර ගනිමින් 1981 දී තොරතුරු තාක්ෂණය තුළ ඔහුගේ වෘත්තිය ආරම්භ කර ඇත. පසුව, සිංගර් ශ්‍රී ලංකා සමඟ එක්වී කළමනාකරණ තලය දක්වා ගමන් කර ඇති අතර එහිදී ඔහු අවසාන වශයෙන් මධ්‍ය කළමනාකරණය දක්වා උසස් කරන ලදී. ඔහුගේ පුළුල් පළපුරුද්ද හේතු කොට ගෙන, 1996-2001 දක්වා ශ්‍රී ලංකා ක්‍රිකට් පාලන මණ්ඩලයේ (BCCSL) පළමු ප්‍රධාන විධායක ලෙස සේවය කිරීමට තෝරා ගනු ලැබීය. ඔහුගේ සේවා කාලය තුළ, ආයතනික ක්‍රමෝපායික සංවර්ධන සැලැස්ම සංවර්ධනය තුළ පෙරමුණ ගනිමින් කටයුතු කළ අතර ඉන් BCCSL ප්‍රතිඵල කේන්ද්‍රීය ආයතනයක් බවට පරිවර්තනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. ඔහු 1996 සිට 1997 දක්වා ජාත්‍යන්තර ක්‍රිකට් මණ්ඩලයේ මණ්ඩල සාමාජිකයෙක් ලෙස, 1996 සිට 2001 දක්වා ක්‍රිකට් කමිටුවේ - ජාත්‍යන්තර ක්‍රිකට් මණ්ඩලයේ කළමනාකාරිත්වයේ මෙන්ම 1997 සිට 2001 දක්වා ආසියානු ක්‍රිකට් මණ්ඩලයේ සාමාජිකයෙක් ලෙස කටයුතු කර ඇති අතරම ඇමරිකා එක්සත් ජනපදය තුළ, රණතුංග මහතා අන්තර්ජාල අලෙවි උපදේශක, අන්තර්ජාල අලෙවි අධ්‍යක්ෂ සහ අලෙවි සහ ඊ-වාණිජ අධ්‍යක්ෂ ලෙස තම තනතුර තුළ ඔහුගේ දැනුම සහ පළපුරුද්ද සමාගම් කිහිපයක් සමඟ හුවමාරුකර ගෙන ඇත. එමෙන්ම, රණතුංග මහතා ක්‍රිකට් සහ මලල ක්‍රිඩාවන් හී විශිෂ්ඨත්වය දක්වා ඇති සර්ව සම්පූර්ණ ක්‍රීඩකයෙකි. ටෙස්ට් තරඟ මෙන්ම එක්දින මට්ටම්වල ශ්‍රී ලංකා ජාතික කණ්ඩායම වෙනුවෙන් ක්‍රිඩා කොට ඇත.

ඔහු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති සහ එයට සමගාමීව ශ්‍රී ලංකා වරාය කළමනාකරණ උපදේශන සේවා සමාගම, ජය බහලුම් පර්යන්ත සමාගම සහ මාගම්පුර වරාය කළමනාකරණ සමාගමේ සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ ලෙස පත්කරන ලදී. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ලෙස, ශ්‍රී ලංකා වරාය අධිකාරි පනත යටතේ වරාය වෙත පැවරී ඇති බලය අනුව රාජකාරි ක්‍රියාත්මක කිරීම සඳහා ඔහු වගකීමට බැඳි සිටී. මේ යටතේ, සංවර්ධන ව්‍යාපෘති ආශ්‍රිත සියලුම වාණිජ වරායන් පාලනය කිරීම, එහි ප්‍රගති ඉලක්ක අත්කරගැනීම, ඒ යටතේ වරාය සංවර්ධනය කිරීමට උපායමාර්ගික පිරිවැය කළමනාකරණ ක්‍රියාමාර්ග යොදා ගනිමින් දැඩි මූල්‍ය කළමනාකරණය ක්‍රියාත්මක කිරීම සහ ආයතනයේ අරමුණු කරා සාර්ථකව එය මෙහෙයවීම සඳහා කාර්යක්ෂම මානව සම්පත් කළමනාකරණ ක්‍රමෝපායන් යොදා ගැනීම සඳහා ඔහු බැඳී සිටී. කොළඹ වරාය 2017 දී ලොව විශිෂ්ඨතම වරාය 30 අතරින් 23න් වැනි වරාය ලෙස ශ්‍රේණිගත කරන ලදී.

## සංජීව විජේරත්න මහතා
**කළමනාකාර අධ්‍යක්ෂ**

සංජීව විජේරත්න මහතා ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ නියෝජිත ආයතන වන, සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි කළමනාකාර අධ්‍යක්ෂවරයා වේ. ශ්‍රී ලංකාව, මැද පෙරදිග සහ ආසියව තුළ සේවය කරමින්, ගුවන් තරණය, ගුවන් සේවා, ගුවන් තොටුපල සහ සත්කාර කළමනාකරණය යන ක්ෂේත්‍ර තුළ වසර 20කට වැඩි කළමනාකරණ පළපුරුද්ද ඇත. එමෙන්ම, ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපල සහ ශ්‍රී ලංකා ගුවන් සේවා සමාගමේ උප - සභාපති විය.
සංජීව විජේරත්න මහතා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විධායක අධ්‍යක්ෂවරයාද විය. එමෙන්ම ඔහු ලංකා ගල්අගුරු සමාගම, ජය බහලුම් පර්යන්ත සමාගම සහ මාගම්පුර වරාය කළමනාකරණ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක්ද විය. ඔහුට ශ්‍රී ජයවර්ධන විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ඇත.

## කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය
**අධ්‍යක්ෂ**

කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය රාජ්‍ය අංශයේ සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුළුල් පළපුරුද්ද ඇත. ඇය ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට 1990 වසරේදී බැඳි ඇත. එතැන් සිට, විවිධ රජයේ ආයතනවල ඇය සේවය කර ඇත. දැනට, ඇය මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තනතුර දරයි.

පළමු පන්තියේ ගෞරව සමාර්ථයක් සහිතව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී (ව්‍යාපාර පරිපාලනය) විශේෂ උපාධියක් ඇය සතුය. 1987 දී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පවත්වන ලද වරලත් අවසරලාභි විභාගය සමත් වී ඇත.
2015 මාර්තු සිට ඇය සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. ඊට අමතරව, ඇය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සහ මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනයේ අධ්‍යක්ෂිකාවකි. එමෙන්ම ඇය ඉහත ආයතන තුනේ විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපතිවරියද වේ.

# අධ්‍යක්ෂ මණ්ඩලය (ඉතිරි කොටස)

**ශ්‍යාම් බෝරා මහතා**
*අධ්‍යක්ෂ*

ඛණිජ තෙල් ක්ෂේත්‍රය තුළ වසර 26කට වැඩි පළපුරුද්ද සමඟ, බෝරා මහතාට ඉන්දියන් ඔයිල් සමාගම, ඉන්දීයාමේ ජ්ලැග්ෂිප් සමාගම සහ ෆෝචූන් 500 ග්ලෝබල් සමාගම තුළ පාරිභෝගික, ආයතනික විකුණුම්, මෙහෙයුම් සහ මනා සංවිධාන වැනි විවිධ දෙපාර්තමේන්තුවල විවිධ කාර්යභාරයන්හි පුළුල් පළපුරුද්ද ඇත. ලංකා ඉන්දියන් ඔයිල් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ ලෙස වැඩභාරගැනීමට පෙර ඔහු සැලකියයුතු ලෙස මෙවැනි ක්ෂේත්‍රයන්ට නිරාවරණය වී ඇති අතර, ඔහු මහාරාෂ්ඨ සහ ගෝව රාජ්‍යයේ ඉන්දියන් තෙල් සිල්ලර දෙපාර්තමේන්තුව මෙහෙයවා ඇත. බැංගලෝර් විශ්ව විද්‍යාලයේ සිවිල් ඉංජිනේරුවෙක් වන, ගුර්ගෝන් කළමනාකරණ සංවර්ධන ආයතනයේ පිළිගත් ජාතික කළමනාකරණ වැඩසටහන තුළින් පශ්චාත් උපාධි කළමනාකරණ ඩිප්ලෝමාව සහ රාජස්ථාන් විශ්ව විද්‍යාලයෙන් අලෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධිය සහිත බෝරා මහතා ඉන්දියන් තෙල් සමාගමේ ප්‍රධාන තනතුරු කිහිපයක සේවය කර ඇත. ඔහු ක්ෂේත්‍ර මට්ටමින් දීර්ඝ සහ සාර්ථක උත්සාහයන් සහිත විවිධ අලෙවි අංශ තුනක් සඳහා අංශ ප්‍රධානියෙක් ලෙස කටයුතු කර ඇති අතර පසු මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ රාජකාරි කර ඇත.

**අනුප් ජයින් මහතා**
*අධ්‍යක්ෂ*

වර්තමානයේ, අනුප් ජයින් මහතා සමාගමේ මූල්‍ය සහ වාණිජ කටයුතු රාශියක සේවය කිරීමෙන් පසු ශ්‍රී ලංකාවේ ලංකා ඉන්දියන් ඔයිල් සමාගමේ මූල්‍ය ප්‍රධානී ලෙස කටයුතු කරමින් සිටී. ලංකා ඉන්දියන් ඔයිල් සමාගම 2002 වසර තුළ ශ්‍රී ලංකා ඛණිජ තෙල් භූ තලයට ඇතුළත් වූ අතර එතැන් සිට, ලංකා ඉන්දියන් ඔයිල් සමාගම ශ්‍රී ලංකාවේ ඛණිජ තෙල් අංශයේ පසුබැසීම් සංවර්ධනය සඳහා සැලකියයුතු කාර්යභාරයක් ඉටු කරයි. ලංකා ඉන්දියන් ඔයිල් සමාගම දැනට පෙට්රල්, ඩීසල්, ලිහිසිතෙල්, හා ඉන්ධන සැපයුම් ව්‍යාපාර අංශවල ක්‍රියාත්මක වේ.

ජයින් මහතා වෘත්තියෙන් ඉන්දියානු වරලත් ගණකාධිකාරී ආයතනයේ වරලත් ගණකාධිකාරිවරයෙකි. 1992 දී ඔහුගේ වාණිජ උපාධිය (ගෞරව) සම්පූර්ණ කිරීමෙන් පසු. 1995 දී ඔහු වරලත් ගණකාධිකාරී විභාගය සම්පූර්ණ කිරීමත් සමඟ ඉන්දියන් ඔයිල් සමාගම හා හවුල් විය. එමෙන්ම ඔහු සහතික ලත් තක්සේරුකරුවෙක් වන අතරම ඔහු ඉන්දියානු වරලත් ගණකාධිකාරී ආයතනයෙන් ව්‍යාපාර මූල්‍ය පිළිබඳ පශ්චාත් උපාධියද කර ඇත. පසුගිය වසර 20ක කාලසීමාව තුළ ඉන්දියන් ඔයිල් සමාගමේ විවිධ කාර්යාලවල ඔහුගේ රාජකාරි කාලය තුළ, ආයතනික කාර්යාලය ඇතුළුව ඉන්දියන් ඔයිල් සමාගමේ විවිධ කාර්යාලවල වැදගත් තනතුරුවල ප්‍රධානියා ලෙස කටයුතු කර ඇති අතර ආයතනික මූල්‍ය, භාණ්ඩාගාරය හා බැංකුකරණය, ඉල්ලුම හා සැපයුම් ද්‍රාවය ප්‍රශස්ථකරණය. නාවික කටයුතු, IFRS, SAP, අවදානම් කළමනාකරණය. ඒකාබද්ධ කිරීම්, අයවැයකරණය, ණයගැතියන් කළමනාකරණය. රක්ෂණය, සංස්ථාපිත හා වක්‍ර බදුකරණය. ප්‍රාග්ධන හා ආදායම් යෝජනාවල මූල්‍ය ඒකාග්‍රතාවය, අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රමෝපායික රැස්වීම් සඳහා ඉදිරිපත්කිරීම්, විගණන කමිටුව හා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්, ලාභ උපරිම කිරීම සඳහා විශේෂ අධ්‍යයන යනාදියට අදාළව ප්‍රධාන කාර්යයන් ඔහු මෙහෙයවා ඇත.

ඔහු දක්ෂ ක්‍රීඩකයෙක් මෙන්ම සංගීත රසිකයෙක්ද වේ.

**රන්ධීර් සිං මහතා**
*අධ්‍යක්ෂ*

රංධීර් සිං මහතා කුරුක්ෂට්‍ර ජාතික තාක්ෂණික ආයතනයෙන් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ තාක්ෂණික උපාධිය සහ නව දිල්ලියේ දුම්රිය ප්‍රවාහන ආයතනයෙන් බහු ආකාර මනාසංවිධාන පිළිබඳ ඩිප්ලෝමාව උසුලයි.

වර්තමානයේ ලංකා ඉන්දියන් ඔයිල් සමාගමේ මෙහෙයුම් සහ ඉන්ධන සැපයුම් කාර්යය මෙහෙයවමින්, සිල්ලර ව්‍යාපාරය සහ MGO & FO සඳහා වායු තෙල්, ගැසලින්, ආනයනය කිරීම සහ කොළඹ හා ත්‍රිකුණාමල වරායන්හි ඉන්ධන සැපයුම් සඳහා ඔහු වගකිමට බැඳී සිටී. එමෙන්ම, කොළඹ හා ත්‍රිකුණාමල වරායන්හි කැඳවන විදේශිය යාත්‍රාවන්ට ඉන්ධන සැපයුම් වෙළෙඳාම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ඔහු වගකිමට බැඳී සිටී.

ඛණිජ තෙල් ක්ෂේත්‍රය තුළ වසර 22කට වැඩි කාලයක් සේවය කරමින්, ඔහුගේ විශේෂඥතා ක්ෂේත්‍රය ඛනිජ හා ලිහිසි තෙල් ගබඩා ඇතුළුව විවිධ ගබඩා/පර්යන්තවල ගබඩා කිරීම, මෙහෙයවීම, බෙදාහැරීම් සහ මෙහෙයුම් දක්වා පුළුල් වේ. ඉන්දියන් ඔයිල් සමාගමේ ඉන්දියාව තුල ගබඩා ස්ථාන 3ක ඔහු කාර්යභාර නිලධාරියා වූ අතර, ඛණිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම සඳහා ආරක්ෂාව, සුරක්ෂිතභාවය සහ SOP පවත්වාගැනීම සහතික කිරීම සඳහා ඔහු වගකිමට බැඳුණි.

එමෙන්ම, ඔහු ඉන්දියාව පුරා ඛණිජ තෙල් නිෂ්පාදන තොග ගමනාගමනය සඳහා සියලුම ඉන්දීය දුම්රිය සම්බන්ධීකරණය සඳහා සහ එදිනෙදා නියාමනය සඳහා ඉන්දියන් දුම්රිය සමඟ වගකීමට බැඳුණි.

# අධ්‍යක්ෂ මණ්ඩලය (ඉතිරි කොටස)

**නිමල් ජයසුන්දර මහතා**
***අධ්‍යක්ෂ***

මූල්‍ය වෘත්තිකයෙක් වන, නිමල් ජයසුන්දර මහතා ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ සමස්ත මූල්‍ය කටයුතු පිළිබඳ වසර 38කට වැඩි පළපුරුද්දක් ඇති අතර, විස්තීර්ණ දැනුම හා පළපුරුද්ද අත්කර ගෙන ඇත. විවිධ මූල්‍ය සහ මෙහෙයුම් හැකියාවන් හී ඔහුගේ ශක්තිමත් පළපුරුද්ද අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය තවදුරටත් ශක්තිමත් කරයි.

ජයසුන්දර මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ බලපත්‍රලාභියෙක් මෙන්ම සහ ගිණුම්කරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාධාරියෙක්ද වේ. එමෙන්ම ඔහු AAT හි සාමාජිකයෙක් මෙන්ම මූල්‍ය, විගණනය හා සංවර්ධන ගිණුම්කරණය (එක්සත් ජනපදය) හි අධි සාමාජිකයෙක් ද වේ.

2017 ජූනි සිට සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හී අධ්‍යක්ෂ ලෙස ඔහු සේවය කරමින් සිටින අතර ඔහු ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් ලෙසද ඔහු සේවය කර ඇත. තවද ඔහු ශ්‍රී ලංකා-චීන සමාජයේ භාණ්ඩාගාරික සහ ශ්‍රී ලංකා-බෙල්ජියම් සංගමයේ භාණ්ඩාගාරික ලෙස සේවය කර ඇත.

**උදිත ගුණවර්ධන මහතා**
***අධ්‍යක්ෂ***

උදිත ගුණවර්ධන මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ දෙවන පන්තයේ ඉහළ පෙළ සමාර්ථයක් සහිත දේශපාලන විද්‍යා උපාධිධාරියෙකි. ප්‍රධාන තනතුරු කිහිපයක සේවය කරමින් ඔහුට වසර 24ක පළපුරුද්ද ඇති අතර විවිධ සංවිධාන සහ ජාතියේ සාර්ථකත්වය දායක වී ඇත. ඔහු 2016 සිට 2017 දක්වා මාගම්පුර වරාය කළමනාකරණ උපදේශන සේවා සමාගමේ සහ 2011 සිට 2012 දක්වා ලංකා කඩදාසි සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් විය. එමෙන්ම, 1995 - 2001 කාලසීමාව තුළ, ජාතියේ සාර්ථකත්වය සඳහා දායක වෙමින් මුදල් හා සැලසුම් කිරීමේ ගරු නියෝජ්‍ය අමාත්‍යවරයාගේ මහජන සම්බන්ධතා නිලධාරීවරයාද විය. ගුණවර්ධන මහතා විවිධ ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් ලෙස සහ මහජන සම්බන්ධතා ලේකම්, පාර්ලිමේන්තු ලේකම් සහ මහජන සම්බන්ධතා නිලධාරී වැනි අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලයට අදාළ වෙනත් ප්‍රධාන තනතුරු තුළ කටයුතු කරමින් විවිධ කාර්යභාර්යයන්හී පුළුල් පළපුරුද්ද ඇත.

# කළමනාකරණ කණ්ඩායම



ප්‍රදීප් කක්ගොඩආරච්චි
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(මුදල්)



පී. අතුකෝරල
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(ඉංජිනේරු හා සහය සේවා)



පී.ඩී.පී.ධර්මවංශ
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(මානව සම්පත් හා පාලන)



ඒ.මාටින්
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(මෙහෙයුම්)



ආර්. පෙරේරා
ප්‍රධාන තොරතුරු නිලධාරි



ජේ.පී.ජේ.ඩබ්ලිව්. ධර්මප්‍රේම
කළමනාකරු- තොරතුරු පද්ධති



එස්. වික්‍රමාරච්චි
කළමනාකරු - ගබඩා



උදිත ජයලත්
කළමනාකරු - මුදල්



ඩී.එම්.එච්.බී. දසනායක
කළමනාකරු - අභ්‍යන්තර විගණන

# කළමනාකරණ කණ්ඩායම (ඉතිරි කොටස)



ඩී.ඒ.ජේ.එස්. ධර්මප්‍රිය
මෙහෙයුම් කළමනාකරු -
මෝටර්රථ



එම්.එස්.එම්.නියාස්
පර්යන්ත කළමනාකරු
මුතුරාජවෙල



අජිත් විජේසූරිය
කළමනාකරු
පරිශ්‍ර හා ඉංජිනේරු සේවා



ටී.වී. සරත්චන්ද්‍ර
කළමනාකරු
තොග චලන හා තොග නිෂ්පාදනය



එන්. ජයවර්ධන
කළමනාකරු -ආරක්ෂක



එස්.එන්. ගමගේ
කළමනාකරු - ආයතන කටයුතු



කේ.එම්.එන්.ඒ.සී. පෙරේරා
කළමනාකරු - මානව සම්පත්



ආර්.එස්.එස්. ප්‍රේමකුමාර
කළමනාකරු - ප්‍රසම්පාදන



ඩබ්.එම්.ටී.ඩබ්. වී බණ්ඩාර
කළමනාකරු - බෙදාහැරීම්

# කළමනාකරණ කණ්ඩායම (ඉතිරි කොටස)



ආර්.ඒ.පී.ඒ. රණසිංහ
මෙහෙයුම් කළමනාකරු අක්වෙරළ



ඊ.ඒ.ආර්.ඩී. බන්ඩාර
කළමනාකරු- පුහුණු හා මානව සංම්පත් සංවර්ධනය



ජී.එම්.ඒ.බන්ඩාර
වැඩබලන කළමනාකරු - ඉංජිනේරු



කේ. එන්. රත්නායක
කළමනාකරු - රසායනාගාරය



එල්. ඩබ්ලිව්. ගුනසේකර
ප්‍රධාන නීති නිළධාරී



ආර්. සුසිරිවර්ධන
වෛද්‍ය නිලධාරි



ආර්.එම්.එන්.ජයතිලක
වැඩබලන කළමනාකරු - විමර්ෂණ



පී.එම්.සී.පී.ඩයස්
වැඩබලන කළමනාකරු - ගිනි හා ආරක්ෂක

# කළමනාකරණ සාකච්ඡා හා විග්‍රහය



# මෙහෙයුම් පරිසරය

## ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් වෙළෙඳපොළ

ප්‍රවාහනය සහ බලශක්ති උත්පාදනය ඛණිජ තෙල් පරිභෝජනයේ ප්‍රධාන ධාවකයන් දෙක සේ අඛණ්ඩව පවතී. බලශක්ති උත්පාදනය සඳහා ඛණිජ තෙල් අලෙවිය තාප පදනම් විදුලිබල උත්පාදනයේ භාවිතාව වැඩිවීමත් සමඟ, 2016 දී පැවති 87%ට සාපේකෂව 2017 දී 48%කින් වැඩි වී ඇත. ප්‍රවාහනය සඳහා ඛණිජ තෙල් අලෙවිය (මුළු විකුණුම්වලින් 70%කට වැඩි ප්‍රමාණයක අගයන් දරන) 2016 දී පැවති 42.2% හා සැසැඳිමේදි 25.5කින් වැඩි වී ඇත.

## සිල්ලර විකුණුම් මිල

ශ්‍රී ලංකාවේ සිල්ලර විකුණුම් මිලගණාන් රජයේ මිලකරණ ප්‍රතිපත්තිය අනුව සහ වෙළෙඳපොල පදනම් මිලකරණ සූත්‍රයක් නොමැතිකම පිළිබිඹු කරමින් කලාපයේ සමාන ආයතනවලට වඩා සාපේක්ෂව මිල අඩුය. තෙල් සමාගම් ඔවුන්ගේ මිලදි ගැනිමේ පිරිවැයට අනුකූල ශුද්ධ බදු මුදලක් ලැබේ. බදුවලින් ශුද්ධ ශ්‍රී ලංකවේ මිලගණාන් ලෝකයේ මිල හා සැසැඳිමේදී වඩා අඩුම මිලගණාන් වන බව පහත සටහනින් පැහැදිලිව පෙනි යයි. ගෝලීය බොර තෙල් මිලගණාන්වල උච්චාවචනය වුවද, ශ්‍රී ලංකාවේ ඛණිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර මිල ගණාන් මූලික වශයෙන් දේශපාලන අභිප්‍රේරණායන් මූලික ලෙස පිළිබිඹු කරමින් 2015 සිට නොවෙනස්ව පැවතුනි. මේ සමඟම, රජයට අයත් සමාගම්වල ඒකාධිකාරී වෙළෙඳපොල තත්ත්වය පාරිභෝගිකයින් කරා පිරිවැය වැඩිවිම ගෙනයාමට පුද්ගලික අංශයේ තරගකරුවන්ට දුෂ්කරතාවක් ඇති කරයි. ගොලීය ඉන්ධන මිලගණාන්වල පුළුල් උච්ඡාවචනයන් හා බැඳුණු ඔටෝ ඉන්ධනවල ලාභදායිතාව සමඟ සැලකියයුතු ආන්තික පීඩනයන්ට හේතු වේ.

**2017 දී තෙල් ලීටරයකින් ලබාගත් පාර්ශව, (ඩොලර්/ලීටර්)**







ඔටෝ ඉන්ධන සඳහා ඉල්ලුම නව මෝටර් රථ ලියාපදිංචිකිරීම් පහත වැටුනත් ආර්ථික වර්ධනය මගින් ඉදිරියට යමින් 2017 දි 5%කින් වැඩිවිය. ඉහළයන පොළි අනුපාත, ශ්‍රී ලංකා රුපියලේ අගය අඩුවීම සහ ණය සඳහා වටිනාකම් අනුපාතවල වෙනස්වීම් නව මෝටර් රථ ලියාපදිංචිකිරීම් තුල 8%ක පහත වැටීමකට හේතු විය. කෙසේවෙතත්, 2017 දි පෙට්‍රල් සහ ඩිසල් පරිභෝජනය පිළිවෙලින් 10%කින් සහ 2%කින් පුළුල්වෙමින් අඛණ්ඩව වැඩිවිය. ඉල්ලුමේ ඉහළ මට්ටම් හමුවේ වුවද, කර්මාන්තය තුළ ක්‍රියාකරුවන් මිල සූත්‍රයක් නොමැති බැවින් දැඩි මෙහෙයුම් පරිසරයක් ඇතිකරගැනීමට අඛණ්ඩව කටයුතු කළ අතර එය වෙනස්වන ගෝලීය ඉන්ධන මිලගණාන්වලින් සිල්ලර මිලගණාන් ස්වාධින වීමට හේතු විය. වර්ෂය තුළ, බොර තෙල් මිලගණාන් පසුගිය වසර දෙකෙහි දක්නට ලද ප්‍රවනතාවන් ආපසු හරවමින් 27%කින් ඉහල ගියේය. බොර තෙල් මිලගණාන් තියුණු ඉහලයාම හමුවේ සිල්ලර මිලගණාන් ස්ථාවරව පවත්වා ගැනීම මෙහෙයුම් අලාභ දරන ක්ෂේත්‍රයේ තරඟකරුවන්ට සැලකියයුතු ආන්තික පීඩනයන්ට ඇති කරන ලදි. ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය අඩුවීම මගින් මෙම තත්ත්වය තවදුරටත් තියුණු කරන ලදි. රජය විසින් සිල්ලර මිලගණාන් මත සීමාවන් පැනවීම් සිදුකරනු නොලැබුවද, ද්වි අධිකාරී වෙළෙඳපොල තුළ ස්ථාවර මිල ක්‍රමවේදයක් පවත්වාගෙන යාම නිසා වැඩිවෙන පිරිවැය පාරිබෝගිකයන් වෙත යොමු කිරීමට CPC/LIOC හට නොහැකිවීම නිසා දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදුවේ.

2017 වැඩි කාලයක් තුළ පැවති නියග තත්ත්වයන් සමඟ නොරොච්චෝල ගල්අගුරු බලාගාරයේ මෙහෙයුම්වල අඛණ්ඩ බාධා සිදුවීම් ඉන්ධන පදනම් විදුලි නිෂ්පාදනයේ වැඩිවිමකට හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, මුළු ඛණිජ තෙල් අලෙවියෙන් සියයට 20කට දායක වූ බලශක්ති උත්පාදනය සඳහා ඛණිජ තෙල් අලෙවිය මහ බැංකුවේ සංඛ්‍යාලේඛන අනුව 2017 දී 20.7ක වර්ධනයකි.

මේ සමඟ, දේශීය වෙළෙඳපොලේ මුළු ඛණිජ තෙල් අලෙවියෙන් සියයට 61.4කට දායක වන ප්‍රවාහන අංශය වෙත ඛණිජ තෙල් අලෙවිය සමාලෝචිත වර්ෂය තුළ දී සියයට 4.9කින් වර්ධනය වී ඇත.

එමෙන්ම, ඛණිජ තෙල් අලෙවියෙන් සියයට 8.8කට දායක වන ගුවන් යානා ක්ෂේත්‍රයට ඛණිජ තෙල් අලෙවිය වසර තුලදි සියයට 7.4කින් වර්ධනය විය. 2017 දි ඩිසල් සහ දැවිතෙල් අලෙවියේ වර්ධනය බලශක්ති ක්ෂේත්‍රය මගින් ප්‍රධාන වශයෙන් ඉදිරියට ගෙන ගිය අතර ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඉල්ලුම පෙට්‍රල් අලෙවිය වැඩි කිරීම සඳහා ප්‍රධාන දායකයා විය. භූමිතෙල් අලෙවියේ වර්ධනය ගෘහස්ත අංශයේ ඉල්ලුම මගින් ප්‍රධාන වශයෙන් ඉදිරියට යන ලදී.

**ඉහළයන පොලි අනුපාත, ණය සඳහා වටිනාකම් අනුපාත වෙනස්විම් වැනි දැඩි ප්‍රතිපත්ති තුළ මෝටර් රථ වර්ධනයේ අඩුවීම වාහන කල්බදු කාර්යයට අහිතකර ලෙස බලපාන ලදී.**

**එක් පුද්ගලයෙකුට ඉන්ධන පරිභෝජනය ආර්ථික වර්ධනයක් සමඟ 2017 දී 5%කි න් වැඩිවිය.**

**පරිසර තිරසාරත්වය පිළිබඳ දැඩි අවධානය තත්වයෙන් උසස් වඩාත් කාර්යක්‍ෂම ඉන්දන සඳහා ඉල්ලුම වැඩිවීමට හේතු වේ.**

# මෙහෙයුම් පරිසරය (ඉතිරි කොටස)




| බෙදාහරින ලද ධාරිතාව | | |
|---|---|---|
| | ධාරිතාව (කිලෝ) | |
| | 2017 | 2016 |
| කොළොන්නාව | 2,729,667 | 2,612,624 |
| මුතුරාජවෙල | 1,391,029 | 1,130,640 |
| තොග තෙල් ගබඩා | 1,326,718 | 1,200,032 |
| | **5,447,414** | **4,943,295** |

ඛණිජ තෙල් නිෂ්පාදනවල ඉල්ලුම් 2017 වසර තුළ සැලකියයුතු ලෙස වැඩි වූ අතර බලශක්ති උත්පාදනය හා ප්‍රවාහන ක්ෂේත්‍රයන් හි වර්ධිත ඉල්ලුම එයට හේතු විය. දේශීය වෙළෙඳපොලේ ඉන්ධන ඉල්ලුමෙහි ප්‍රවනතාව නිසා 2016 වසරට සාපේක්ෂව 2017 වසර තුළ ආදායම සහ ලාභදායිත්වයේ වර්ධනයක් ලබාගැනීමට CPSTL ට මඟ පාදන ලදි.

ගෝලීය මිලගණන් වෙනස්ව පැවතියද, ගෘහස්ථ පෙට්‍රල් සහ ඩීසල් මිලගණන් වසර තුළ නොවෙනස්ව පැවතුනු අතර මෙය ආර්ථිකයේ ඛණිජ තෙල් අංශයේ ඉපයීම් අඩුකිරීමට හේතු විය. එමෙන්ම එය ගෘහස්ථ වෙළෙඳපොල තුළ ඛණිජ තෙල් නිෂ්පාදන සඳහා වෙළෙඳපොල පදනම් මිල සූත්‍රයක අවශ්‍යතාවය සහතික කරයි. එකී සූත්‍රය පාරිභෝගිකයින් කෙරෙහි ඍජු බලපෑමක් තිබිය යුතු අතර ඒ අනුව CPSTL හි ව්‍යාපාරයට බලපායි.

ආයතනික ඉලක්ක සහ පරමාර්ථ විසින් සකස්කළ අපගේ දැක්ම අත්කර ගැනීම සඳහා ගමන මඟ තුළ CPSTL වෙනුවෙන් 2017 තවත් එක් සාර්ථක වසරක් විය. CPSTL විසින් බෙදාහැරීම සහ ගබඩා මෙහෙයුම් හි අඛණ්ඩ වර්ධනය වාර්තා කර ඇත. 2017 දී බෙදාහැරී ඛණිජ තෙල් නිෂ්පාදනවල මුළු පරිමාව 2016 වසරට සාපේක්ෂව 10%කින් වර්ධනය විය.






# මූල්‍ය ප්‍රාග්ධනය



කොටස්හිමියන්ගේ අරමුදල
රු.බි. 25.16



මුදල් හා මුදල් වලට
සමාන දෑ රු.බි. 1.5



වසර තුළ ශුද්ධ වත්කම
10% කින් වැඩිවිය



ක්‍රියාවලි තුළ යටිතල පහසුකම්
සංවර්ධනය හා පිරිවැය
කාර්යක්ෂමතාව
විසින් ධනාත්මක අනාගත දැක්මට
සහය විය

## මූල්‍ය කාර්යසාධනය

### ආදායම

CPSTL හි ආදායම බෙදාහැරීම් ආදායමල ප්‍රවාහන සේවා හ ඉන්ධන සැපයුම් මෙහෙයුම තුළින් උපයා ගනී. මෙයින්, බෙදාහැරීම් ආදායම ප්‍රධාන ආදායම් ප්‍රභවය වන අතර 2017 වසර තුල මුළු ආදායමෙන් 80%ක් මෙයින් වාර්තා කරන ලදි.

CPSTL හි ආදායම වසර තුළ රු.බි.14.18 දක්වා 12%කින් වර්ධනය වු අතර මෙයට බලශක්ති උත්පාදන අංශය සහ ප්‍රිමියම් ඉන්ධනවල පරිමාවන් සැලකියයුතු ලෙස ඉහළ යාම සහය විය. බලශක්ති උත්පාදනය තුළ මෙහෙයවන පරිමාව ද රු.බි. 1,422 දක්වා වර්ධනය වූ අතර ඒ තුළින් දිවයින පුරා නියඟ පාරිසරික තත්ත්වය හේතු කොට ගෙන සහ ජල විදුලි බලාගාර භාවිතය අඩුකරමින් සහ ශ්‍රී ලංකාව තුළ විදුලි බලාගාර විසින් තාප විදුලිබල උත්පාදනය තුළ වැඩිවීම නිසා ඇති වූ ශක්තිමත් ඉල්ලුම මගින් 10%ක පරිමා වර්ධනයක් අත්කර ගැනීමට සමාගමට හැකි විය.

ආදායම් සංයුතිය (රු.මි.)




ආදායම හා ද.දේ. ආන්තික නැමියාව (රු. මි.)



# මූලය ප්‍රාග්ධනය (ඉතිරිකොටස)




**දළ ලාභය**

සමාගමේ දළ ලාභය වසර තුළ 13%කින් වැඩි වූ අතර ඛණිජ තෙල් නිෂ්පාදන පරිමාව හැසිරවීම සහ ඉන්ධන සැපයුම් මෙහෙයුම තුළ වර්ධනය මින් පිළිබිඹු කරයි. සමාගමේ දළ ලාභ ආන්තිකය පෙර වසරට සාපේක්ෂව රු. මි. 781කින් වැඩි විය.

**මෙහෙයුම් කාර්යසාධනය**

වසර තුළ අනෙකුත් ආදායම රු.මි. 25 දක්වා 5%කින් තරමක් පහත වැටුන අතර, දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීම මත ඉපයීම්වල අඩුවීම හේතු විය. මෙහෙයුම් කාර්යාක්ෂමතාව ඇති කිරීම සහ පිරිවැය ප්‍රශස්තකරණය මත අවධානය යොමු කිරීමට අපව පොළඹවන ලද අභියෝගාත්මක වෙළෙඳපොල තත්ත්වයන් හමුවේවුවත්, සමාගමේ පොදු කාර්ය පිරිවැය වසර තුල රු.බි. 4.03 දක්වා 1.1%කින් පහත වැටුණි. මෙහෙයුම් මට්ටමේදී, සමාගමේ මෙහෙයුම් ලාභය පෙර වසරේ පැවති රු.බි. 2.41ට සාපේක්ෂව මෙම වසර තුළ රු.බි. 3.21 දක්වා 33%කින් වැඩි වී ඇත.

**මෙහෙයුම් කාර්යසාධනය %**



# මූල්‍ය ප්‍රාග්ධනය (ඉතිරිකොටස)

**බදු පෙර ලාභය :**

අපගේ කෙටි කාලින ආයෝජන කළඹ ප්‍රත්‍යක්ෂ ඥානය හා බැඳි කළමනාකරණය හේතු කොට ගෙන වසර තුළ මූල්‍ය ආදායම රු.මි. 189.4 දක්වා 110%කින් වැඩි විය. මේ සමඟම ණය නිරවුල් කිරීම හේතු කොට ගෙන මූල්‍ය වියදම් රු.මි. 124.07 දක්වා 26%කින් අඩුවිය. පෙර වසරේ පැවති රු. මි. 2,3300ට සාපේක්ෂව මෙම වසර තුළ බදු පෙර ලාභය 40%කින් වැඩි වී ඇත.

**බදු පසු ලාභය සහ** OCI

රු. මි. 473.74ක් වූ වසර වෙනුවෙන් බදුකරණය වසර තුළ විලම්භිත බදුවල අඩුවීම හේතු කොට ගෙන 20%කින් අඩුවිය. සමාගමේ අනෙකුත් විස්තීර්ණ ආදායම නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල ආයුගණ ඉපයීම්වලින් ප්‍රධාන වශයෙන් සමන්විත විය.




## මූල්‍ය තත්ත්වය

**මුළු වත්කම්**

CPSTL හි ශේෂ පත්‍රය අඛණ්ඩ වත්කම් වර්ධනය සහ වෙළෙඳ හා අනෙකුත් ලැබීම්වල වැඩිවීම හේතු කොට ගෙන රු.බිලියන 29.99 දක්වා 7%කින් පුළුල් වූ ශක්තිමත් ස්කන්ධ පදනම පිළිබිඹු කරමින් ශක්තිමත්ය



# මූල්‍ය ප්‍රාග්ධනය (ඉතිරිකොටස)

ශේෂ පත්‍ර සංයුතියෙහි වැඩි නැඹුරුතාවය ජංගම නොවන වත්කම් වන අතර එය පෙර වසරේ පැවති 61%ට සාපේක්ෂව මුළු වත්කම්වලින් 57%ක් සඳහා දායකත්වය දරයි. මූල්‍ය තත්ත්වය මුදල් ශේෂ සහ කෙටිකාලීන ආයෝජන සමඟ ශක්තිමත්ව පවත්නා අතර එය සාමුහිකව රු.බිලියන 1.47කි. (හෝ මුළු වත්කම්වලින් 5%කි) ආදායමෙහි වර්ධනයක් පැවතියද අතර වෙළෙඳ ලැබීයයුතු ශේෂයෙහි වැඩිවීමත් සමඟ මෙහෙයුම් කාර්යයන්ගෙන් උත්පානය කළ මුදල්වල අඩුවීම මගින් පෙර වසරට සාපේක්ෂව වසර අවසානයේදී ධනාත්මක මුදල්වල පහත වැටීමට හේතු විය. ණය නැවත ගෙවීම සඳහා මූල්‍ය කාර්යයන් වෙනුවෙන් භාවිතා කළ මුදල් ප්‍රවාහයන් හී වැඩිවීම මගින් මෙම පහත වැටීම තවදුරටත් වැඩි කරන ලදී.

ජංගම වත්කම් අනුපාතය සහ ක්ෂණික වත්කම් අනුපාතය 2017 දෙසැම්බර් 31 දිනට වාර 5.5ක් සහ 5.30ක් විය.

මුළු වත්කම් වර්ධනය (රු.මි.)




ජංගම/ක්ෂණික වත්කම් අනුපාත




**වත්කම් පිරිවැටුම් අනුපාතය**

වත්කම් පිරිවැටුමෙන් විකුණුම් ඇති කිරීම සඳහා සමාගම විසින් එහි වත්කම් භාවිතා කිරීමේ කාර්යක්ෂමතාව මනිනු ලබයි. වසර සඳහා මුළු වත්කම් සාමාන්‍යයෙන් බෙදනු ලබන ශුද්ධ විකුණුම් සූත්‍රය මගින් එය ඇති වේ. සමාගමේ මුළු වත්කම් පෙර වසරට සාපේක්ෂ්ව 7%කින් වැඩි වී ඇති අතර වසර සඳහා ආදායම වර්ධනය 12%කි. වත්කම් පිරිවැටුම් අනුපාතය 3.07%ක වර්ධනයක් සමගින් 46% සිට 49% දක්වා වැඩිවී ඇති අතර ඉන් සමාගම විසින් වසර තුළ වත්කම් භාවිතා කිරීමේ කාර්යක්ෂමතාව වර්ධනය කර ඇති බව සඳහන් කරයි.

වත්කම් පිරිවැටුම %




**ස්කන්ධය මත ඉපයීම (ROE)**

සමාගමේ ස්කන්ධය මත ඉපයීම 2016 වසරේ පැවති 7% සිට 2017 දී 11% දක්වා වැඩිවී ඇත. 2017 වසරේ ප්‍රගතිය 2017 වසර තුළ වර්ධිත ලාභදායිතාවයට අනුරූප වේ. මෙම අනුපාතයෙන් ස්කන්ධ ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස කොටස්හිමියන්ට ආරෝපනය වන ලාභය මනිනු ලබයි.

ස්කන්ධය මත ඉපයීම - ROE (%)



# මූල්‍ය ප්‍රාග්ධනය (ඉතිරිකොටස)

**මුළු වගකීම්**

CPSTL හි ස්කන්ධ ප්‍රග්ධන පදනම ශක්තිමත් වන අතර එය රු.බිලියන 25.26 ක් වෙමින් සමාගමේ මුළු වත්කමෙන් 84% ක් සඳහා අරමුදල් ලබා දේ. වසර තුළ සැලකියයුතු බදු පසු ලාභය හේතු කොට ගෙන 10%කින් මුළු ස්කන්ධය වැඩි විය. වෙළෙඳ හා අනෙකුත් ගෙවියයුතු දෑ රු.බිලියන 1,845 දක්වා වැඩිවිය. (පෙර වසරේ රු.බිලියන 1,311කි) සමාගමේ මුළු වගකීම් මහජන බැංකුවෙන් ලබාගත් ණය සම්පූර්ණයෙන් නිරවුල් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස රු. බිලියන 5.2 සිට රු.බි. 4.8 දක්වා අඩු විය.




**කොටස්හිමියන්ගේ අගය නිර්මාණය**

සමාගම එහි කොටස්හිමියන්ට තිරසාර එලදාවක් ඉපයීම සඳහා බැඳී සිටින අතර කොටසක ඉපයීම් පසුගිය වසරේ කොටසකට ඉපයීම් වූ රු. 2.32ට සාපේක්ෂව රු. 3.93ක ධනාත්මක මට්ටමක විය. කොටසකට ශුද්ධ වත්කම් අගය ද පෙර වසරේ පැවති රු. 30ට සාපේක්ෂව රු. 34 දක්වා වැඩි විය.

| | 2017 | 2016 |
|---|---|---|
| කොටසකට ඉපයීම් (රු.) | 3.73 | 2.32 |
| කොටසකට ශුද්ධ වත්කම් අගය (රු.) | 34 | 30 |
| කොටසකට ලාභාංශය (රු.) | 0.54 | 0.65 |

සමාගමේ කොටසකට ශුද්ධ වත්කම් අගය සහ කොටසකට ඉපයීම් පිළිබඳ අනුපාතයෙහි ප්‍රවනතාවන් නිරූපනය කර පහත ප්‍රස්ථාරයෙන් පෙන්වා දේ. කොටසකට ශුද්ධ වත්කම් අගය වාර 30 සිට වාර 34 දක්වා වසර තුළ වැඩි විය. කොටසකට ඉපයීම් වාර 2.32 සිට 3.73 දක්වා වැඩි විය.

**කොටසකට ශුද්ධ වත්කම් වටිනාකම (රු)**




**කොටසකට ඉපයීම් (EPS)**



# මූල්‍ය ප්‍රාග්ධනය (ඉතිරිකොටස)

**ද්‍රවශීලතා තත්ත්වය :**

පසුගිය වසර කිහිපය පුරා, සමාගමේ ජංගම වත්කම් සහ ක්ෂණික වත්කම් අනුපාත පිළිවෙලින් වාර 5.47 සහ 5.30 දක්වා වර්ධනය විය. මෙම ද්‍රවශීලතා අනුපාතවලින් සමාගමේ මූලය බැඳීම් හිඟ වන අවස්ථාවේදී එය සපුරාලීමට සමාගමට ඇති හැකියාව පෙන්වා දේ.

**වර්තන / ක්ෂණික වත්කම් අනුපාත**




**උත්තෝලනය හා ප්‍රාග්ධන ව්‍යුහය**

සමාගමේ වත්කම්වලින් 84%ක් ස්කන්ධ ප්‍රාග්ධනයෙන් මුදල් යොදන අතර, ඉතිරි 16% සඳහා දිගු කාලීන සහ කෙටි කාලීන ණය තුළින් මුදල් යොදවනු ලබයි. පහත සටහනේ පෙන්වා දෙන පරිදි, අරමුදල්කරණය සඳහා ස්කන්ධ ප්‍රාග්ධනයේ දායකත්වය පසුගිය වසර කිහිපය පුරා වර්ධනය වී ඇත. මෙම කාරණය තෝලන අනුපාතය අඩුවීම තුළින් තවදුරටත් ශක්තිමත් කරන ලදී.

**අරමුදල්කරණ ව්‍යුහය**




**අරමුදල් මූලාශ්‍ර (ශ්‍රී ලං රු. මි.)**




**තෝලන අනුපාතය**



# නිෂ්පාදිත ප්‍රාග්ධනය



අලුත් බවුසර් 25 ක් සහ අලුත් ටැංකි ලොරි ටේලර් එකතු කිරීම



නිෂ්පාදිත ප්‍රාග්ධනය තුල රු. මිලියන 833ක් ආයෝජනය



ක්‍රියාවලි නැවත සැකසීම කොලොන්නාව, මුතුරාජවෙල කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම



නිෂ්පාදිත ප්‍රාග්ධනය වර්ධනයට අඛණ්ඩ පුළුල් කිරීම දිවයින පුරා ඛණිජ තෙල් කාර්යක්ෂමව ගබඩා කිරීම හා බෙදාහැරීම

CPSTL හි නිෂ්පාදිත ප්‍රාග්ධනය ඛණිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම හා බෙදා හැරීම සඳහා භාවිතා කරන භෞතික යටිතල පහසුකම්වලින් සහ දෛනික මෙහෙයුම් කාර්යක්ෂමව කළමනාකරණය කළ හැකි ඩිජිටල් යටිතල පහසුකම්වලින් සමන්විත වේ. සමාගමේ භෞතික යටිතල පහසුකම්වල මූලික සංඝටක පහතින් දැක්වේ;

ගබඩා කිරීමේ ටැංකි : CPSTL විසින් කොලොන්නාව සහ මුතුරාජවෙල පිහිටි පර්යන්ත දෙක ඇතුළුව දිවයින පුරා තෙල් නිෂ්පාදන ගබඩා කිරීම් හා බෙදා හැරීම් තොග ගබඩා 12ක් ක්‍රියාත්මකය. මෙම යටිතල පහසුකම් මෙහෙයුම්වල බාධාරහිත ක්‍රියාකාරිත්වයට අත්‍යවශ්‍යය.

තෙල් පර්යන්ත සහ දිවයින පුරා ගබඩා : අපගේ පහසුකම් ගබඩා ටැංකි 100, නළ මාර්ග, SPBM, පයිප්ප හා මැසි ඒකක, ටැංකිරථ, සහ අනෙකුත් ආශ්‍රිත යටිතල පහසුකම්වලින් සමන්විතය. කොලොන්නාව පර්යන්තය ද නවීන අංගෝපාංගවලින් යුත් රසායනාගාරයක් ක්‍රියාත්මක කරන අතර ඉන් ඛණිජ තෙල් නිෂ්පාදන පිළිබඳ පරීක්ෂණ පවත්වයි.

2017 වසර තුළ අගය එකතු කිරීම සඳහා, සමාගම පහත දෑ තුළින් නිෂ්පාදිත ප්‍රාග්ධනය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා රු.මිලියන 833ක් ආයෝජනය කර ඇත;

- අලුත් ටැංකිරථ සහ ටැංකි ලොරි ටේලර් 25ක් එකතු කිරීම
- ඛණිජ තෙල් නිෂ්පාදන සඳහා අමතර ගබඩා සඳහා පහසුකම වර්ධනය කිරීම
- කොලොන්නාව පර්යන්තයේ සිට කොළඹ වරාය දක්වා මලකඩ බලපෑම සහිත පැරණි නළමාර්ග අලුත් කිරීම
- කොලොන්නාව රසායනාගාරයට නව උපකරණ ලබාගැනීම සඳහා ආයෝජනය
- අලුත් ගලි රථ දෙකක් සහ බූම්/මගී වේදිකා ට්‍රක් ප්‍රසම්පාදනය

## 2017 වසර තුළ ප්‍රධාන ව්‍යාපෘතීන්

**කොලොන්නාව ස්ථාපනයේ අභ්‍යන්තර ප්‍රවාහ වහලය සහිත ඝන අඩි 15,000 ගබඩා ටැංකියක් ප්‍රසම්පාදනය, ඉදිකිරීම සහ ආරම්භ කිරීම.**

ශ්‍රී ලංකාවේ වාර්ෂික සාමාන්‍ය ඉන්ධන ඉල්ලුම ආසන්න වශයෙන් 4 - 5%ක අනුපාතයකින් වැඩිවෙමින් පවතී. මෙම වර්ධන අනුපාතය සමඟ, එක් එක් ඛණිජ තෙල් නිෂ්පාදන සඳහා ප්‍රමාණවත් ගබඩා පහසුකම් පවත්වා ගැනීම ශ්‍රී ලංකාවට අවශ්‍යය. අවශ්‍යවන පරිමාව කොලොන්නාව සහ මුතුරාජවෙල ප්‍රධාන ස්ථාපනයන් දෙකෙහි යම් දෙන ලද කාලයක් සඳහා අවම වශයෙන් දින 30ක තොගයක් පවත්වාගත යුතුය. ශ්‍රී ලාංකීය ආර්ථිකය පශ්චාත් සිවිල් යුධ සමය තුළ පුදුම සහගත අනුපාතයකින් වර්ධනය වෙමින් පවත්නා අතර ශ්‍රී ලංකාව තුළ පෙට්‍රල් සඳහා ඉල්ලුම 2009 වසරේ සිට 90%කින් වර්ධනය වී ඇත. කිසිදු නව ටැංකි ඉදිකිරීමක් 1999න් පසු කොලොන්නාව තෙල් ස්ථාපනය තුළ සිදුවී නොමැත. මෙම කරුණු සියල්ල සලකා බලමින්, යම් දෙන ලද කාලයක් සඳහා අවම වශයෙන් දින 30ක තොගයක් පවත්වා ගනිමින් මෙරට ඉන්ධන අවශ්‍යතාවය සහතික කිරීම සඳහා CPSTL හි ප්‍රධාන ස්ථාපනයන් දෙකෙහි අමතර මෙට්‍රික් ටොන් 100,000ක ගබඩා පහසුකම හඳුන්වාදීමට 2012 දී කැබිනට් තීරණයක් ගනු ලැබීය.

මෙම සුවිශාල සංවර්ධන වැඩසටහනේ පළමු අදියර ලෙස, වසර එක හමාරක ඉදිකිරීම් කාලසීමාවක් තුළ රු. මිලියන 412ක පිරිවැයට කොලොන්නාව තෙල් ස්ථාපනය තුළ ගැසලින් සඳහා ඝන මෙට්‍රික් ටොන් 15,000ක (මෙට්‍රික් ලීටර් 11,000) ගබඩා ටැංකියක් ඉදිකිරීමට CPSTL විසින් තීරණය කර ඇත. ටැංකි වර්ගය වන්නේ ඇතුළත පාවෙන වහලයක් සහිතව ඉහත භූමියේ සිරස්ව වෑල්ඩින් කළ වානේ ගබඩා ටැංකියකි. වෑල්ඩින් කළ ගබඩා ටැංකියට අවම කාන්දුවීමේ හැකියාව ඇති අතර ඇතුළත පාවෙන වහලය අවම වාෂ්පවීමේ හානිය ඇත. යෝජිත ටැංකිය සඳහා නිෂ්පාදන වර්ගය වන්නේ ගෑසලින් 92 (පෙට්‍රල් 92)ය.

## නිෂ්පාදිත ප්‍රාග්ධනය (ඉතිරි කොටස)

CPSTL හි දැක්ම සහ මෙහෙවර අනුව මෙම ව්‍යාපෘතිය ගැලපෙන අතර ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඉන්දියන් ඔයිල් සමාගම සඳහා ඛණිජ තෙල් ගබඩා කිරීමේ සහ බෙදාහැරීමේ කටයුතු සඳහා ශ්‍රී ලංකාව තුළ පොදු පරිශීලක පහසුකමේ යටිතල පහසුකම් සංවර්ධනය වඩාත් අපේක්ෂිත සංවර්ධන වැඩසටහනකි.

මෙම ටැංකිය කොලොන්නාව ස්ථාපනයේ ගැසලින් ගබඩා කිරීමේ ප්‍රදේශය අභ්‍යන්තරයේ ඉදිකිරීමට යෝජනා කරන අතර එය CPSTL හි අභ්‍යන්තර අරමුදල් වලින් සිදු කරයි. ඉදිරි අවසන් ඉංජිනේරු සැලැස්ම (FEED) CPSTL හි ඉංජිනේරු කාර්යය මගින් සිදුකරන අතර මෙම ව්‍යාපෘති ඉංජිනේරු, ප්‍රසම්පාදන සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් ලෙස ක්‍රියාත්මක වේ. ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු ඉන්දු ඊස්ට් (පුද්ගලික) සමාගම වේ.

ඉදිකිරීම් වැඩ 2017 දෙසැම්බර් 22 දින ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේගරු අමාත්‍ය අර්ජුන රණතුංග මහතා විසින් උත්සවාකාරයෙන් ආරම්භ කරන ලදි.

මෙය 2019 වසර වන විට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. බාහිර රවුම් අධිවේගී මාර්ගය කොළඹින් ආරම්භ කරන සියලුම අධිවේගී මාර්ග සම්බන්ධ කරන අතර එය අවම මෙහෙයුම් පිරිවැයකින් දිවයිනේ ඕනෑම කොටසකට ළඟාවීමට මුතුරාජවෙල පර්යන්තයට හැකියාව ඇති කරයි. මෙම භූගෝලීය ස්ථානගතවීමේ ක්‍රමෝපායික වාසිය තුළින් මුතුරාජවෙල පර්යන්තයේ යටිතල පහසුකම් සංවර්ධනය කරමින් ප්‍රශස්ථ කිරීමට අපේක්ෂා කෙරේ.

මෙම ව්‍යාපෘතිය CPSTL හි දැක්ම වන "දකුණු ආසියාවේ වඩාත්ම කාර්යක්ෂම තෙල් ක්‍රියාකරවුම් පර්යන්ත්‍රය බවට පත්වීම" සමඟ මනාව පෙළ ගස්වා ඇත. CPSTL හි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය එකී ව්‍යාපෘතිය සඳහා පිරිනමා ඇති අතර ලංසු ක්‍රියාවලිය සම්බන්ධයෙන් කටයුතු කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කරන ලදී. අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුවක් ද ස්ථාපිත කරන ලද අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මකව පවතී. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමත් සමඟ, CPSTL වඩා ඉක්මන් බෙදාහැරීමේ කාලයකින් දිවයිනේ ඕනෑම කොටසකට ළඟාවීමේ තරඟකාරී වාසිය ලබා ගනී.



**මුතුරාජවෙල යටිතල පහසුකම් සංවර්ධන පහසුකම්**

අමතර ධාරිතා හඳුන්වාදීමේ ව්‍යාපෘතියට සමාන්තරව, 2016 සිට 2020 දක්වා වැඩිවන ඉල්ලුම සපුරාලීමට ඉන්ධන පිරවීමේ හැකියාව වැඩි කිරීමට CPSTL තීරණය කරන ලදී. මුතුරාජවෙල පර්යන්තයේ දැනට පවත්නා උපරිම පිරවීමේ පහසුකම් පිළිබඳ සැලකිල්ලට ගනිමින් මෙම ක්‍රමෝපාය සකසන ලදී. අමතර පැටවීම් වරායන් අටක් (08) ඇතිකිරීමට, නව පොම්පාගාරයක් ඉදිකිරීමට සහ අදාළ පහසුකම් සංවර්ධනය කිරීමට පවත්නා දොඹකර ව්‍යුහය පුළුල් කිරීමට යෝජනා කෙරේ. යෝජිත සංවර්ධනය සඳහා මුළු ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 550කි.

මුතුරාජවෙල පර්යන්තය අර්ධ-ස්වයංක්‍රීය පර්යන්තයක් වන අතර කොලොන්නාව ස්ථාපනය සහ CPSTL හි අනෙකුත් තොග ගබඩා සමඟ සැසැඳීමේදී කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව අතින් වාසි කිහිපයක් ඇත. පිරවුම් දොඹකර සහිත සියලුම වරායන් මැදිරි මාර්ග ටැංකි රථ 10ක් පිරවීමේ හැකියාව ඇති අතර මාර්ග ටැංකි රථයක් පිරවීමේ කාලය අනෙකුත් ස්ථාපන හා සැසැඳීමේදී ඉතා අඩුය. ඊට අමතරව, SPBM -02 හි ගොඩබාන නිෂ්පාදන සෘජුවම වරාය ගාස්තුවලින් තොරව මුතුරාජවෙල පර්යන්තය වෙත මාරු කරනු ලැබේ. පර්යන්තය බාහිර රවුම් අධිවේගී මාර්ගයේ පිවිසුම තුළ පිහිටා තිබීම තවත් එක් වැදගත් වාසියකි.



**මුතුරාජවෙල් පර්යන්තයේ ටැංකි අංක 6,7 සහ 8 සඳහා අභ්‍යන්තර පාවෙන වහල සැලසුම් කිරීම, සැපයීම, සහ ස්ථාපනය කිරීම.**

ආයතනයේ දැක්ම සහ මෙහෙවර අනුව ගමන් කරමින්, පර්යන්ත මෙහෙයුම්වල කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා CPSTL අඛණ්ඩව උත්සාහ දරයි. වාෂ්පවීම හේතු කොට ගෙන සිදුවන අලාභ ඛණිජ තෙල් නිෂ්පාදන පරිහරණ මෙහෙයවීම තුළ CPSTL විසින් මුහුණ දෙන සැලකියයුතු ගැටලුවකි. වාෂ්පවීම යනු ආර්ථික අලාභයක් පමණක් නොව, පාරිසරික දූෂණයක් ද වේ. වගකීම් සහගත ආයතනික පුරවැසියෙක් ලෙස CPSTL, මේ සම්බන්ධයෙන් කළමනාකාරීත්වයේ අවධානය වාෂ්පවීමේ අලාභය අවම කිරීම සඳහා යොමු කර ඇත.

අභ්‍යන්තර පාවෙන වහල ස්ථාවර බුම්බුලාකාර වහල සහිත ටැංකිවල වාෂ්පවීම අඩු කිරීමට ඇමෙරිකානු ඛණිජ තෙල් ආයතනය විසින් නිර්දේශිත ක්‍රමයකි. අභ්‍යන්තර පාවෙන වහල ගෑස් වාෂ්පවීම නියාමනය කිරීමට සැලසුම් කරන අතර, නිරාවරණය වන ගෑස් ආරක්ෂිත ක්‍රමයකින් අවට පරිසරයට වාෂ්පවීමට මින් ඉඩ දේ. ගබඩා ටැංකිවල ස්ථාවර වහළය ඇතුළත ස්ථාපනය කරන මෙම වහල ආර්ථිකමය වශයෙන් වාසිදායක විකල්පයකි. අභ්‍යන්තර පාවෙන වහල තුළින් ද්‍රව මතුපිට විශාල ප්‍රදේශයක් ආවරණය කරන අතර මෙම ඵලදායී මුද්‍රාතැබීම තුළින් 98% දක්වා අඩුකිරීමක් සිදුවිය හැකිය.

# නිෂ්පාදිත ප්‍රාග්ධනය (ඉතිරි කොටස)

මුතුරාජවෙල පර්යන්තයේ ස්ථාවර බුම්බුලාකාර වහල සහිත වෑල්ඩින් කළ වානේ සිරස් පෙට්‍රල් ගබඩා ටැංකි තුන (03) වාෂ්පවීමේ අලාභය අඩු කිරීම සඳහා අභ්‍යන්තර පාවෙන වහල ස්ථාපනය සඳහා තෝරා ගෙන ඇත. අභ්‍යන්තර පාවෙන වහල සවිකිරීම සඳහා මුළු ආයෝජනය රු. මිලියන 56.6ක් වන අතර 2017 මූල්‍ය වසර අවසානය වන විට එම වැඩවලින් 50% පමණ සම්පූර්ණ කර ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින්, ඛණිජ තෙල් නිෂ්පාදන නාස්තිය අවම කිරීම පමණක් නොව මෙම අලංකාර දිවයිනේ අපගේ වටිනා පරිසරය රැකගැනීමට දායක වෙමින් අපගේ කීර්තිනාමය ප්‍රදර්ශනය කිරීමට අපට හැකි වනු ඇති බව CPSTL විශ්වාස කරයි.









# මානව ප්‍රාග්ධනය



වසර තුළ සේවකයින් 41ක් බඳවාගත් අතර සේවකයින් 26ක් ස්ථිර කරන ලදී



සේවකයා රඳවා ගැනීමේ අනුපාතය 3.83% සිට 3.85% දක්වා තරමක් වර්ධන වී ඇත



වසර තුළ සේවා ස්ථාන හානි නොමැත



2018/19 සඳහා දැක්ම : නිපුනතා සංවර්ධනය කෙරෙහි අවධානය

දිවයින පුරා බාධා රහිත සේවයක් ලබාදෙන ගෞරවනීය සමාගමක් වශයෙන්, සමාගමේ පරමාර්ථ අත්කර ගැනීමේදී මානව සම්පත ඉටුකරන වැදගත් කාර්යභාරය CPSTL අවබෝධකර ගෙන ඇත. මානව සම්පත යනු හැකියාව, ඵලදායිතාව සහ දිගු කාලීන තිරසාරභාවය අත්කර ගැනීමේ ප්‍රධාන සංරචකයක් වන අතර, CPSTL හි ඉහළම වත්කම වේ. එමෙන්ම CPSTL සමාන අවස්ථා සේවා යෝජකයෙක් ලෙස, කිසිදු ආකාරයකින් වෙනස්ව සැලකීමේ ව්‍යාහාරයන් නොමැතිබව සහතික කරයි.

මෙම සමාගම ඉන්ධන ගබඩාකිරීම සහ බෙදාහැරීම මගින් පමණක් නොව සියලුම ජනවර්ග ආවරණය කරමින් අපගේ සේවා බලකාය හා එකතුවීමට අවස්ථාවන් ලබාදෙමින් සමස්ථ රටටම සේවය කරන අතර එහි ප්‍රතිඵලයක් ලෙස, මෙරට සැම පුරවැසියෙක් සඳහා ඔවුන්ගේ වයස, ස්ත්‍රීපුරුෂභාවය සහ ආගම පිළිබඳ නොසලකා සමාන අවස්ථා ලබාදේ. සමාගම විසින් මානව සම්පත මනාව කළමනාකරණය කිරීම සඳහා පියවර රාශියක් ගෙන ඇත.



# මානව ප්‍රාග්ධනය (ඉතිරි කොටස)

සේවක කළමනාකරණය සඳහා අපගේ ප්‍රවේශය අනුව, 3045ක්වන CPSTL ඔබ කණ්ඩායම අපගේ ආයතනික සදාචාරයන් හී පිවත් වෙමින් අපගේ ක්‍රමෝපායික සැලැස්ම පසුපස ධාවකයින් වන බව CPSTL හි අපි, විශ්වාස කරමු. සේවකයින් අපගේ අභ්‍යන්තර පාරිභෝගිකයින් වන අතර දිගු කාලීනව පවත්නා සම්බන්ධතා සංවර්ධනය කර පෝෂණය කිරීමට අපි උත්සාහ ගනිමු. අපගේ සේවක කොටස ආකර්ෂණීය වැටුප් යෝජනා ක්‍රම, පුහුණු සහ වෘත්තිය සංවර්ධනය සඳහා අවස්ථා ලබාදෙන අතරම සියලුම සේවකයින්ට උපකාරී, හානි රහිත පරිසරය සහතික කරයි.

CPSTL හි මානව සම්පත් පාලනය : සමාගමේ මානව සම්පත් ප්‍රතිපත්ති රාමුව එහි මව් සමාගම (ඛණිජ තෙල් නීතිගත සංස්ථාව) හා පුළුල්ව ගලපන අතර කම්කරු නීති පිළිබිඹු කිරීමට අදාළ වන සෑම අවස්ථාවකම ප්‍රතිශෝධනය කර ඇත. ක්‍රියාත්මකව පවත්නා පාලන රාමුව රාජකාරි, දැනුමින් සන්නද්ධ කිරීම සහ පැහැදිලි නිශ්චිත පාලන ව්‍යුහයන්ගේ පැහැදිලිව වෙන් කර තැබීම ප්‍රවර්ධනය කරයි. වසර තුළ, ශක්තිමත් දක්ෂ මාර්ගයක් පෝෂණය කිරීමේ පරමාර්ථය ඇතිව අපගේ උසස්වීම් ප්‍රතිපත්ති සමාලෝචනය කොට ප්‍රතිශෝධනය කරන ලදී.

අපගේ හැකියා සංචිතය : අපගේ සංචිතය සේවකයින් 3045කින් සමන්විත වන අතර ඔවුන් නිපුනතා සහ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අනුව විවිධාකාර වේ. අපගේ බෙදාහැරීම් ජාලයේ පුළුල් භූගෝලීය ව්‍යාප්තිය මත, සේවකයින් මෙරට සියලුම ප්‍රදේශවලින් බඳවා ගනු ලැබේ. කාන්තා නියෝජනය සාපේක්ෂව අඩුය. විශේෂයෙන් විධායක නොවන ශ්‍රේණිවල ඉතා අඩුය. නමුත් විධායක සහ ඉහල වර්ගීකරණ තුළ 19%කට එය දායක වේ. අපගේ කණ්ඩායමේ විස්තරය භූගෝලීය ලෙස පහත විස්තර කෙරේ;







## 2017 ක්‍රමෝපායික අවධානය

වසර සඳහා සමාගමේ මානව සම්පත් ක්‍රමෝපාය මෙහෙයුම් භූතලයෙන් ඇතිවන ප්‍රධාන අභියෝග ආමන්ත්‍රණය කිරීම සඳහා සකස් කරන ලදී. මෙම අභියෝග පහත පරිදි වේ.

- දක්ෂයින් ආකර්ෂණය
- ප්‍රතිලාභ ව්‍යුහය ශක්තිමත් කිරීම
- පුහුණු සහ සංවර්ධනය

දක්ෂයින් ආකර්ෂණය : ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන ඛණිජ තෙල් සේවා සපයන්නාගේ පරිපාලිත සමාගමක් ලෙස, CPSTL විසින් උපකාරී සේවා පරිසරයක් තුළ නිපුනතා වර්ධනයට සහ ආකල්ප සංවර්ධනයට අසමසම අවස්ථා එහි සේවකයින්ට ලබා දේ. ක්ෂේත්‍රයේ විශිෂ්ට දක්ෂයින් ආකර්ෂණය කර ගනිමින් වඩා කැමති සේවා යෝජකයා ලෙස CPSTL ස්ථානගත කිරීමට මෙය සහය වී ඇත. අපි සමාන අවස්ථා සේවා යෝජකයෙක් වන අතර බඳවාගැනීම්, උසස්වීම් සහ වෙනත් ප්‍රතිලාභවලදී ස්ත්‍රීපුරුෂභාවය, වයස හෝ ජනවර්ගය අනුව වෙනස් ලෙස නොසලකමු. සමාගමේ අඛණ්ඩ වර්ධනය තහවුරු කරමින්, නව දක්ෂයින් බඳවා ගැනීමට සහ කාර්යසාධනය මත පදනම් වී උසස්වීම් ලබාදීමට CPSTL සැමවිටම උත්සාහ දරයි. වසර තුළ, අපගේ සේවක සංඛ්‍යාවට අපි අලුතින් සේවකයින් 26 දෙනෙක් එකතු කළෙමු.

# මානව ප්‍රාග්ධනය (ඉතිරි කොටස)

සියලුම බඳවා ගැනීම් හා උසස්වීම් CPSTL හි බඳවා ගැනීම් හා උසස්වීම් යෝජනා ක්‍රමය මත පදනම් වේ. වසර තුළ, සමාගම විසින් අභ්‍යන්තර උසස්වීම් 118ක් සිදුකර ඇත.

හැකියා සංවර්ධනය සඳහා සමාගමේ ප්‍රවේශය තුළින් පහත සඳහන් පරමාර්ථ කරා අඛණ්ඩව සේවය කිරීමට කළමනාකරණය සහ සේවකයින් පිළිබඳ අනෝන්‍ය වගකීමක් පවරනු ලබයි.

- සුදුසුකම් සහිත, උද්යෝගිමත් සහ විශ්වාසී ශ්‍රම බලකායක් සහතික කිරීම
- සියලුම සේවකයින්ට ගුණාත්මක සේවා පරිසරයක් සහ සම්පත් සහතික කිරීම
- වෘත්තිකයින්ට සේවය සඳහා CPSTL යෝග්‍ය ස්ථානයක් සහ වැඩිදුර ප්‍රවීනතා සංවර්ධනයට ස්ථානයක් ලෙස සහතික කිරීම
- CPSTL විසින් සේවකයින් අතර සහයෝගය සහ අනෝන්‍ය විශ්වාසය ප්‍රවර්ධනය කිරීම
- සේවකයින්ට තම සුදුසුකම් තවදුරටත් වැඩිකර ගැනීමට සහ තම දැනුම පුළුල් කිරීමට වෘත්තිය සංවර්ධනය සඳහා අවස්ථාවන් ප්‍රවර්ධනය කිරීම
- සේවා ස්ථානයන් හි සමානතාව සහතික කිරීම

### සේවක ප්‍රතිලාභ

ස්ත්‍රීපුරුෂභාවය නොසලකා සමාන ශ්‍රේණිය, වර්ගය තුළ වැටුප් පරිමාවන් හී කිසිදු වෙනසක් නොමැති බව සහතික කරමින් ගෙවීම් ව්‍යුහයන් හි විනිවිද ප්‍රතිපත්තියක් සමාගම විසින් අනුගමනය කරයි.

තවද, CPSTL හි සේවකයින් පහත දෑ ඇතුළුව ප්‍රතිලාභ සහ ශුභසාධන කටයුතු පුළුල් ලෙස භුක්ති විඳී.

| ස්ථිර කාර්ය මණ්ඩලයට සේවක ප්‍රතිලාභ | විස්තරය | පරිවාස අයට ප්‍රතිලාභ |
|---|---|---|
| නිවාඩු | | |
| - වාර්ෂික නිවාඩු | දින 14. (සේවයට බැඳීමේ දිනය අනුව) | |
| - අනියම් නිවාඩු | වැඩකරන දින 7 | ඔව් |
| - අසනීප නිවාඩු | වැඩකරන දින 21 (සේවයට බැඳීමේ දිනය අනුව) | |
| - ප්‍රසූත නිවාඩු | - වැඩකරන දින 84. | |
| | - දින 84ක් සඳහා අර්ධවැටුප් | |
| | - දින 84ක් සඳහා වැටුප් රහිත නිවාඩු. | |
| - අනතුරු නිවාඩු | සේවක අනතුර (සමාගමේ රැකියාව කරන අතරතුර) | |
| - හිලව් නිවාඩු | මාසයේ සෙනසුරාදා 4 හි සේවය කරන සේවකයාට හිලව් නිවාඩු දෙකක් හා අතිකාල ගත හැක. | |
| - විශේෂ නිවාඩු | විශේෂ සිදුවීම(මැතිවරණ, ඇඳිරි නීතිය යනාදී) | |
| - රාජකාරි නිවාඩු | සමාගමේ අරමුණ සඳහා විශේෂ සිදුවීම. | |
| - වැටුප් රහිත නිවාඩු | විදේශ අධ්‍යයන, පුහුණු සහ වැඩමුළු සඳහා | |
| වැටුප් වර්ධකය | සේවකයාගේ රාජකාරි, පැමිණීම සහ හැසිරීම ඇගයීම | ඔව් |
| දීමනා | ආහාර දීමනා, සංචාර දීමනා. පර්යන්ත දීමනා,<br>පැමිණීමේ දිරිදීමනා, සේවා මුර දීමනා, වාර්ෂික නිවාඩු දිරි දීමනා.<br>ජීවන වියදම් දීමනා, වෘත්තීය දීමනා සහ අන්ත දීමනා<br>කාර්යාල දුරකථන ප්‍රතිලාභ. | ඔව් |
| ප්‍රසාද දීමනා | වෛද්‍ය නිවාඩු, දිරිදීමනා, වාර්ෂික ප්‍රසාද දීමනා | ඔව් |
| ණය | | |
| - ආපදා ණය | මාස 10 ක වැටුප. සරල සහනශීලී පොලී අනුපාත. මාස 60 කින් අයකරගැනීම | |
| - නිවාස ණය | ඉඩමක් හෝ නිවසක් මිලදී ගැනීම හෝ නිවාස ඉදිකිරීම සරල සහනශීලී පොලී අනුපාත<br>මාස 300 කින් හෝ සේවකයාගේ සේවය තුළ අයකරගැනීම | නැත |
| - නිවාස අලුත්වැඩියා ණය | නිවාස අලුත්වැඩියා සඳහා. සරල සහනශීලී පොලී අනුපාතල මාස 120 කින් අයකරගැනීම | |
| - නිවාස පහසුකම් ණය | ගෘහභාණ්ඩ මිලදී ගැනීම සඳහා, සරල සහනශීලී පොලී අනුපාතල මාස 60 කින් අයකරගැනීම. | |

# මානව ප්‍රාග්ධනය (ඉතිරි කොටස)

| ස්ථිර කාර්ය මණ්ඩලයට සේවක ප්‍රතිලාභ | විස්තරය | පරිවාස අයට ප්‍රතිලාභ |
|---|---|---|
| - සකසුරුවම් සමිති ණය | මාස 03 ක වැටුප. සරල සහනශීලී පොලී අනුපාත. මාස 60 කින් අයකරගැනීම. | |
| - වාහන ණය | විධායකයින්ට පමණි. සහනශීලී පොලී අනුපාත, මාස 60 කින් අයකරගැනීම. | |
| - මෝටර් සයිකල් ණය | සරල සහනශීලී පොලී අනුපාත, මාස 60 කින් අයකරගැනීම. | |
| - ත්‍රී රෝද ණය | සරල සහනශීලී පොලී අනුපාත, මාස 60 කින් අයකරගැනීම. | |
| අත්තිකාරම් | | |
| - උත්සව අත්තිකාරම් | නොමිලේ අන්තර්ජාලය. මාස 10 කින් අයකරගැනීම. | |
| - අලුත් අවුරුදු අත්තිකාරම් | සරල සහනශීලී පොලී අනුපාත, මාස 10 කින් අයකරගැනීම. | ඔව් |
| - පාසල් පොත් අත්තිකාරම් | නොමිලේ අන්තර්ජාලය. මාස 10 කින් අයකරගැනීම. | ඔව් |
| උපහාර පිරිනැමීම | සේවකයාගේ සේවය මත රඳා පවතී. (වැටුප් වර්ධක) | නැත |
| ශුභසාධනය ආශ්‍රිත ප්‍රතිලාභ | - CPC හෝ CPSTL හි සෑම සේවකයෙකුටම තම පවුල සමඟ දින 3ක්/රාත්‍රී 2ක් නැවතී සිටීමේ අවස්ථාව හිමිය. | |
| | - CPSTL ක්‍රීඩා සමාජ හා ව්‍යායාම මධ්‍යස්ථානය පහසුකම් අවස්ථාවන්හී සහභාගිත්වය. | ඔව් |
| | - වාර්ෂික සංචාරිය. | ඔව් |
| | - ලේ දන්දීමේ කඳවුර. | ඔව් |
| | - CPSTL පර්යන්තයන් හී සමූපාකාර වෙළෙඳ සැල. | ඔව් |
| වෛද්‍ය ප්‍රතිලාභ | - CPSTL I පර්යන්තයන් හී ගෘහස්ථ වෛද්‍යවරයෙක් සහ නොමිලේ ඖෂධ සහ සෘජුවම අනෙක් සේවකයින්ට ප්‍රතිපූරණය | ඔව් |
| | - සීමිත වෛද්‍ය ආවරණය | ඔව් |
| | - විශේෂ පරීක්ෂණ සඳහා අසීමිත ප්‍රතිපූරණය (CT ස්කෑන්ල US ස්කෑන්ල MRI, එන්ඩෝස්කොපි) | ඔව් |
| | - අනෙකුත් පරීක්ෂණ සඳහා අසීමිත ප්‍රතිපූරණය (ලේ) | ඔව් |
| මරණ ප්‍රතිලාභ | - රාජකාරි අවස්ථාවේ මියයාම සඳහා වන්දි ගෙවීම | ඔව් |
| සකසුරුවම් සමිති ප්‍රතිලාභ | - මරණ පාරිතෝෂිතයට සේවකයින්ගේ මරණය ඇතුළත්ය. සේවකයින්ගේ දෙමව්පියන්ගේ කලත්‍රයා ළමුන් හා කලත්‍රයාගේ දෙමව්පියන් | ඔව් |
| | - සකසුරුවම් සමිති පාරිතෝෂිකය ව්‍යවස්ථාපිත පාරිතෝෂිකය මෙන් ලබා දේ. | නැත |
| විශ්‍රාම වෙන්කිරීම | - ව්‍යවස්ථාපිත පාරිතෝෂිකය. | නැත |
| වෙනත් පහසුකම් | - විශේෂ රාජකාරි සඳහා නිල ඇඳුම් ලබාදීම. | ඔව් |

### පුහුණු සහ සංවර්ධනය

දැනට පවත්නා පුහුණු සඳහා අවස්ථාවන් ලබාදීම අපගේ සාර්ථකත්වයේ වැදගත් අංගයක් වී ඇත. අපගේ සේවකයින්ගේ අඛණ්ඩ සංවර්ධනය සමාගමේ වර්ධනය සඳහා අත්‍යවශ්‍ය වන අතර ඊට අමතරව, සේවක රඳවාගැනීම සහ පක්ෂපාතිත්තවය එයට ප්‍රතිලාභ අත්කරයි. CPSTL හි පුහුණුව සහ මානව සම්පත් සංවර්ධන කාර්යය අඛණ්ඩව සියලුම සේවකයින්ගේ පුහුණු අවශ්‍යතා නියාමනය කරයි. විශේෂ නිපුනතා සහ නව්‍යකරණ හැකියාවන් සඳහා වර්ධනය වන අවශ්‍යතාවන් සමඟ, නිත්‍ය පුහුණු වැඩසටහන් තුළින් කුසලතා සහ දක්ෂතා වර්ධනය කිරීම තුළ අපගේ සේවකයින්ට අපි සහය වෙමු. කාර්යස්ථ පුහුණුවට අමතරව, සේවකයින්ට බාහිර පුහුණු වැඩසටහන්වලට සහභාගිවීමට අවස්ථාව ලබා දේ. සමාලොචිත වසර තුළ, සමාගම තාක්ෂණික දැනුම, මෘදු කුසලතා, නායකත්ව කුසලතා, පීඩන කළමනාකරණය, ධනාත්මක චින්තනය. කණ්ඩායම ගොඩ නැගීම යනාදිය සංවර්ධනය කිරීමට සමාගම විසින් පුහුණු වැඩසටහන් පවත්වා ඇති අතර, අපි රු.මිලියන 31.8ක් ආයෝජනය කරමින් සහභාගිකයින් 2,391ක් සඳහා පුහුණු පැයගණන 21,832ක් ලබාදී ඇත. වසර තුළ සිදුකරන ලද පුහුණු කටයුතු පිලිබඳ සාරාංශයක් පහතින් දැක්වේ.

# මානව ප්‍රාග්ධනය (ඉතිරි කොටස)

| වැඩසටහන | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|
| රියදුරු කලාව | 76 |
| අභිප්‍රේරණය තුළින් ආකල්ප වෙනස | 60 |
| ශූන්‍යතා පදනම් අයවැයකරන සඳහා දිශානතිය | 51 |
| සේවක සංවර්ධනය | 64 |
| මූල්‍ය රෙගුලාසි | 112 |
| ප්‍රථමාධාර වැඩසටහන | 73 |
| නිරෝගී ජීවන රටාව | 84 |
| විගණන ගැටළු අවම කරන ආකාරය | 46 |
| මානව සම්පත් නිලධාරීන් සඳහා මානව සම්පත් කළමනාකරණය | 51 |
| දාමයේ කොටස්කරුවෙත් බවට පත්වීමේ වැදගත්කම | 47 |
| කාර්මික සෞඛ්‍ය සහ ආරක්ෂාව | 50 |
| අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු පද්ධති | 45 |
| අලුතින් බඳවාගත් සේවකයින් සඳහා ප්‍රාරම්භක වැඩසටහන | 141 |
| ISO 14001: දැනුවත් කිරීමේ වැඩසටහන | 41 |
| ඵලදායිතා වර්ධනය සඳහා නායකත්වය | 52 |
| අභිප්‍රේරණය හා කණ්ඩායම ගොඩ නැගීම | 52 |
| වෘත්තිමය ආරක්ෂාව සහ සෞඛ්‍ය කළමනාකරණය | 57 |
| ධනාත්මක චින්තනය හා සක්‍රීය හැසිරීම | 400 |
| තොරතුරු තාක්ෂණය ඇතුළුව නිෂ්පාදන හා සේවාවන් ප්‍රසම්පාදනය | 51 |
| ගබඩා කාර්යයන් සඳහා ඵලදායිතා දැනුවත්කිරීමේ වැඩසටහන | 40 |
| මහජන සම්බන්ධතා | 45 |
| සමාජ සංවාද හා සේවා ස්ථාන සහයෝගය | 172 |
| ක්‍රමෝපායික සැලසුම් කිරීම | 40 |
| පිඩන කළමනාකරනය | 147 |
| කාල කළමනාකරණය හා මුදල් කළමනාකරණය | 69 |
| "නිවාඩු" පිළිබඳ වැඩසටහන | 44 |
| අපේක්ෂිත ඊලඟ මට්ටමට සේවකයින් පරිනාමනය | 86 |
| ඔබගේ විද්‍යුත් තැපැල ඔබව සහ ඔබගේ සමාගම උසස් කරයි | 25 |
| අලුතින් බඳවාගත් රියදුරන් හට ප්‍රායෝගික පුහුණු වැඩසටහන | 25 |
| බාහිර පුහුණුව - කිතුල්ගල | 55 |
| ඉංග්‍රීසි පුහුණු වැඩසටහන | 28 |
| පරිගණක පුහුණු වැඩසටහන | 62 |
| පැටවීම් උපකරණ පහසුවෙන් මෙහෙයවීම පිළිබඳ වැඩසටහන | 04 |
| ඛණිජ තෙල් නිෂ්පාදනවල ශක්ති විශ්ලේෂණය සඳහා ICP-OES මෙහෙයුම් පරිහරණය | 02 |
| තත්ත්ව පාලන පුහුණු වැඩසටහන | 01 |
| FIDIC කොන්ත්‍රාත් යටතේ ජාත්‍යන්තර ඉදිකිරීම් ව්‍යාපෘති පිළිබඳ කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ වැඩමුළුව | 01 |
| ශ්‍රී ලංකාව සඳහා ආයතනික කළමනාකරණය පිළිබඳ වැඩසටහන (LKCM 16) | 03 |
| CPSTL SAP කණ්ඩායම් සාමාජිකයින්ට SAP පුහුණු වැඩසටහන | 10 |
| උසස් නායකත්වය හා සේවක කළමනාකරණය පිළිබඳ වැඩමුළුව | 03 |
| "විධායකය සකස්කළ තත්ත්ව කළමනාකරණය" (EPQM) පිළිබඳ වැඩසටහන | 01 |
| කාර්යසාධනය හා ඵලදායිතා කළමනාකරණ සේවක සහ කණ්ඩායම වර්ධනය - ඩුබායි | 01 |
| LNG නිෂ්පාදන පිළිබඳ අධ්‍යයනය | 01 |





**ස්ත්‍රීපුරුෂභාවය අනුව සාමාන්‍ය පුහුණු පැය**




**වර්ගය අනුව සාමාන්‍ය පුහුණු පැය**




### කිතුල්ගල බාහිර පුහුණුව

සේවකයින් අතර කණ්ඩායම් හැඟීම සහ ඵලදායි සම්බන්ධතාවය ගොඩනැගීම ප්‍රධාන වශයෙන් මූලික කරගනිමින් සහ සැලසුම් කිරීම, නායකත්වය, කාල කළමනාකරණය සහ දෙන ලද අරමුණු අත්කරගැනීමට දක්ෂතාව වැනි නිපුනතා වර්ධනයට සහය වෙමින් ජලයේ පාවීම, මනෝමය අභ්‍යාශ, කණ්ඩායම් සාකච්ඡා, දුෂ්කර අවදානම් දැරීම හා කණ්ඩායම් ගොඩනැගීමේ වැඩ ඇතුළුව, ,බාහිර පුහුණු වැඩසටහනක්, කිතුල්ගල පවත්වන ලදී.





ඊට අමතරව, කම්කරු ශ්‍රේණියේ සිට කළමනාකාරීත්ව මට්ටම දක්වා අදාළ වන බාහිර පාර්ශ්වයන් විසින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සඳහා සහභාගිවීමට CPSTL විසින් සේවකයින්ට අවස්ථාව ලබා දේ.

CPSTL සෑම අවස්ථාවකම, සේවකයින්ගේ වෘත්තීමය සහ වෘත්තිය සංවර්ධනය පිලිබඳ උනන්දුවන අතර M Sc, MBA සහ අනෙකුත් පශ්චාත් උපාධි අධ්‍යයන හැදෑරීම සඳහා මූල්‍ය සහයෝගය ලබා දෙමින් උසස් අධ්‍යාපනය සඳහා ඔවුන් පොළඹවයි. ඔවුන්ගේ වෘත්තිය වඩාත් සඵල කිරීමට සහ ආයතනය තුළ වෘත්තිකයින් රඳවාතබා ගැනීම සඳහා, CPSTL විසින් වාර්ෂික වෘත්තීය ආයතන දායකත්වයන් ප්‍රතිපූරණය කරයි.

වසර තුල, සේවකයින් විදේශිය පුහුණු වැඩසටහන් 8කට, පෙර පරීක්ෂණ 8කට සහ උපකරණ පුහුණු විදේශිය සංචාරවලට සහභාගි විය.

### තත්ත්ව සහතිකය

CPSTL හි ප්‍රධාන රසායනාගාරය කොලොන්නාව ස්ථාපනයේ පිහිටා ඇති අතර එය අලෙවිකරණ සමාගම් සඳහා ස්වාධීන රසායනාගාරයකි. එමෙන්ම නිෂ්පාදනවල තත්ත්ව සහතිකය ඉටුකරන අතර ස්වාධීනව සහතිකපත් නිකුත් කරයි. රසායනාගාරය මගින් පිරිවිතරවලය අනුකූලව සෑම කාණ්ඩයකම ලැබීම , සෑම නිෂ්පාදනයක් මාරු කිරීම සහ මුදාහැරීමට පෙර සෑම ටැංකියක්ම පරීක්ෂා කිරීම සිදුකරයි.

2017 වසර තුළ, ප්‍රධාන රසායනාගාරය පහත සඳහන් පරීක්ෂණ සඳහා පරීක්ෂා කිරීමේ පහසුකම් උසස් කරනු ලැබ ඇත.

ASTM D 4815 - 09 පරීක්ෂණ ක්‍රමය භාවිතයෙන් නවතම වායු වර්ණ ලේඛනය මගින් ඔක්ටේන් 92 ගැසලින් සහ ඔක්ටේන් 95 ගැසලින් හි අම්ලකර අන්තර්ගතය විශ්ලේෂණය කරයි. ASTM D 3606 - 10 පරීක්ෂණ ක්‍රමය භාවිතයෙන් නවතම වායු වර්ණ ලේඛනය මගින් ඔක්ටේන් 92 ගෑසලින් සහ ඔක්ටේන් 95 ගැසලින් හි බෙන්සෝන් අන්තර්ගතය විශ්ලේශනය කරයි. මිලදී ගත් නවීන උපකරණ භාවිතයෙන් කාර්යක්ෂවම හා නිවැරදිව ඉටුකිරීමට මෙම පරීක්ෂණ පරාමිතිවලට හැකිය.

ASTM D 93 - 12 ISO 2719 - 1988 පරීක්ෂණ ක්‍රමය භාවිතයෙන් සම්පූර්ණයෙන් ස්වයංක්‍රිය කළ ජීවනාලංකය මගින් ගෑස් වායුවල l (500 ppm Max S, 10 ppm Max. S, ගෑස් වායුවල) ජීවනාලංකය විශ්ලේෂණය (PMcc) ඉන්ධන තෙල් :ඉන්ධන තෙල් 800 secs, අඩු සල්ප ඉන්ධන තෙල් 1500 secs, අධික සල්ප ඉන්ධන තෙල් 180 cSt, , අඩු සල්ප ඉන්ධන තෙල180 cSt ) RMG 380, RMG 180) වර්තමානයේ ප්‍රධාන රසායනාගාරයට විවිධ ජීවනාලංකය විශ්ලේෂණයන් මගින් පහසුවෙන් හා කාර්යක්ෂමව ජීවනාලංකය පරීක්ෂණය සිදුකළ හැකිය.

## මානව ප්‍රාග්ධනය (ඉතිරි කොටස)

සිලින්ඩර් ලිහිසි තෙල් ඇගයුම මත ගුලිය මගින් ගුවන් ටර්බයින් ඉන්ධනවල (JET A-1) ලිහිසිතා පිළිබඳ විශ්ලේෂණය1) (BOCLE) ASTM D 5001 - 10 පරීක්ෂණ ක්‍රමය භාවිතා කරන නවීන උපකරණ. මෙම උපකරන භාවිතයෙන්, CPSTL රසායනාගාරයට ගුවන් ටර්බයින් ඉන්ධනවල (JET A-1) ලිහිසිතා පිළිබඳ විශ්ලේෂණය ඉටු කරයි.

තත්ත්ව සහතිකය, සහතික කිරීම හා පරීක්ෂණ ප්‍රතිඵලවල අනුරේඛන හැකියාව පවත්වා ගැනීම

CPSTL ප්‍රධාන රසායනාගාරය ශ්‍රී ලංකා පැවරීම් මණ්ඩලයේ (SLAB) ISO 17025:2005 තත්ත්ව ප්‍රමිතියේ රසායනාගාර තත්ත්ව කළමනාකරන ක්‍රමය (QMS) පිළිබඳ පිළිගැනීම ලබාගැනිමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. මෙම අරමුණ සඳහා, CPSTL විසින් කර්මාන්ත තාක්ෂණික ආයතනයේ (ITI) උපදේශන සේවා ලබාගෙන ඇත. උපදේශන වැඩ ආරම්භ කර ඇති අතර පළමු පුහුණු වැඩසටහන සහ පද්ධතිවල පරතර විශ්ලේෂණය, විෂයපථය සකස් කිරීම, ගුණාත්මකභාවය පිළිබඳ අත්පොත්, ක්‍රියාපටිපාටි අත්පොත්, ආකෘති සහ තත්ත්ව පද්ධති යටතේ අනෙකුත් අවශ්‍ය ලියවිලි සකස් කිරීම ආරම්භ කර ඇත.

### සෞඛ්‍ය සහ ආරක්ෂාව

මෙම සමාගම ශ්‍රී ලංකාවේ විශාලතම ඛණිජතෙල් පර්යන්ත ක්‍රියාකරු වන අතර, නිෂ්පාදන පරිහරණය අධික ලෙස ගිනි ඇවිලෙන සුළුය. මෙහෙයුම් කාර්යයන් ද ඉහළ අවදානම් වර්ගීකරණය යටතේ පවතී. මෙහෙයුම් සිදු කිරිමේදි සුළු වරදක් මහ පරිමාණයේ ගින්නකට හේතු විය හැක. CPSTL ආර්ථිකමය වැදගත් මධ්‍යස්ථානයක් වන බැවින්, විශාල පරිමාණයේ ගින්නක් මෙරට ආර්ථිකය කඩාවැටිමට හේතු විය හැකිය. ගිනි, තෙල් විසිරයාම වැනි අවදානම පිළිබඳ සැකය ඉහළ මට්ටමක ඇති බැවින්, සෞඛ්‍ය සහ ආරක්ෂාව CPSTL සඳහා බරපතල වැදගත්කමකි. සමාගම එහි ආරක්ෂිත උපකරණ සහතික කිරීම සඳහා සැලකියයුතු ලෙස ආයෝජනය කරන අතර එම පද්ධති කාර්ය බහුල මෙහෙයුම් තත්ත්වයෙන් පවතී. එමෙන්ම එහි සේවකයින් මෙන්ම බාහිර පුද්ගලයින් වන බවුසර් රියදුරන් සහ සහයකයින් මෙන්ම සියලුම පාර්ශ්වකරුවන්ගේ ආරක්ෂාව සඳහා පුහුණු කර ඇත.

විශේෂිත ගෘහස්ථ ප්‍රථමාධාර පුහුණුව, ගිනි නිවීමේ වැඩුළු, ආරක්ෂිත පුහුණු, සහ දැනුවත් කිරිමේ වැඩසටහන් CPSTL සතු වේ. ගිනි දියවුම සේවා කිරීම හා පරීක්ෂා කිරීම, විධිමත් ලෙස ගිනි සයිරන් නලා පරීක්ෂාව, පිරිසිදු කිරීම, උපකරණ පෙඟවීම් හා සොඩනලවලට තෙල් දැමීම හා පරීක්ෂාව විධිමත් ලෙස සිදු කෙරේ. සම්පූර්ණ සෞඛ්‍ය, ආරක්ෂාව සහ පාරිසරික ප්‍රතිපත්තිය සෞඛ්‍ය සහ ආරක්ෂාව විධිමත්ව ක්‍රියාත්මක කිරීම පාලනය කිරීම සඳහා ක්‍රියාත්මකය. අපජලය බැහැරයාමේ ක්‍රමය අවශ්‍ය ප්‍රමිතිය තුළ අපජලයේ තත්ත්වය රඳාපවත්වා ගැනීමට නියාමනය කරන ලද අතර විධිමත්ව කුණුකසල වෙන්කිරීමේ ක්‍රමයක් වසර තුහ ආරම්භ කරන ලදී. ඉදිරියට පියවර තබමින්, ගෝලීය උණුසුම්වීම සඳහා දායකත්වය අඩුකිරීමට සහ කාබන් විමෝචනයේ බලපැම අඩුකිරීමට, ශ්‍රී ලංකා කාලගුණ අරමුදලේ සහය 2017 දි ලබාගන්නා ලදී.



# සමාජීය හා සම්බන්ධතා ප්‍රාග්ධනය



පාරිභෝගික සම්බන්ධතා



ප්‍රජා සහභාගිත්වය



සමාජ සිදුවීම්



දැනුවත් කිරීමේ වැඩසටහන්

## පාරිභෝගික සම්බන්ධතා

ආර්ථික ක්‍රියාව, ජංගමතාව සහ සංවර්ධනය ඇති කරන අත්‍යවශ්‍ය සේවා ලබාදීම තුළින් අපි රටට සේවය කරමු. අපගේ පර්යන්ත සහ ප්‍රාදේශිය ගබඩා හරහා දිවයින පුරා ඛණිජ තෙල් නිෂ්පාදන අපි සපයන්නෙමු. අපගේ පුළුල් ලඟාවීම මෙරට සියලුම කලාපවලට සේවය කිරීමට මෙන්ම සේවා අනර්ඝත්වය සඳහා ඉඩකඩ ලබා දේ.

## ප්‍රජා සහභාගිත්වය

සමාගම විසින් ප්‍රජා සහභාගිත්වය කරා ක්‍රමෝපායික සහ සක්‍රිය ප්‍රවේශයක් යොදා ගනී. අපට ඇති ස්වභාවය, ප්‍රමාණය සහ හවුල්කාරත්වයන් අපගේ සාමාන්‍ය ව්‍යාපාර මෙහෙයුම්වල ප්‍රජාවන් පෝෂණය කරන අතර අප ක්‍රියාත්මක දිවයින පුරා අර්ථවත් පැවැත්ම නිර්මාණය කිරීමට අප වෙත අවස්ථාව ලබා දේ.

## නිපුනතා සංවර්ධනය

සමාගම විසින් කර්මාන්ත පුහුණු පළපුරුද්ද අත්කර ගන්නා වරලත් සිසුන් සහ උපාධි අපේක්ෂකයින් හා වෘත්තිමය ආයතනවල සිසුන් සඳහා අවශ්‍ය එක් වසරක පුහුණුව ලබාදීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය සමඟ හවුල් වී ඇත. මෙම වැඩසටහන ඉහළ සාර්ථකත්වයන් සමඟ අඛණ්ඩව ඉදිරියට යන අතර වසර තුළ පුහුණුලාභින් 107කට පහසුකම් සපයන ලදී.

## සේවක අවස්ථා

වාර්ෂිකව CPSTL විසින් උපකාරි සහ සහයෝගී සේවා පරිසරයක් ගොඩ නැගීම සඳහා සේවක සමාජ සහ ශුභසාධන අවස්ථා පවත්වනු ලබයි. 2017 වසර තුළ පැවති මෙවැනි අවස්ථාවලින් කිහිපයක් පහතින් දැක්වේ.

### ලේ දන්දිමේ වැඩසටහන

වාර්ෂික ලේ දන්දිමේ වැඩසටහන සමාගමේ සම්පූර්ණ සහ සක්‍රිය සේවකයින්ගේ සහභාගිත්වයෙන් අඛණ්ඩව 37 වැනි වරටත් 2017 වසර තුළ සාර්ථකව පවත්වන ලදී.





# සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය (ඉතිරි කොටස)

### ගංවතුරින් පීඩාවට පත් සේවකයින්ට පරිත්‍යාග

වසර තුළ දකුණු පළාතේ ගංවතුරින් පීඩාවට පත් සේවකයින් වෙත මුදල් පරිත්‍යාග සහ වියලි සලාක පිරිනමන ලදී.





### සංගීත වැඩසටහන

සේවකයින්ගේ සංගීත නිපුනතාව නගා සිටුවීම මෙන්ම අනෙකුත් සේවකයන්ගේ විනෝදය වෙනුවෙන් CPSTL හි කලා සමාජය විසින්, වැඩ බිමට ගී සිත්තම - තරුවක් නොවන තරුවක්, නමින් සංගීත තරඟයක් පවත්වන ලදී.





### ශ්‍රමදාන වැඩසටහන

සියලුම ගබඩා ඇතුළුව CPSTL හි සේවකයින් විසින් කාර්යාල පරිශ්‍රයන් තුළ ශ්‍රමදාන වැඩසටහන් පවත්වන ලදී.





# සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය (ඉතිරි කොටස)

### රන්කාසි පිරිනැමීමේ උත්සවය

සමාගමේ වසර 25ක සේවා කාලය සාර්ථකව සම්පූර්ණ කරන ලද සේවකයින්ගේ අභිනන්දනය සඳහා ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ ද සහභාගීත්වය සමග රන් කාසි පිරිනැමීමේ උත්සවය සාර්ථකව පවත්වන ලදි.





### SAP පිළිබඳ පුහුණුව

SAP (ERP) ක්‍රමය පිළිබඳ වටිනා පුහුණුවක් CPSTL, CPC හා LIOC හි සේවකයින් සඳහා ඉන්දියාවේ ඛණිජ තෙල් කළමනාකරණය පිළිබඳ ඉන්දියන් ඔයිල් ආයතනයේදී ලබාදෙනු ලැබීය. විවිධ SAP ආදර්ශ පුහුණුව තුළ පුළුල්ව ආවරණය කරන ලද අතර සහභාගිවූවන්ගේ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි මෙම වැඩසටහන සකස් කරන ලදී.




### ධනාත්මක චින්තනය, සක්‍රීය හැසිරීම සහ ආකල්ප පුහුණුව පිළිබඳ දේශන මාලාව

"ධනාත්මක චින්තනය, සක්‍රීය හැසිරීම සහ ආකල්ප පුහුණුව" පිළිබඳ දේශන මාලාව ගබඩා ඇතුළුව CPSTL හි සියලුම සේවකයින් සඳහා CPSTL හි සභාපති ධම්මික රණතුංග මහතා විසින් පවත්වන ලදී. එය කාර්යභාරය තියුණු කිරීමට මෙන්ම පෞද්ගලික ජීවිතය සඳහාද දායක විය.





### බෞද්ධ දේශනා

බෞද්ධ සංවිධානය විසින් පෝය දින කාර්යාල පරිශ්‍රයේදී බෞද්ධ දේශනා පවත්වනු ලබන අතර ඒ සඳහා සහභාගිවීමට සියලුම සේවකයින්ට ආරාධනය කරනු ලබයි.



# සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය (ඉතිරි කොටස)



### චිත්‍ර තරඟය හා ප්‍රදර්ශනය

සේවකයින් සහ ඔවුන්ගේ දරුවන්ගේ සහභාගිත්වයෙන් චිත්‍ර තරඟය සහ ප්‍රදර්ශනයක් පවත්වනු ලැබූ අතර ජයග්‍රහකයින් සඳහා ත්‍යාග සහ සහතිකපත් පිරිනමන ලදී.





### සමාජීය උත්සව

සමාජීය වගකීම CPSTL හි ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේදී අවශ්‍යම අංගයක් ලෙස සලකනු ලබන අතර මෙහිදී සමාගම ජනතාවගේ ජීවන තත්ත්වය සහ අවට පරිසරය වර්ධනය කිරීමට උත්සාහ දරයි. අපගේ වර්ධනය මූල්‍ය වශයෙන් පමණක් නොව සමාජීය වශයෙන්ද තිරසාරාත්මක වන බව අපි අතිශයින් දැනුවත්ය. එබැවින්, CPSTL සැමවිටම සමාජයට සහයවීමේදී ව්‍යවස්ථාපිත වගකීම ඉක්මවා කටයුතු කරන අතර ඒ සඳහා ප්‍රජාවගේ ශුභසාධනය. සංස්කෘතික කටයුතු සහ පුන්‍යාධාර අවස්ථාවන සඳහා වසර තුළ අඛණ්ඩව සහය ලබා දී ඇත.

### අපේක්ෂා රොහලේ වාට්ටු දෙකක් ප්‍රතිසංස්කරණය

CPSTL හි බෞද්ධ සංගමය මහරගම අපේක්ෂා රෝහලේ භාවිතා කල නොහැකි තත්ත්වයේ පැවති ගොඩනැගිල්ලක් හඳුනාගෙන එය ප්‍රතිසංස්කරණය කර පිරිත් දේශනයකින් පසු කළමනාකාරිත්වයට භාවිතය සඳහා භාරදෙන ලදී. වර්තමානයේ වාට්ටු දෙකක් ප්‍රතිසංස්කරණය කළ ගොඩනැගිල්ලෙහි ක්‍රියාත්මක වේ.






### සාමාන්‍ය පෙළ සිසුන් සඳහා අධ්‍යාපනික සම්මන්ත්‍රණය

CPSTL විසින් කැලණිය විශ්ව විද්‍යාලයේ උපාධිධාරී සංගමයේ කොළඹ ශාඛාවේ සහයෝගිත්වයෙන් කුඩාබුත්ගමුව රාජසිංහ මහා විද්‍යාලයේ සාමාන්‍ය පෙළ සිසුන් සඳහා ගණිතය පිළිබඳ අධ්‍යාපනික සම්මන්ත්‍රණය පැවැත්වීම සඳහා මූල්‍ය සහය ලබාදෙන ලදී.



# සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය (ඉතිරි කොටස)



**ගංවතුර අනාධයින් සඳහා වියලි සලාක**

දකුණු පළාතේ ගංවතුරින් පීඩාවට පත් ජනතාවට CPSTL විසින් සහයහ ලබාදී ඇති අතර ඔවුන්ගේ නිවාස පරීක්ෂා කරමින් වියලි සලාක සහ ගෘහස්ථ අවශ්‍යතා බෙදාහරින ලදී.





**වරප්‍රසාද නොලත් පවුලක් සඳහා නව නිවාසයක් ඉදි කිරීම**

මූල්‍ය අංශයේ ශුභසාධන සමිතිය විසින් ළමුන් 3 දෙනෙක් සිටින වරප්‍රසාද නොලත් පවුලක් වෙනුවෙන් නව නිවසක් ඉදිකිරීම මගින් අති විශාල සහයක් ලබාදී ඇති අතර මොහුන්ගේ පියා අනතුරකින් මියගොස් ඇත.





**ජාතික පිළිකා රෝහලේ ළමා ඒකකය සඳහා වියලි සලාක පරිත්‍යාග කිරීම**

සමාජීය වගකීම් සහගත වැඩසටහනේ පියවරක් ලෙස, මහරගම අපේක්ෂා රෝහලේ ළමා ඒකකය පරීක්ෂා කර අත්‍යාවශ්‍ය ඖෂධ පරිත්‍යාග කරමින් ඔවුන්ට ත්‍යාග ලබා දෙමින් ඔවුන්ට සිනහවක් ලබා දුන්හ.





# සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය (ඉතිරි කොටස)

**මීතොටමුල්ල නායයාමෙන් ගොදුරුවූවන්ට සහයවීම**

මීතොටමුල්ල ආපදාව අවස්ථාවේ නොමිලේ ආහාර ලබාදෙමින් CPSTL විසින් අසල්වැසියන්ට දෑත දිගු කර ඇත.





### දැනුවත් කිරීමේ වැඩසටහන

**මාර්ග ටැංකි රියදුරන් සඳහා පුහුණු වැඩසටහන**

CPSTL විසින් 2017 දී ආරක්ෂක රිය පැදවීම සහ මාර්ගගත රියදුරු විනය පිළිබඳ මාර්ග ටැංකි රියදුරන්ට පුහුණු වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී.





# ස්වභාවික ප්‍රාග්ධනය



පරිසරහිතකාමී තිරසාර බණිජ තෙල් නිෂ්පාදන පරිහරණය



කාලීන සහ සුදුසු කළමනාකරණය



අපද්‍රව්‍ය වගකීම් සහගතව බැහැර කිරීම



තෙල් ඉහිරීම අවම කිරීමට පුහුණුව




ශ්‍රී ලංකාව තුළ ඛණිජ තෙල් නිෂ්පාදන කළමනාකරණය වෙනුවෙන් නවීන අංගෝපාංගයන්ගෙන් යුත් යටිතල පහසුකම් සමඟ, තොග ඛණිජ තෙල් ගබඩා කිරීම තුළ කටයුතු කිරීම සහ බෙදාහැරීමේ කටයුතු සිදු කරමින් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඉන්දියන් තෙල් සමාගමේ දස දහසක් වන පාරිභෝගිකයින්ට සේවය ලබා දේ.

එමෙන්ම රටතුළ සිල්ලර පාරිභෝගිකයින්ගේ සහ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය තුළ සම්බන්ධ විවිධ කාර්මික අංගවල තොග පාරිභෝගිකයින් විශාල සංඛ්‍යාවකගේ බලශක්ති ඉල්ලුම සපුරාලයි.

අක්වෙරළ සහ ගොඩ වෙරල තෙල් කටයුතු දිවයින තුල CPSTL විසින් ක්‍රියාත්මක පරිසරය සමඟ සම්බන්ධ වේ. මෙම කටයුතු පරිසර සේවා පද්ධති මත රැඳෙන අතර ජෛව විවිධත්වය සහ පරිසර පද්ධති සේවා කෙරෙහි වක්‍ර හා සෘජු බලපෑමක් ඇති කිරීමට හැකියාව ඇත. BES මත මෙහෙයුම් රඳා පැවැත්ම සහ විභව බලපෑම් කාලීනව හඳුනාගැනීම සහ සුදුසු කළමනාකරණය තුළින් මේ ආශ්‍රිත විභව අවදානම් ඵලදායීව ආරක්ෂා කිරීම සහ BES සංරක්ෂණ අවස්ථාවන් සඳහා පදනම් ලබා දේ.

බලශක්ති අංශයේ ක්‍රියාකරුවෙක් ලෙස, ස්වභාවික ප්‍රාග්ධනය යනු අපගේ වටිනාකම් නිර්මාණ ක්‍රියාවලිය සඳහා ප්‍රධාන යෙදවුම වේ. එමනිසා අපි සමස්ථ වටිනාකම් දාමය පුරා යොදා ගන්නා වැඩපියවර තුළින් අපගේ පාරිසරික බලපැම ඇගයීම් සිදුකර අවම කරමු. වසර තුළ, පාරිසරික නීති/රෙගුලාසි කඩකිරීම වෙනුවෙන් සමාගම වෙත කිසිදු දඩමුදලක් හෝ දඬුවමක් නොමැත.

## බලශක්තිය

CPSTL හි බලශක්ති අවශ්‍යතාවන් ඩීසල්, දැවි තෙල් සහ ජාතික පද්ධතියේ විදුලිය තුළින් ඉටුකරයි. බලශක්තිය ප්‍රධාන වශයෙන් පර්යන්ත දෙකෙන් (කොලොන්නාව සහ මුතුරාජවෙල) තුළ පරිභෝජනය කරන අතර ඒවා වඩාත් බලශක්ති බලවත් අක්වෙරළ ඒකකය සහ දිවයින පුරා ගබඩා වේ. වසර තුළ මූලාශ්‍ර තුළින් සමාගමේ බලශක්ති පරිභෝජනය පහතින් දැක්වේ.

# ස්වභාවික ප්‍රාග්ධනය (ඉතිරි කොටස)

| බලශක්ති මූලාශ්‍රය | මිනුම් ඒකකය | 2017 දී පරිභෝජනය | 2016 දී පරිභෝජනය |
|---|---|---|---|
| මිලදීගත් විදුලිය | කි.වො. | 2,904,300 | 2,914,112 |
| ඩීසල් | කි.ලී | 4,897 | 4,457 |

## ජලය

සමාගමේ මෙහෙයුම් ජලය ආශ්‍රිත නොවන අතර අපි ජලය භාවිතා කරන්නේ මූලිකවම සේවකයින්ගේ පරිභෝජනය සහ කටයුතු නඩත්තුව සඳහා පමණි. අපගේ ජල අවශ්‍යතාවන් නගර සභා මාර්ගවලින් මූලික වශයෙන් ඉටු කර ගනී. සමාගමේ මුළු ජල පරිභෝජනය පහතින් දැක්වේ;

| මූලාශ්‍රය | මිනුම් ඒකකය | 2017 දී පරිභෝජනය | 2016 දී පරිභෝජනය |
|---|---|---|---|
| නාගරික ජල සැපයුම | කි.ලී | 275,720 | 268 ,120 |

## නිෂ්පාදන ප්‍රවාහනය

ඛණිජ තෙල් නිෂ්පාදන ප්‍රවාහනය තුළ භූමිය සහ ජල සම්පත් දූෂණය වන තෙල් ඉහිරීම/කාන්දුවීම්/අනතුරු හේතු කොට ගෙන පාරිසරික අවදානම් ඇති වේ. පහත සඳහන් ආරක්ෂක ක්‍රියාමාර්ග ආයතනය විසින් යොදා ගනු ලැබුවේ ප්‍රවාහන කණ්ඩායම සැලසුම් නොකළ සිදුවීම් මෙහෙයවීම සඳහා මනාව පුහුණු කරන ලද බව සහතික කරන ලදී. තෙල් ඉහිරීම/කාන්දුවීම් අවස්ථාව තුළ සම්මත සහ හදිසි ප්‍රතිචාර ක්‍රම පිළිබඳ ප්‍රවාහන කණ්ඩායම් සඳහා අඛණ්ඩ පුහුණු වැඩසටහන් සහ පෙන්නුම් කිරීම් අපි පවත්වමු.

**අපගේ වැඩසටහන්වලට ඇතුළත් වන්නේ,**

1. ටැන්කර්වලින් කාර්ගෝ මුදාහැරීම තුළ බෝයා/ජෙටි වල යම් ඉන්ධන කාන්දුවීම් වැලැක්වීම. නළ මාර්ගවල කිසිදු හානියක් නොවන බව සහතික කිරීමට බඩු තොග ලැබීමට පෙර ලබාගන්නා සහ ගොඩබෑම් සිදුකරන සොඩනලවල පීඩනය පරීක්ෂා කරන ලදී.

2. යම් තෙල් කාන්දුවීම්, තෙල් ආශ්‍රිත රසායනික ද්‍රව්‍ය සහ තෙල් උරාගන්නා කැබිස් (තෙල් පාදක) සුළු ඉන්ධන ඉහිරීම් අවම කිරීමේ ක්‍රියාමාර්ග යක් ලෙස ලබාගත හැත.

3. ජනතා වගකීම්, නිෂ්පාදන වගකීම් සහ දූෂණ වගකීම් සඳහා තෙවන පාර්ශ්ව රක්ෂණය.



# පාලනය සහ අනුකූලතාව

# ආයතනික පාලනය

CPSTL හි ආයතනික පාලනය යහපත් සහ ඵලදායි ආයතනික සංස්කෘතියක් නිර්මාණය කිරීමට සැලසුම් කරන අතර ඉන් සෑම ගනුදෙනුවකදීම අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ කළමනාකාරිත්වයේ වගවීම, විනිවිදබව, සාධාරණත්වය ශක්තිමත් කරමින් ආයතනය පිළිබඳ ජනතා විශ්වාසය ගොඩ නැගීමට සහය වේ. ආයතනික පාලනයේ අරමුණ වන්නේ සමාගමට දිගුකාලීන සාර්ථකත්වය අත්කර දෙන ඵලදායී, ව්‍යවසායකත්ව සහ විචක්ෂණ කළමනාකාරණයක් ඇති කිරීමයි. පුළුල් අර්ථයෙන් එයට අයත් වන්නේ;

- දැක්ම, මෙහෙවර, පරමාර්ථ සහ ක්‍රමෝපාය සැලසුම්කර සන්නිවේදනය කරන ආකාරය
- වටිනාකම් සමඟ මනාව අනුකූල වන ආකාරය
- අවදානම් කළමනාකරණය ආකාරය
- විනිවිදභාවය ප්‍රවර්ධනය කරන ආකාරය
- තිරසාර ආකාරයකින් මෙහෙයුම් කළමනාකරණය කරන ආකාරය
- අනාගත නායකයින් දිරිමත් කරමින් සංවර්ධනය කරන ආකාරය
- පාර්ශ්වකාර වටිනාකම් වැඩි කිරීමට ආයතනික සංස්කෘතිය ප්‍රවර්ධනය කරන ආකාරය

ශ්‍රී ලංකාව තුළ ඛණිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදාහැරීමේ ප්‍රධාන දායකයා ලෙස, මෙම ආයතනය රටේ නියාමන ආයතන විසින් දක්වා ඇති නීතිකරණ, රෙගුලාසි සහ සංග්‍රහවලට අනුකූලව ආයතනික පාලනය පිළිබඳ මූලධර්ම ක්‍රියාත්මක කිරීමට සහතික වන අතර එය සමාගම විසින් දක්වා ඇති අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශවලටද අනුකූල වේ.

## ආයතනික පාලන රාමුව

CPSTL හි ආයතනික පාලන රාමුව ප්‍රධාන කුළුණු තුනක් යටතේ පැහැදිලි කළ හැක;

1. අනුකූලතාව
2. පාලන ව්‍යුහය
3. සහතිකවීම සහ පාලනය




### අනුකූලතාව

**බාහිර අවශ්‍යතා**

- 2007 අංක 7 දරන සමාගම් පනත
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කල ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය
- 2003 දි මුදල් අමාත්‍යංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ
- 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත

**අභ්‍යන්තර අවශ්‍යතා**

- සාංගමික ව්‍යවස්ථාවලිය
- අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රතිපත්ති
- සමාගම් රෙගුලාසි
- ව්‍යාපාර චර්යා සංග්‍රහය
- අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය

# ආයතනික පාලනය (ඉතිරි කොටස)

## 1. අනුකූලතාව

සමාගමේ ආයතනික පාලන ව්‍යවහාර පහත සඳහන් නීතිකරණ, සංග්‍රාහ සහ ස්වේච්ඡා ව්‍යවහාර අවශ්‍යතාවන්ට අනුකූල වේ.

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කල ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය
- 2003 දි මුදල් අමාත්‍යංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශග
- 2007 අංක 7 දරන සමාගම් පනත
- 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත
- සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය
- අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රතිපත්ත
- සමාගම් රෙගුලාසි
- ව්‍යාපාර චර්යා සංග්‍රහය
- අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය

## 2. පාලන ව්‍යුහය

- අධ්‍යක්ෂ මණ්ඩලය

සමාගමේ සියලුම කටයුතුවල ආයතනික පාලනය පිළිබඳ ඉහළම ප්‍රමිති පවත්වා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය කැප වි සිටී. පාලනයේ අරමුණ වන්නේ ඵලදායි සහ විචක්ෂණ කදළමනාකරණය තුළින් කොටස්හිමියන්ට දිගුකාලීන තිරසාරත්වය ඇති කිරීමයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ මූලික කාර්යයන්ට අයත් වන්නේ;

- ක්‍රමෝපායන් සකස් කිරීම තුළ උපදෙස් හා මගපෙන්වීම් ලබාදීම මේ තුළින් ආයතනයේ දිගුකාලින සාර්ථකත්වය ප්‍රවර්ධනය කිරිම අරමුණු කරයි.
- ක්‍රමෝපායික මඟ පෙන්වීම ලබාදිම සහ ආයතනික ක්‍රමෝපාය සහ සමාගමේ කාර්යසාධන පරමාර්ථ ඇගයීම, සමාලෝචනය සහ අනුමත කිරිම.
- වාර්ෂික සැලසුම් සහ දිගුකාලීන ව්‍යාපාර සැලසුම් සමාලෝචනය සහ අනුමත කිරීම.
- පාලන සහ අනුකූලතා ක්‍රම නියාමනය.
- සමාගම විසින් යොදාගන්නා මූල්‍ය සහ අනෙක් වාර්තාකරණ ව්‍යවහාර අනුමත කිරිම සහ නියාමනය.
- ප්‍රධාන අත්කරගැනීම්, බැහැරකිරීම් සහ ප්‍රාග්ධන වියදම සමාලෝචනය සහ අනුමත කිරිම.
- අධ්‍යක්ෂ මණ්ඩලයේ සිට විධායක මට්ටම දක්වා බෙදනු ලබන අභිමතයන්/බලාධිකාරයන් වෙත යම් වෙනස්වීම් තිරණය කිරීම.
- අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකරන ක්‍රියාපටිපාටි පාලනය.

| | අධ්‍යක්ෂවරයාගේ නම | අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වූ දිනය | අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්වු දිනය | තනතුර |
|---|---|---|---|---|
| 1 | ඩි.සී. ෂෙහාන් සෙනෙවිරත්න මහතා | 2015 ඔක්තෝබර් 14 | 2017 මාර්තු 23 | සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ (වි.අ) |
| 2 | ටී.පී. ජයසිංහ මහතා | 2015 ඔක්තෝබර් 14 | 2017 මාර්තු 6 | වි.නො.අ. |
| 3 | ඉෂාන් පෙරේරා මහතා | 2015 ඔක්තෝබර් 14 | 2017 මාර්තු 23 | වි.නො.අ |
| 4 | ශ්‍යාම් බෝරා මහතා | 2015 ඔක්තෝබර් 14 | | වි.නො.අ |
| 5 | ආචාර්ය ලලිත් ලියනගේ | 2015 ඔක්තෝබර් 14 | 2017 මාර්තු 23 | වි.නො.අ |
| 6 | නළුන් ප්‍රනාන්දු මහතා | 2017 මාර්තු 07 | 2017 මාර්තු 23 | වි.නො.අ |
| 7 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය | 2015 ඔක්තෝබර් 14 | | වි.නො.අ |
| 8 | දුමින්ද රාජපක්ෂ මහතා | 2015 ඔක්තෝබර් 14 | 2017 මාර්තු 23 | වි.නො.අ |
| 9 | අනුප් ජයින් මහතා | 2015 ඔක්තෝබර් 14 | | වි.නො.අ |
| 10 | රංජිත් සින් මහතා | 2016 ජූනි 01 | | වි.නො.අ |
| 11 | ධම්මික රණතුංග මහතා | 2017 ජූනි 01 | | සභාපති (වි.අ) |
| 12 | සංජීව විජේරත්න මහතා | 2017 ජූනි 01 | | කළමනාකාර අධ්‍යක්ෂ (වි.අ) |
| 13 | නිමල් ජයසුන්දර මහතා | 2017 ජූනි 01 | | වි.නො.අ |
| 14 | යූ.එන්. ගුණවර්ධන මහතා | 2017 ජූනි 01 | | වි.නො.අ |

**වි.නො.අ** විධායක නොවන අධ්‍යක්ෂ **වි.අ** විධායක අධ්‍යක්ෂ

# ආයතනික පාලනය (ඉතිරි කොටස)

වාර්ෂික වාර්තාවේ 14 සිට 17 දක්වා පිටුවල 2017 දෙසැම්බර් 31 දිනට එක් එක් අධ්‍යක්ෂවරයාගේ විස්තර මගින් සමාගමට අවශ්‍ය ක්‍රමෝපාය, කාර්යසාධනය, සම්පත් සහ ව්‍යාපාර පරිචයන් පිළිබඳ ගැටළුවලට ස්වාධීන තීරණ ලබාදීමේ පළපුරුද්ද සහ ප්‍රමාණවත් ධාරිතාව පෙන්වා දේ.

- **අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සහ තුළනය**
  සමාලෝචිත වසර තුළ අධ්‍යක්ෂවරු කණ්ඩායම් දෙකක් විය. 2017 ජනවාරි 01 සිට 2017 මැයි 23 දක්වා අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් 09කින් සමන්විත වූ අතර ඉන් 08 දෙනෙක් විධායක නොවන අධ්‍යක්ෂවරුන් විය. එක් අයෙක් විධායක අධ්‍යක්ෂ වූ අතර ඔහු සමාගමේ සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ විය. 2017 ජූනි 01 සිට 2017 දෙසැම්බර් 31, අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් 08කින් සමන්විත වූ අතර ඉන් 06 දෙනෙක් විධායක නොවන අධ්‍යක්ෂවරුන් විය. 02ක් විධායක අධ්‍යක්ෂවරු විය.

- **අධ්‍යක්ෂවරු පත්කිරීම**
  සාංගමික ව්‍යවස්ථාවලියේ නියමයන්ට යටත්ව වාර්ෂික මහ සභා රැස්වීමක් තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරු පත් කෙරේ. අධ්‍යක්ෂධූරය සඳහා අපේක්ෂකයින් සලකා බැලීමේදී, අනෙකුත් කරුණු අතර, පළපුරුද්ද පිළිබඳ පුථුලබව, ව්‍යාපාර සහ මූල්‍ය ගැටළු අවබෝධකරගැනීම, මනා තීරණ ක්‍රියාත්මක කිරීමේ හැකියාව, විවිධත්වය. නායකත්වය, ජයග්‍රහන සහ ව්‍යාපාරය සහ කර්මාන්තයට බලපාන කරුණු පිළිබඳ පළපුරුද්ද පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැලකිල්ලට ගනී.

- **වගකීම් බෙදාහැරීම**
  සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂගේ කාර්යභාරයන් ඔවුන් අතර වගකීම් පැහැදිලිව බෙදමින් 2017 ජූනි 01 දින සිට වෙන් කරන ඇති අතර ඒ තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයය අතර වගවීම සහ බලය පිළිබඳ සහ ව්‍යාපාරය කරගෙන යාම සඳහා විධායකයේ වගකීම පිළිබඳ තුළනය සහතික කරයි.

  සභාපති ධම්මික රනතුංග මහතාගේ කාර්යභාරය වන්නේ ආයතනයේ කාර්යක්ෂමතාව සහ ව්‍යාපාර කාර්යයන් පවත්වා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබාදීමත්, සහ විධායක නොවන සහ විධායක අධ්‍යක්ෂවරු අතර සම්බන්ධතාවයේ අවංකකම සහ ඵලදායිත්වය සහතික කිරීමයි.

  කළමනාකාර අධ්‍යක්ෂ, සංජීව විජේරත්න මහතාගේ කාර්යභාරය වන්නේ ක්‍රමෝපායික මඟ පෙන්වීම, ප්‍රතිපත්ති සකස් කිරීම. වරින් වර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ක්‍රියාපටිපාටිය මත පදනම් වී ආයතනයේ එදිනෙදා කටයුතු කළමනාකරණය කිරීමයි.

  CPSTL හි මෙහෙයුම් උපවර්ගවලට බෙදිය හැකි අතර ඒවානම් කොලොන්නාව ස්ථාපනයේ මෙහෙයුම්, මුතුරාජවෙල පර්යන්තයේ මෙහෙයුම්, කොළඹ වරායේ ඉන්ධන පහසුකම් කාර්යාලයේ මෙහෙයුම් සහ දිවයින පුරා ලංකා තොග ගබඩාවල මෙහෙයුම්ය. මුතුරාජවෙල පර්යන්තයේ මෙහෙයුම් පර්යන්ත කළමනාකරු ( මුතුරාජවෙල) විසින් මෙහෙයවයි. මෙහෙයුම් කළමනාකරු (අක්වෙරළ මෙහෙයුම්) කොළඹ වරායේ ඉන්ධන පහසුකමේ ප්‍රධානියා වේ. ලංකා තොග ගබඩා සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) ගේ අධීක්ෂණය යටතේ ගබඩා අධිකාරී විසින් මෙහෙයවනු ලබයි.

- **අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ පැමිණීම්**
  විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පවත්වනු ලබන අතර විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අවශ්‍ය විට සහ වේලාවේදී කැඳවනු ලැබේ. ජ්‍යේෂ්ඨ කළමනාකරුවන් ආරාධනාවන් මත රැස්වීම්වලට සහභාගි වේ.

  අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් විධිමත් න්‍යාය පත්‍රයක් මත පවත්වන අතර අධ්‍යෂවරුන් වෙත රැස්වීම්වලට පෙර ආයතනික කළමනාකරණය විසින් අදාළ සම්පූර්ණ පසුබිම් තොරතුරු ලබා දේ. 2017 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12ක් පැවති අතර 2017 වසර තුළ එක් අතිවිශේෂ රැස්වීමක් පවත්වා ඇත.

මෙම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම පහත වගුවේ දැක්වේ;

| | | පැමිණීම | |
|---|---|---|---|
| | අධ්‍යක්ෂවරයාගේ නම | සාමාන්‍ය රැස්වීම | විශේෂ රැස්වීම |
| 1 | ඩී.සී. ෂෙහාන් සෙනෙවිරත්න මහතා | 04/04 | |
| 2 | ටී.ජී. ජයසිංහ මහතා ෆ | 01/02 | |
| 3 | ඉෂාන් පෙරේරා මහතා | 04/04 | |
| 4 | දුමින්ද රාජපක්ෂ මහතා | 04/04 | |
| 5 | ආචාර්ය ලලිත් ලියනගේ | 04/04 | |
| 6 | නළුන් ප්‍රනාන්දු මහතා ෆ | 01/01 | |
| 7 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය | 11/12 | 01/01 |
| 8 | ශ්‍යාම් බෝරා මහතා | 12/12 | 01/01 |
| 9 | අනූප් ජයින් මහතා | 12/12 | 01/01 |
| 10 | රංජිත් සින් මහතා | 08/12 | |
| 11 | ධම්මික රණතුංග මහතා | 08/08 | 01/01 |
| 12 | සංජීව විජේරත්න මහතා | 08/08 | 01/01 |
| 13 | නිමල් ජයසුන්දර මහතා | 06/08 | |
| 14 | යූ.එන්. ගුණවර්ධන මහතා | 08/08 | 01/01 |

* ටී.ජී. ජයසිංහ මහතා 2017 මාර්තු 06 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂධූරයෙන් ඉල්ලා අස් වූ අතර නළුන් ප්‍රනාන්දු මහතා 2017 මාර්තු 06 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කරන ලදී.

# ආයතනික පාලනය (ඉතිරි කොටස)

- **බලය බෙදීම සහ කමිටු**
  අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වෙන් වූ කරුණුවලට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩලය එහි කමිටු සහ කළමනාකාරිත්වයට බලය බෙදා ඇත.

  යම් විශේෂිත වගකීම් බෙදාහැර ඇති පහත සඳහන් කමිටු මගින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ;

  **ආ) විගණන කමිටුව**
  විගණන කමිටුව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන අතර සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි. විගණන කමිටුව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත කළ සමස්ත පාලන ක්‍රියාවලියහ තුළ ක්‍රියාත්මක වන අතර එහි වගකීම් ඵලදායිව මුදාහැරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ.

  විගණන කමිටුව සාමාජිකයින් 02කින් සමන්විත වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති. විගණන කමිටුවේ සංයුතිය සහ එය විසින් කරගෙන යනු ලබන කාර්යයන් වාර්ෂික වාර්තාවේ පිටු අංක 64 සිට 66 දක්වා ඉදිරිපත් කෙරේ.

  **ආ) තොග සමාලෝචන කමිටුව**
  තොග සමාලෝචන කමිටුව CPSTL කාර්ය මණ්ඩලය සහ CPC සහ LIOC නියෝජිතයින්ගේ සහභාගිත්වය ඇතිව සතිපතා පවත්වනු ලැබේ. තොග තත්ත්වය සමාලෝචනය කරන අතර ඉදිරි මාස තුන සඳහා අවශ්‍යතාවය කලින් සැලසුම් කරනු ලබයි. ආනයනය කළයුතු ප්‍රමාණය මෙරට අනාගත ඉල්ලුම, පිරිපහදු නිෂ්පාදන හැකියාව සහ ටැංකි ගබඩා ධාරිතාව සැලකිල්ලට ගැනීමෙන් පසු හඳුනාගනු ලබයි. විධිමත් සමීප නියාමනය රටතුල බාධා රහිත ඉන්ධන සැපයීම සහතික කිරීමට සංස්ථාවට හැකියාව ඇති කරයි.

  **ඇ) තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව**
  ආයතනයේ ක්‍රමෝපායික අරමුණුවලට සමගාමීව ප්‍රධාන තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති සමාලෝචනය, නියාමනය සහ ප්‍රමුඛ කිරීම සිදුකරන පරිපාලන මණ්ඩලය මෙයයි. මෙම කමිටුව CPC, LIOC හා CPSTL හි සාමාජිකයින්ගෙන් සමන්විත වන අතර සියලුම පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිලාභය සඳහා ප්‍රධාන තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගි වේ. එමෙන්ම CPSTL හි පොදු තොරතුරු තාක්ෂණ කේන්ද්‍රය සංවර්ධනය සහ පවත්වා ගැනීමට ධනාත්මකව දායක වේ.

  **ඈ) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව**
  ප්‍රසම්පාදන කාර්යයන්හි විනිවිදභාවය සහතික කිරීම සඳහා සහ සැපයුම් ප්‍රමාද අවම කිරීමට මෙන්ම මූල්‍යමය වශයෙන් වඩාත් වාසිදායක සහ ගුණාත්මක වශයෙන් සමාගමට වඩාත් හොඳම සේවා සහ සැපයීම් ලබා ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව සහ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව තුළින් නිෂ්පාදන, භාණ්ඩ, වැඩ සහ සේවා මිලදී ගැනීම සඳහා ජාතික ප්‍රසම්පාදන ආයතනය විසින් නිකුත් කළ මාර්ගෝපදේශ සමාගම අනුගමනය කරයි.

  මෙම කමිටුව CPSTL හි සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ විසින් මෙයෙවනු ලබන අතර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මෙහෙයුම් සහ ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යංශයේ නියෝජිතයින්ගෙන් සමන්විත වේ.

- **තොරතුරු කරා ප්‍රවේශය**
  විගණන කමිටුව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන අතර සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි. විගණන කමිටුව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත කළ සමස්ත පාලන ක්‍රියාවලිය තුළ ක්‍රියාත්මක වන අතර එහි වගකීම් ඵලදායිව මුදාහැරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ.

  අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුවත් තීරණ ගැනීම සඳහා, අධ්‍යක්ෂ මණ්ඩලය එක් එක් රැස්වීමකදී සම්පූර්ණ සහ නිවැරදි තොරතුරු කලින්ම ලබා දෙන අතර එයට න්‍යාය පත්‍රය, වාර්තා, අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා, චක්‍රලේඛ, මූල්‍ය සහ මෙහෙයුම් කාර්යසාධන වාර්තා සහ කාලීන යාවත් කිරීම් ඇතුළත්ය. යම් අමතර තොරතුරු අවශ්‍ය විට සහ අවස්ථාවේදී ඕනෑම අධ්‍යක්ෂවරයෙකුට ඉල්ලා සිටිය හැකිය. අධ්‍යක්ෂවරු ඔවුන්ගේ වගකීම් ඉටු කිරීම ඇවෑමෙන් බාහිර වෘත්තීමය උපදෙස් සඳහා ප්‍රවේශය ඇත.

## 3. සහතික කිරීම සහ පාලනය

- **මූල්‍ය වාර්තාකරණය**
  මූල්‍ය ප්‍රකාශ සත්‍ය සහ සැබෑ ලෙස ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිමට බැඳී සිටී. මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති එනම් ශ්‍රීලංමූවාප්‍ර වලට (SLFRS) අනුකූලව සකස් කරනු ලබන අතර විගණන කමිටුව විසින් මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත්කිරීමට පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, යෝග්‍යතාවය සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම් සහ වැදගත් තීන්දුමය කරුණුවලට අනුකූලවීම ඇතුළුව කළමනාකරණය සහ බාහිර විගණකවරුන් සමඟ සමාලෝචනය කර සාකච්ඡා කර ඇත.

- **විනිවිදභාවය සහ අනුකූලතාව**
  සියලුම ගනුදෙනුවලදී විනිවිදභාවය පවත්වා ගැනීමට සහ නීති හා රෙගුලාසිවලට අනුකූලවීම සහතික කිරීමට මෙන්ම සදාචාර ප්‍රමිති, කම්කරු හා මානව හිමිකම්, සහ සමාගමේ ප්‍රතිපත්ති ආරක්ෂා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගකිමට බැඳී සිටී.

  - 1961 අංක 28 දරන ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථා පනත සහ 1971 අංක 39 දරන මූල්‍ය පනතේ විධිවිධානවලට අනුකූලව සමාගමේ අභ්‍යන්තර පාලන ක්‍රමය සැලසුම් කෙරේ.
  - 1971 අංක 39 දරන මූල්‍ය පනතට අනුකූලව, විගණකාධිපති විසින් ආයතනයේ අභ්‍යන්තර විගණනය සිදුකරන අතර මූල්‍ය ප්‍රකාශ වාර්ෂිකව ප්‍රකාශයට පත්කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරයි.
  - වගවීම සහතික කිරීම සඳහා, ආයතනය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ අනෙකුත් අදාළ රෙගුලාසිවලට අනුකූල වේ.

# ආයතනික පාලනය (ඉතිරි කොටස)

- **අභ්‍යන්තර පාලනය**
  ඵලදායිතාවය අත්කරගැනීම සහ මෙහෙයුම්වල කාර්යක්ෂමතාව, මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසීබව සහ අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූල බව සහ අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් සාධාරණ සහතික කිරීම ලබාදීමට යහපත් සහ ඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රමයක් විධිමත් ලෙස ස්ථාපිත කර පවත්වාගෙන යන බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ. ඉන් මූල්‍ය සහ ගිණුම්කරණ තොරතුරුවල අවංකකම තහවුරු කරන අතර, මෙහෙයුම් සහ ලාභදායිතා ඉලක්ක සපුරාලමින් ආයතනය තුළ කළමනාකරණ ප්‍රතිපත්ති බාධා රහිතව ඉදිරියට යාමට ඉඩ සලසයි. යම් අභ්‍යන්තර පාලන ක්‍රමයක් මගින් සාධාරණ සහතික කිරීමක් පමණක් නොව සාධාරණ කාලසීමාවක් තුල දෝෂ සහ අක්‍රමිකතා ඉදිරිපත් කර සොයා අනාවරණය කරන බවද සහතික කරනු ලබන බව සඳහන් කිරීම වැදගත්ය.

  අභ්‍යන්තර විගණන කාර්යය විසින් ආයතනය CPSTL හි ස්ථාපිත අභ්‍යන්තර පාලන ක්‍රමය තුළ කාර්යක්ෂමව ක්‍රියාත්මක වන බව සහතික කරයි.

- **අභ්‍යන්තර විගණනය**
  අභ්‍යන්තර විගණනය අභ්‍යන්තර විගණන අංශය විසින් පවත්වාගෙන යන අතර එය කළමනාකාරිත්වයෙන් ස්වාධීන වේ. අභ්‍යන්තර විගණනයක පරමාර්ථය වන්නේ ආයතනයක සියලුම කටයුතු තුළ දැඩි පාලනය තබා ගැනීමයි. කළමනාකාරිත්වයට මූල්‍ය වාර්තාවල සත්‍යතාවය සහ ආයතනයේ මෙහෙයුම්වල කාර්යක්ෂමතාවය සහතික කිරීම අවශ්‍ය වේ. අභ්‍යන්තර විගණනයක් මෙම කරුණු දෙක ස්ථාපිත කිරීමට සහය වේ. ඒ තුළින් විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් දක්වා ඇති ක්‍රියාපටිපාටි, නීති සහ රෙගුලාසිවලට අනුකූලව ආයතනය තුළ පවත්වා ගන්නා බව සහතික කරයි.

  අභ්‍යන්තර විගණන අංශයේ විෂයපථය පහත පරිදි වේ;

  - සියලුම ව්‍යාපාර ගනුදෙනු සඳහා පවත්නා නීති සහ රෙගුලාසිවලට අනුකූලව ක්‍රියාත්මක කිරීමට පෙර විධිමත්ව බලය ලබා දෙන බව සහතික කිරීම.
  - කාර්යක්ෂම කළමනාකරණය සඳහා සියලුම ගිණුම්කරණ තොරතුරු SAP හි විධිමත්ව වාර්තාකරන බව මෙන්ම මූලික වාර්තා නිවැරදිව පවත්වාගන්නා බව සහ අදාළ සංඛ්‍යාලේඛන සහ පාලන දත්ත විධිමත්ව සැලසුම් කරන බව සහතික කිරීම.
  - මූල්‍ය ගිණුම්කරණ ප්‍රකාශවලින් ආයතනයේ සත්‍ය සහ සැබෑ තත්ත්වය අනාවරණය කරන බව සහතික කිරීම.
  - දැනට ක්‍රියාත්මක අභ්‍යන්තර පාලන ක්‍රමයේ කාර්යක්ෂමතාව තක්සේරු කිරීම.
  - සමාලෝචනය සහ ඇගයීම සඳහා පද්ධති පදනම් ප්‍රවේශය යොදා ගැනීම;

- දෙපාර්තමේන්තුව විසින් කරගෙන යන වැඩසටහන් සහ අනෙකුත් මෙහෙයුම්වල ප්‍රමාණය ඇගයීමට කළමනාකාරිත්වය විසින් භාවිතා කරන මිනුම් ඇතුළුව දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් පාලනය කිරීමට අදහස් කරන සියලුම පද්ධති සහ ක්‍රියාපටිපාටිවල සැලැස්ම සහ මෙහෙයුම ප්‍රතිපත්ති පරමාර්ථ අත්කර ගැනීමේදී සාර්ථක වී ඇත.
- නීතිකරණ සහ දක්වා ඇති වෙනත් අවශ්‍යතා සහ කළමනාකරණ සැලසුම්, ක්‍රියාපටිපාටි සහ ප්‍රතිපත්තිවලට අනුකූලතා මට්ටම.
- වත්කම් අත්කර ගැනීම, බැහැරකිරීම සහ ආරක්සා කිරීම සහ වංචාව, දුරාචාරය සහ අක්‍රමිකතාවලින් ඇතිවන පාඩු ඇතුළුව අලාභවල පොළිය.
- වත්කම් ආර්ථික සහ කාර්යක්ෂමව භාවිතා කිරීම සහ නාස්තිය අවම කිරීම සඳහා වැඩපිළිවෙල.
- තීරණ ගැනීම සඳහා සහ වගවීම සඳහා ලබාදෙන තොරතුරුවල ප්‍රමාණවත්බව, විශ්වාසීබව සහ අවංකකම සහ මෙම තොරතුරු භාවිතා කරන ප්‍රමාණය.

# අවදානම් කළමනාකරණය

යහපත් අවදානම් කළමනාකරණ පරිචයන් දිගුකාලින වර්ධනය සඳහා තීරණාත්මක බව CPSTL දැඩිව විශ්වාස කරයි. සමාගමේ පරමාර්ථය වන්නේ අඛණ්ඩතා පැවැත්මක් ලෙස මෙහෙයුම්වලට අහිතකරව බලපෑ හැකි සියලූම සාධක ඉහලයාමේ සහ පහළයාමේ හැකියාව සැලකිල්ලට ගනිමින් ආයතනයේ සියලූම කටයුතු සඳහා උපරිම තිරසාර වටිනාකමක් එකතු කිරීමයි. අවදානම් කළමනාකරණය අඛණ්ඩ සහ සංවර්ධන ක්‍රියාවලියක් වන අතර එය ආයතනික ක්‍රමෝපාය සහ එහි ක්‍රියාත්මක කිරීම තුළ වැදගත් භූමිකාවක් ඉටු කරයි.

අවදානම් කළමනාකරණ ක්‍රමෝපාය සමාගමේ ආයතනික පාලනය, කළමනාකණ තීරණ සහ ව්‍යාපාර ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය කොටසකි. ඒකාබද්ධ අවදානම් කළමනාකරණය ඉහළ සිට පහළ දක්වා මෙහෙයුම්වල ඵලදායි ක්‍රියාකාරිත්වය සඳහා වැදගත් වේ. ව්‍යාපාර සැලසුම් කිරීම සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියට අවදානම් කළමනාකරණ වැඩසටහන් ඇතුළත් කිරීම තුළින් සැලසුම් කිරීම, වාර්තාකරණය.විගණනය සහ කළමනාකරණ තොරතුරු පද්ධති අතර ඵලදායි ඒකාබද්ධ කිරීමක් ලබා දෙනු ඇත.

## අවදානම් කළමනාකරණ රාමුව

මූලික මූලධර්ම සහ සංකල්ප, පැහැදිලි උපදෙස් සහ මඟපෙන්වීම ලබාදෙන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවක අවශ්‍යතාව වර්තමාන ගතික ව්‍යාපාර පරිසරය තුළ වඩාත් වැදගත් දෙයක් බවට පත්ව ඇත. සමාගම හුරුපුරුදු අවදානම් පමණක් නොව ප්‍රමාණනය කිරීමට පහසු සියලූම අවදානම් සහ ඒවායේ මැදිහත්වීම් කළමනාකරණයේ වැදගත්කම හඳුනාගෙන ඇත. දක්නට ඇති පරිදි නොසැලකියයුතු අවදානම් විශාල හානියක් කිරීම සඳහා අනෙකුත් සිදුවීම් සහ තත්ත්වයන් හා සම්බන්ධවිය හැකි බැවින් ඒවාද සැලකිල්ලට ගනී.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණයේ පාදක පරිශ්‍රය වන්නේ සෑම සමාගමක්ම එහි පාර්ශ්වකරුවන්ට වටිනාකම නිර්මාණය කිරීම සඳහා මෙහෙයුම් සිදු කිරීමයි. ඒකාබද්ධ අවදානම් කළමනාකරණය වටිනාකම් නිර්මාණය කිරීමේ හැකියාවන් වර්ධනය කරමින් අවිනිශ්චිත සහ ආශ්‍රිත අවදානම සහ අවස්ථාව පිළිබඳ ඵලදායි ආකාරයෙන් කටයුතු කිරීමට කළමනාකරණයට ඉඩප්‍රස්ථාව ලබා දේ. අවදානම් කළමනාකරණයේ අවසන් අරමුණ වන්නේ අවදානම් කළමනාකරණයේ පිරිවැය දරන අවස්ථාවේ සිදුවියහැකි අවදානම් ප්‍රදාන හුවමාරුකර ගැනීම තුළනය කිරීමයි.



# අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)

අවදානම කළමනාකරණය කිරීමේ ක්‍රමෝපායට අන්තර්ගතය ස්ථාපිත කිරීම, අවදානම් හඳුනාගැනීම, විශ්ලේෂණය, ප්‍රමාණනය සහ අවදානම් ඒකාබද්ධ කිරීම සහ අවදානම් ප්‍රමුඛ කිරීම සහ අවදානම්වලට ප්‍රතිකාර කිරීම ඇතුළත්ය.

## අවදානම් රුචිය

අවදානම කළමනාකරණය කිරීමේදී, සමාගමේ අවදානම් රුචිය සහ අවදානම් සහනය ස්ථාපිත කිරීම නැතිවම බැරි වැදගත්කමකි. අවදානම් රුචිය යනු ආයතනයක් වටිනාකමින් උකහාගැනිමට කැමැත්තක් දක්වන හෝ ආයතනයක් එහි පරමාර්ථ අත්කර ගැනීමේදී පිළිගැනිමට සූදානම් වටිනාකමයි. අවදානම සහනය යනු විශේෂිත පරමාර්ථයක් අත්කර ගැනීමට අදාළ සහ අදාළ පර්මාර්ථය මැනිමට භාවිතා කරමින් සැමවිටම මනිනු ලබන පිළිගතහැකි විචල්‍ය මට්ටමයි.

කළමනාකරණය විසින් අවදානම් සහන සමඟ හඳුනාගත් විශේෂ තුළින් අවදානම් රුචිය සමඟ අනුරූපවීම සඳහා ආයතනයේ කටයුතු නියාමනය කරයි. අවදානම් සහය සමාගමේ කාර්යසාධනය ඇගයීම සඳහා නියාමන ක්‍රියාවලියට ඒකාබද්ධ කෙරේ. වසර තුළ, අවදානම් සහන ව්‍යාපාර වර්ධනය සහ ක්ෂේත්‍රයේ ගැටළු සලකා බලමින් යාවත් කරන ලදී.

## අවදානම් පාලනය

අවදානම් රුචිය සැකසීම, අවදානම් ක්‍රමෝපාය සන්නිවේදනය සහ අවදානම් ඵලදායි ලෙස කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිපත්ති අනුමත කිරීම සඳහා වගකිම අවසාන වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ.

සමාගමේ කළමනාකරණ කණ්ඩායම ආයතනයේ අවදානම් කළමනාකරණ දර්ශනයට සහයවෙමින් එහි අවදානම් රුචි සමඟ අනුකූලතාව ප්‍රවර්ධනය කරමින් සහ වැලැක්වීමේ ප්‍රති ක්‍රියාමාර්ග සමඟ තම වගකීම් විෂයපථය තුළ අවදානම් කළමනාකරණය කරයි.

## අපගේ ව්‍යාපාරයට ආවේණික අවදානම්

*දුෂ්කර ප්‍රාග්ධන බැඳීම් සහ පුද්ගලික පඩිනඩි, පොදු කාර්යය සහ නඩත්තු වියදම් ගෙවීම හේතු කොට ගෙන මෙහෙයුම්වලින් ප්‍රමාණවත් මුදල් අපට නොතිබිය හැකිය.*

අපගේ කොටස් ප්‍රාග්ධනය මත අපට බෙදාහැරිය හැකි ප්‍රමාණය අපගේ මෙහෙයුම්වලින් අප උපයන ප්‍රමාණය මත රඳා පවතින අතර එය පහත කරුණු මත පදනම් වි කලින් කල වෙනස් විය හැකිය :

- අප මෙහෙයවන ඛණිජ තෙල් නිෂ්පාදනවල පරිමාවන්;
- අප මෙහෙයවන පරිමාවන් සම්බන්ධයෙන් පර්යන්ත සහ ගබඩා කිරීමේ ගාස්තු;
- ගංවතුර, ගිනි, අහිතකර කාලගුණය. පිපිරීම් සහ වෙනත් යම් ස්වභාවික ආපදා සහ ත්‍රස්තවාදි ක්‍රියා මගින් ඇතිකරන නල මාර්ග පහසුකම්, අදාළ උපකරණ සහ අවට දේපලවලට සිදුවන හානි;
- මානව ක්‍රියා හෝ වෙනත් ආකාරයකින් පරිසරයට නිෂ්පාදන හෝ වෙනත් අමුද්‍රව්‍ය අහඹු ලෙස කාන්දුවීම;



# අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)

- පවත්නා ආර්ථික සහ වෙළෙඳපොල කොන්දේසි;
- අපගේ ලැබීම් එකතුකිරීමේදී දුෂ්කරතා;
- අලුත් හෝ ව්‍යාප්ත සෞඛ්‍ය, පාරිසරික සහ ආරක්ෂක රෙගුලාසිවල බලපෑම්;
- අප ක්‍රියාත්මක වන කර්මාන්තය පිළිබඳ රජයේ නියාමනය වෙනස්වීම් ඇතුළුව රජයේ නියාමනය;
- බදු නීතිවල වෙනස්වීම්;
- කාලගුණ තත්ත්වයන්; සහ
- මැඩලිය නොහැකි බලය.





***අපගේ පර්යන්තවල අප ඉටුකරන පහසු පිරිපහදු නිෂ්පාදන, දැඩි පිරිපහදු නිෂ්පාදන, බොර තෙල් සහ අනෙකුත් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ඉල්ලුම මත අපගේ මූල්‍ය ප්‍රතිඵල රඳා පවතී. අනෙකුත් සාධක සහ පොදුවේ ආර්ථිකය පහතවැටීම දරාගතහැකි කාලසීමාවක් සඳහා මෙම නිෂ්පාදනවල පහත් ඉල්ලුමකට හේතු විය හැක.***

අපගේ පර්යන්ත මගින් සේවය කරන වෙළෙඳපොල තුළ පහසු පිරිපහදු නිෂ්පාදන, දැඩි පිරිපහදු නිෂ්පාදන, බොර තෙල් සහ අනෙකුත් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ඉල්ලුමේ යම් දරාගතහැකි අඩුවීම අපගේ පර්යන්තවල ගබඩා භාවිතය තුළ සැලකියයුතු අඩුවීමකට හේතු වන අතර, එය අපගේ මුදල් ප්‍රවාහය සහ අපගේ කොටස්කරුවන් දෙදෙනා වෙත බෙදාහැරීම් සිදුකිරීම සඳහා අපගේ හැකියාව අඩුකරනු ඇත.

2017 අවසාන කාර්තුවේ ආරම්භ වූ සහ 2018 දක්වා පැවති පහසු පිරිපහදු නිෂ්පාදන, දැඩි පිරිපහදු නිෂ්පාදන මිලගණන්වල සැලකියයුතු අඩුවීම ඇතුළුව දිවයින තුළ අවිනිශ්චිත සහ වෙනස්වන ආර්ථික තත්ත්වයන් අපගේ මූල්‍ය ප්‍රතිඵලවලට බලපානු ලැබිය හැකිය.

ආර්ථික සහ වෙළෙඳපොල තත්ත්වයන් අවිනිශ්චිතව පවතීනම් හෝ අහිතකර තත්ත්වයන් ඇත්නම්, පැතිරීම හෝ තවදුරටත් පිරිහේනම්, අපගේ ව්‍යාපාරය. මූල්‍ය තත්ත්වය සහ මෙහෙයුම්වල ප්‍රතිඵල කෙරෙහි වැදගත් බලපෑමකට අපට මුහුණ දීමට සිදුවිය හැකිය.

***අපගේ මෙහෙයුම් ප්‍රමාණවත් ලෙස රක්ෂණය කළ නොහැකි ගංවතුර, නායයාම් හෝ දැඩි කුණාටුවලින් ඇතිවන බාධාවන් ඇතුළුව මෙහෙයුම් උවදුරු සහ දැකිය නොහැකි බාධාවන්ට යටත් වේ.***

අහිතකර කාලගුණය. අනතුරු, ගිනි, පිපිරීම්, උවදුරු කාරක මුදුහැරීම්, යාන්ත්‍රික දෝෂ, සැපයුම් යටිතල වල බාධාවන්, මනා සංවිධාන සහ අපගේ පාලනයේ නොමැති සාධකවලින් අපි පිඩාවට පත්විය හැකිය. 2017 වසර තුළ, මුතුරාජවෙල පර්යන්තයේ SPBM සහ මෙහෙයුම්වල හානි වු සබ්මැරීන් නල නැවත සකස් කිරීම සිදුකරන අවස්ථාවේදී දින 02ක් බාධා වි ඇත. මෙවැනි යම් සිදුවීමක් සිදුවුයේනම් දේපල සහ උපකරණවල බරපතල හානිය සහ විනාශවිම සහ දූෂණය හෝ අපගේ ආශ්‍රිත නිෂ්පාදනවල කඩාවැටිම හෝ අත්හිටුවීමෙ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන වෙනත් පාරිසරික හානි නිසා අපට අමතර අලාභ දැරීමට සිදුවේ.



අපි අපගේ ව්‍යාපාරයේ සියලුම අවදානම් සිදුවිම් රක්ෂණය කර ඇත. එමෙන්ම, සාධාරණ අනුපාතවලට අප කැමති වර්ගයේ සහ ප්‍රමාණයේ රක්ෂණ පවත්වාගැනීමට හෝ තබාගැනිමට අපි අසමත් විය හැකිය. වෙළෙඳපොල තත්ත්වයන් හි ප්‍රතිඵලයක් ලෙස, අපගේ රක්ෂණ ඔප්පුවල සත්‍යතාව සඳහා වාරික සහ අඩුකිරීම් වැඩිවි ඇති අතර තවදුරටත් ඉහල යා හැකිය. ඊට අමතරව, උප-සීමා සමහර අවදානම් සඳහා පනවනු ලැබ ඇත. සමහර අවස්ථාවලදී, සමහර රක්ෂණ ලබාගත නොහැකි බවට පත්විය හැකිය නැතිනම් ආවරණයෙන් අඩුකළ ප්‍රමාණයක් පමණක් ලබාදිම සිදුවිය හැකිය. අපි සම්පූර්ණයෙන් රක්ෂණය නොකිරීම සඳහා අපට සැලකියයුතු වගකිමක් දැරීමට සිදුවුයේනම්. එය අපගේ මූල්‍ය තත්ත්වයට වැදගත් අහිතකර බලපෑමක් ඇතිකළ හැකි අතර එය මෙහෙයුම් සහ මුදල් ලබාගැනීමේ හැකියාවට ද බලපායි.

***අවම මිලකට සමාන කළහැකි ගබඩා පහසුකම් සමග අපගේ පාරිභෝගිකයින්ට සැපයිමට හැකි වන අනෙකුත් පර්යන්ත සමාගමවලින් තරගය අපගේ මූල්‍ය තත්ත්වය සහ මෙහෙයුම්වල ප්‍රතිඵලවලට බලපායි.***

# අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)

CPSTL හි කොටස්හිමියන් දෙදෙනා වන අනෙකුත් පර්යන්ත සමගම් (CPC හා LIOC) වලින් ඇතිවන තරඟයට අපි මුහුණ දෙමු.

***අපගේ පවත්නා වත්කම්වල පුළුල්වීම සහ නව වත්කම් ඉදිකිරීම ආදායම් වැඩිවීම්වලට හේතු වන අතර අපගේ මෙහෙයුම් සහ මූල්‍ය තත්ත්වයට අහිතකර ලෙස බලපෑ හැකි නියාමනය, පරිසරය, දේශපාලන, නෛතික හා ආර්ථික අවදානම්වලට යටත් වේ.***

මෙහෙයුම් සහ ස්ථායිතාව වර්ධනය කර වැඩිකිරීම සඳහා අපගේ ක්‍රමෝපායේ කොටසක් පවත්නා වත්කම් පුළුල් කිරීමට සහ අමතර වත්කම් ඉදිකිරීමට ඇති අපගේ හැකියාව මත රඳා පවතී. ගබඩා පහසුකම වැඩිකිරීම හෝ වෙනත් ආකාරයක වැඩිවීම මගින් වැනි දැනට පවත්නා පර්යන්තයක් පුළුල්කිරීම අපගේ පාලනයෙන් තොර පවත්නා නියාමනය, පරිසරය, දේශපානය සහ නෛතික අවිනිච්චිතතා ගණනාවක් හා සම්බන්ධ වේ. එමෙන්ම, ව්‍යාපාති සඳහා සහයවීමට අවශ්‍ය ආදායම ලබාදිමට CPSTL හි කොටස්හිමියන් දෙදෙනා වන අලෙවිකරණ සමාගම් දෙකෙන් ප්‍රමාණවත් දිගුකාලීන උපකාරී බැඳිම් අප වෙත නොලැබිය හැක. එහි ප්‍රතිඵලයක් ලෙස, අපගේ අපේක්ෂිත ආයෝජන ඵලදාව අත්කරගැනිමට ප්‍රමාණවත් ඉල්ලුම ආකර්ෂණය කර ගැනීමට නොහැකි නව පහසුකම් අපට ඉදිකළ හැකි අතර එය අපගේ මූල්‍ය තත්ත්වය සහ මෙහෙයුම් ප්‍රතිඵල කෙරෙහි සහ අපගේ ඒකක හිමිකරුවන් වෙත බෙදාහැරීම් සිදුකිරීමට අපට ඇති හැකියාව කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකිය.

අපි මෙවැනි ව්‍යාපාති භාරගන්නේනම්, ඒවා කාලසටහනට අනුව නිම කළ නොහැකි වන අතර නැතිනම් අයවැය පිරිවැය කොහෙත්ම නොහැකි වනු ඇත. එවැනි ව්‍යාපෘති සහය සඳහා අවශ්‍ය ආදායම ලබාදීමට CPSTL හි කොටස්හිමියන් දෙදෙනා වන අලෙවිකරණ සමාගම් දෙකෙන් ප්‍රමාණවත් දිගුකාලීන උපකාරී බැඳිම් අප වෙත ලැබුනද සහ සැලසුම් පරිදි අපගේ ඉදිකිරීම් ව්‍යාපාති අප සම්පූර්ණ කරනු ලැබුවද, දීර්ඝ කල කාලසීමාවක් සඳහා ආදායම තුළ වැඩිවීමක් අපට ලබාගත නොහැකි වනු ඇත.

උදාහරණයක් ලෙස, අප නව ටැංකි ගොඩ නගන්නේනම්, ඉදිකිරීම සාමාන්‍යයෙන් මාස 12 සිට 24 දක්වා දීර්ඝ කාලසීමාවක් පුරා සිදුවන අතර ව්‍යාපාතිය අවසන් කරන තුරු ආදායම තුළ සැලකියයුතු වැඩිවීමක් අපට නොලැබේ. මෙවැනි වාතාවරණ අපගේ මූල්‍ය තත්ත්වය සහ මෙහෙයුම් ප්‍රතිඵල කෙරෙහි මෙන්ම ලාභ ඉපයීමට අපට ඇති හැකියාව කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැක.

***අපගේ මෙහෙයුම් නිෂ්පාදන තත්ත්ව පිරිවිතරවලට අදාළ වන නෛතික සහ ශ්‍රී ලංකා නීති සහ රෙගුලාසිවලට යටත් වන අතර සමහර තත්ත්ව පිරිවිතර සපුරාලීමට අපි බෙදාහරින නිෂ්පාදනවල දෝෂයක් ප්‍රතිඵලයක් ලෙස අපගේ වෙළෙන්ඳන් විසින් අපට එරෙහිව ඉල්ලා සිටින අලාභවලටස අප යටත් විය හැකිය.***

විවිධ නෛතික සහ ශ්‍රී ලංකා පිරිපහසු නිෂ්පාදන සඳහා බලධාරීන් විස්තර කරන විශේෂිත නිෂ්පාදන තත්ත්ව පිරිවිතරවලට වාෂ්ප පීඩනය, සල්ප අන්තර්ගතය, එතනෝල් අන්තර්ගතය සහ බයෝ ඩීසල් අන්තර්ගතය ඇතුළත්ය. නිෂ්පාදන තත්ත්ව පිරිවිතර සහ සම්මිශ්‍රණ අවශ්‍යතාවන්හි වෙනස්වීම් අපගේ පර්යන්තයන් හී අපගේ නිෂ්පාදන අඩුවිය හැති අතර, අමතර මෙහෙයුම් පිරිවැය දැරීමට හෝ ප්‍රාග්ධන වියදම් දැරීමට සිදුවිය හැකිය.



# අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)

වර්ධිත ආදායම් තුළින් මෙම පිරිවැය ආවරණය කිරීමට අපට නොහැකි වන්නේනම්, අපගේ මුදල් ප්‍රවාහ පහසුවෙන් මෙහෙයුම් කිරීමේ අපගේ හැකියාවට අහිතකර ලෙස බලපෑ හැකිය. අපගේ මෙහෙයුම්වලට අනුරූප නිෂ්පාදන තත්ත්ව නීති කඩකිරීම් සැලකියයුතු දඩමුදල් සහ දණ්ඩනවලට මෙන්ම සෘණාත්මක ප්‍රසිද්ධියට යටත් විය හැකිය. අපගේ ගබඩා ටැංකිවලදී පටවන නිෂ්පාදනවල තත්ත්වය සහ පවිත්‍රතාව සහතික කිරීමට අපට වගකීමක් ඇත. ජනතාවගේ භාවිතය සඳහා බෙදාහරින ලද පිරිවිතරවලින් පරිබාහිර නිෂ්පාදනය විශේෂිත නිෂ්පාදන නිති කඩකිරීමක් සිදුනොවූද, දුර්වල එංජින් කාර්යසාධනයට හෝ එංජිමට හානිවීම සඳහා හේතු විය හැකිය. මෙම වර්ගයේ සිදුවීමක් පිරිවිතරවලින් පරිබාහිර නිෂ්පාදන මගින් ඇතිවියහැකි අලාභ සම්බන්ධයෙන් හිමිකම් වගකීමක් ඇතිවිය හැකිය නැතිනම් සෘණාත්මක ප්‍රසිද්ධියට හේතුවිය හැකිය. මෙම දෙකෙන් කුමක් සිදුවුවද, අපගේ මෙහෙයුම් සහ මූල්‍ය ප්‍රවාහ ප්‍රතිඵල කෙරෙහි අහිතකර බලපෑම් ඇති කළ හැකිය.

CPSTL ට ඕනැම වර්ගයක ඛණිජ තෙල් ඉන්ධන පරීක්ෂා කිරීම සඳහා නවින රසායනාගාරයක් සතු වන අතර දැඩි තත්ත්ව පාලන යාන්ත්‍රණ සහ නියාමනය සහ සහතික කිරීම සඳහා අනුකූලතාවය අනුගමනය කරයි.

***අපගේ පර්යන්ත පහසුකම් සහ ගබඩා වත්කම බොහෝ ප්‍රමාණයක් දශක කිහිපයක් තුළ සේවයේ යොදවනු ලැබ ඇති අතර එය වර්ධනය වන නඩත්තු සහ නැවත සකස් කිරීමේ වියදම්වලට හේතු වේ. මෙය අපගේ ව්‍යාපාරය. මෙහෙයුම් ප්‍රතිඵල, මූල්‍ය තත්ත්වය සහ කොටස්හිමියන් දෙදෙනා වෙත අපේක්ෂිත ප්‍රතිඵල ඇති කිරීමට අපට ඇති හැකියාවට අහිතකර ප්‍රතිඵල ඇති කරයි.***

අපගේ පර්යන්ත පහසුකම් සහ ගබඩා වත්කම් පොදුවේ දීර්ඝ කාලයක් භාවිතාකළ වත්කම් වේ. එහි ප්‍රතිඵලයක් ලෙස, ඒවායින් සමහර වත්කම්



දශක කිහිපයක් සේවයේ යොදවනු ලැබ ඇත. මෙම වත්කම්වල වයස සහ තත්ත්වය වර්ධනය වන නඩත්තු සහ නැවත සකස් කිරීමේ වියදම්වලට හේතු වේ. මෙවැනි වියදම්වල යම් සැලකියයුතු වැඩිවීමක් අපගේ ව්‍යාපාරය. මෙහෙයුම් ප්‍රතිඵල, මූල්‍ය තත්ත්වය සහ කොටස්හිමියන් දෙදෙනා වෙත අපේක්ෂිත ප්‍රතිඵල ඇති කිරීමට අපට ඇති හැකියාවට අහිතකර ප්‍රතිඵල ඇති කල හැක.

සමහර ගබඩා ටැංකි දශක කිහිපයක් පැරණි වුවද, CPSTL විසින් වර්තමාන භාවිත තත්ත්වයට ඒවා ගෙනඒම සඳහා විධිමත් නඩත්තු සහ අලුත්වැඩියාවන් සිදුකර ඇත.

***සංකීර්ණ සහ නිතරම වෙනස්වන පාරිසරික, සෞඛය සහ ආරක්ෂක නීති සහ රෙගුලාසිවලට අනුකූලවීමේ වගකීම සඳහා සැලකියයුතු පිරිවැය සහ වගකීම් අපි දරනු ලැබේ.***

අපගේ මෙහෙයුම් පහසු පිරිපහදු නිෂ්පාදන, දැඩි පිරිපහදු නිෂ්පාදන, බොර තෙල් ප්‍රවාහනය සහ ගබඩා කිරීම හා සම්බන්ධ වන අතර, ඛණිජ තෙල් නිෂ්පාදන රැස්කිරීම, ගබඩා කිරීම, පරිහරණය සහ ප්‍රවාහනය, පරිසරයට අමුද්‍රව්‍ය විමෝචනය සහ මුදාහැරීම, පරම්පාරාව, අපද්‍රව්‍ය කළමනාකරණය සහ බැහැරකිරීම, සහ පරිසරය ආරක්ෂා කිරීමට අදාළ අනෙකුත් කරුණු පාලනය කරන නෛතික, රාජ්‍ය, ප්‍රාදේශිය ආයතන නීති සහ රෙගුලාසිවලට යටත් වේ. අපගේ මෙහෙයුම් වාත්තිය සෞඛ්‍ය සහ ආරක්ෂාවට අදාළ වන්නා වූ විවිධ නීති සහ රෙගුලාසිවලටද යටත් වේ. නෛතික, රාජ්‍ය, ප්‍රාදේශිය ආයතන නීති සහ ක්‍රියාත්මක රෙගුලාසි පිළිබඳ සංකීර්ණ රටාවකට අනුකූලවීම දුෂ්කර වන අතර දූෂණය අවමකිරීම හෝ වැලැක්වීම සඳහා සැලකියයුතු ප්‍රාග්ධන වියදම් සහ මෙහෙයුම් පිරිවැය අවශ්‍ය වේ. එමෙන්ම, අපගේ ව්‍යාපාරය අහඹු ඉහිරීම, මුදාහැරීම හෝ ඛණිජ තෙල් මුදාහැරීම හෝ පරිසරයට හෝ අවට ප්‍රදේශයන්ට හානිදායක සිදුවීම්වලට යටත්වීම ආවේනික ලක්ෂණයක් වන අතර එයට ආයෝජනය කිරීම සහ පිළියම් යෙදීම සඳහා සැලකියයුතු වගකීම් අපට ඇතිවිය හැකිය. අදාළ පාරිසරික, සෞඛ්‍ය සහ ආරක්ෂක නිති සහ රෙගුලාසි සමඟ අනුකූලවීටම අසමත්වීම පරිපාලන, සිවිල් ඇතුළු අවහිරයන්ට තක්සේරු කිරීම හෝ සාපරාධී දණ්ඩන, බලපත් අහෝසිය සහ තහනම් කිරීමේ සීමා පැනවීම හෝ අපගේ මෙහෙයුම් කිහිපයක් හෝ සියල්ල තහනම් කිරීමකට හේතු විය හැකිය.





අනාගතයේදි පනවනු ලබන හෝ බලාත්මක කරන අමතර පාරිසරික, සෞඛ්‍ය සහ ආරක්ෂක රෙගුලාසි හෝ රෙගුලාසි කුමක්ද යන්න හෝ දැනට පවත්නා හෝ අනාගත නීති හෝ රෙගුලාසි අපගේ මෙහෙයුම් සම්බන්ධයෙන් පරිපාලනය කරන හෝ අර්ථ දක්වන අකාරය කුමක්ද යන්න අපට අනාවැකි කිව නොහැක. මෙම නීති හෝ රෙගුලාසිවලින් බොහෝ ප්‍රමාණයක් ක්‍රමයෙන් දැඩි බවට පත්වෙමින් සිටින අතර මෙවැනි අවශ්‍යතාවන්ට අනුකූලතා පිරිවැය කාලයත් සමඟ වැඩිවීම අපේක්ෂා කළ හැකිය. පාරිසරික, සෞඛ්‍ය සහ ආරක්ෂක අනුකූලතාවය සඳහා මෙවැනි වියදම් හෝ පිරිවැය අපගේ මූල්‍ය තත්ත්වය මෙහෙයුම් ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහයට අහිතකර බලපෑම් ඇති විය හැකිය.

# අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)

***අපගේ පහසුකම්වල සිදුවියහැකි දූෂණයට ප්‍රතිචාරාත්මකව සැලකියයුතු පිරිවැය දැරීමට අපට සිදුවිය හැක.***

අපගේ පර්යන්ත පහසුකම් පහසු පිරිපහදු නිෂ්පාදන, දැඩි පිරිපහදු නිෂ්පාදන, බොර තෙල් ප්‍රවාහනය සහ ගබඩා කිරීම සඳහා බොහෝ කාලයක් භාවිතා කොට ඇත. වර්තමානයේ කර්මාන්තය තුළ ප්‍රමිතිය වන මෙහෙයුම් සහ බැහැර කිරීමේ පරිචයන් අපි භාවිතා කරනු ලැබුවත්, හයිඩ්‍රෝකාබන් අපද්‍රව්‍ය වරින් වර ඉහිරීම හෝ මුදාහැරීම හෝ පර්යන්ත දේපල යටතේ සිදුවී තිබිය හැක.

පර්යන්ත දේපල නෛතික, රාජ්‍ය, ප්‍රාදේශිය ආයතන නීති සහ රෙගුලාසිවලට යටත් වන අතර ඉන් සෝදිසි කිරීමේ හෝ පිළියම් කිරීමේ බැඳීමක් බල පවත්වනු ලබන අතර මේවායින් සමහරක් එකට එකතු වී පාරිසරික දූෂණය වැලැක්වීමට සහ ආමන්ත්‍රණය කිරීමට කටයුතු කරයි.

CPSTL විසින් කලින් කල විධිමත් ටෙන්ඩර් ක්‍රියාවලියක් තුළින් ඉන්ධන රොන්මඩ බැහැර කරනු ලබන අතර එහි අපද්‍ය පරිසරයට හානි නොවන බවට සහතික වේ.

***අපගේ විධායක නිලධාරීන් සහ සමහර ප්‍රධාන කාර්ය මණ්ඩලය අපගේ ව්‍යාපාරයට තීරණාත්මක වන අතර මෙම නිලධාරීන් ප්‍රධාන කාර්ය මණ්ඩලය අනාගතයේදී අපත් සමග නොසිටිනු ඇත.***

අපගේ අනාගත සාර්ථකත්වය අපගේ විධායක නිලධාරීන් සහ අනෙකුත් ප්‍රධාන කාර්ය මණ්ඩලයේ සේවය මත රඳාපවතී. මෙම විධායක නිලධාරීන් සහ අනෙකුත් ප්‍රධාන කාර්ය මණ්ඩලයේ සේවාවන් අපට අහිමිවුවහොත්, අපගේ ව්‍යාපාරය, මෙහෙයුම් ප්‍රතිඵල සහ මූල්‍ය තත්ත්වයට හානි විය හැකිය.

සේවකයින් හඳුනාගැනීම, අගයකිරීම සහ ප්‍රශංෂා කිරීම සහිත ශක්තිමත් සේවක වටිනාකම් කොටස තුළින් සේවක අභිප්‍රේරණය පවත්වා ගැනීම සඳහා වෘත්තීමය ප්‍රගතිය සඳහා පුහුණ, සංවර්ධනය සහ අවස්ථාවන් තුළ තවදුරටත් ආයෝජනය කරමු.

CPSTL විසින් සියලුම සේවකයින් සඳහා ශක්තිමත් කාර්යසාධන කළමනාකරණ ක්‍රමයක් තුළින් හඳුනාගත් පුහුණු අවශ්‍යතා ආවරණය කරමින් ව්‍යුහගත පුහුණු වැඩසටහන් තුළින් පුහුණු සහ සංවර්ධනයේ හිඟය අවම කිරීම සිදුකර ඇත.

අභ්‍යන්තර පාලනය පිළිබඳ ඵලදායී ක්‍රමයක් සංවර්ධනය කිරීමට හෝ පවත්වා ගැනීමට අපි අසමත්නම්, අපි අපගේ මූල්‍ය ප්‍රතිඵල කාලීනව සහ නිවැරදිව වාර්තා කිරීමට මෙන්ම CPSTL වෙත සෘණාත්මක බලපෑමක් ඇතිවිය හැකි වංචාව වලක්වා ගැනීමට අපට නොහැකි වනු ඇත.

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි සංශෝධනය යටතේ, අපගේ කාර්තුමය සහ වාර්ෂික වාර්තාවල මූල්‍ය සහ අනෙකුත් තොරතුරු කළමනාකාරිත්වය විසින් සහතික කිරීමේ නීතිය ඇතුළුව පොදු වාර්තාකරණ අවශ්‍යතාවන්ට යටත්විය යුතුව ඇත.

මේ අනුව මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අපගේ අභ්‍යන්තර පාලන ක්‍රමයේ ඵලදායිත්වය පිළිබඳ වාර්ෂික මූල්‍ය වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වේ.

රජයට අයත් සමාගමක් ලෙස මූල්‍ය වාර්තා කාලීනව සහ විශ්වාසී ආකාරයෙක් ලබාදීමට සහ වංචාව වලක්වා මෙහෙයුම් සාර්ථක කර ගැනීම සඳහා ඵලදායි අභ්‍යන්තර පාලනය අපට අවශ්‍ය වේ. අපි ශ්‍රීලංමූවාප්‍ර වලට (SLFRS) අනුකූලව අපගේ මූල්‍ය ප්‍රකාශ අපි පිළියෙල කරමු. අපගේ අභ්‍යන්තර පාලනය සංවර්ධනය කර පවත්වා ගැනීම සඳහා අපගේ උත්සාහයන් සාර්ථක නොවිය හැකි අතර අනාගතයේදී අපගේ මූල්‍ය ක්‍රියාවලිය සහ වාර්තාකරණය ඵළදායි ලෙස පවත්වා ගෙන යමින් පාලනය කිරීමට හෝ නියාමන අනුකූලතාවන්ට අපගේ බැඳීම සමඟ අනුකූලවීමට අපට නොහැකි වනු ඇත.

කාර්තුමය පදනමක් මත අපගේ අභ්‍යන්තර පාලනය සහ ක්‍රියපටිපාටි තුළ සිදුකරන වෙනස්වීම් අප විසින් අනාවරණය කිරීම අවශ්‍ය වන අතර මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අපගේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වාර්ෂික ඇගයීමක් අපි සිදු කළෙමු.

CPSTL විසින් රාජකාරී බෙදීමේදී ඇති අවදානම් අවම කිරීමට, තෙවැනි පාර්ශ්වයන්ගේ වාර්තා සමාලෝචනය කර සැසැඳීමට ස්ථාන පරීක්ෂණ සහ නැවත ගණනය කිරීමට මෙන්ම සේවකයින් සඳහා ප්‍රවේශ අයිතිය සහ පුහුණුව නියාමනය කිරීමට අභ්‍යන්තර පාලන යාන්ත්‍රණ ක්‍රියාත්මක කොට ඇත.

අපගේ පහසුකම් හෝ අවට ප්‍රදේශ අරමුණු කළ ත්‍රස්තවාදි ප්‍රහාර අපගේ ව්‍යාපාරයට අහිතකර ලෙස බලපාන ලදී.

පර්යන්ත දෙක සහ දිවයින පුරා ගබඩා රටතුළ බලශක්ති වත්කම්වලට ක්‍රමෝපායික වැදගත්කමකි, විශේෂයෙන් කොලොන්නාව සහ මුතුරාජවෙල පර්යන්ත යටිතල පහසුකම් ත්‍රස්තවාදි සංවිධානවල අනාගත ඉලක්ක විය හැක. අපගේ පහසුකමකට, අපගේ පාරිභෝගිකයින්ට සහ සමහර අවස්ථාවල අපගේ නළ මාර්ග, SPBM හෝ පර්යන්තයකට යම් ත්‍රස්තවාදි ප්‍රහාරයක් මූල්‍ය තත්ත්වය, මෙහෙයුම් ප්‍රතිඵල හෝ මුදල් ප්‍රවාහයට සැලකියයුතු සහ අහිතකර බලපෑමක් සිදුවියහැක.

ත්‍රස්තවාදි ප්‍රහාරවල හැකියාව අවම කිරීම නවීන ආරක්ෂක කැමරා පද්ධති ක්‍රියාත්මක කිරීමෙන් සහ උසස් තාක්ෂණික පරීක්ෂා උපාංග භාවිතයෙන් සිදුකර ඇත.






Lanka : Guerrillas Hit Oil Depots

# අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)

අපගේ ආරක්ෂක ක්‍රියාමාර්ග අනතුරේ හෙළන සයිබර් ප්‍රහාර සහ අපගේ තොරතුරු ආරක්ෂක ක්‍රියාමාර්ගවල කඩකිරීම් අපගේ මෙහෙයුම් විනාශ කළ හැකි අතර වර්ධනය වන පිරිවැයකට එය හේතු වේ.

අපගේ වත්කම් ක්‍රියාත්මක කිරීමට සහ අපගේ ව්‍යාපාරය කළමනාකරණය කිරීමට අපි තාක්ෂණික ක්‍රම උපයෝගි කර ගනිමු. සයිබර් ප්‍රහාරයක් හෝ අපගේ තොරතුරු තාක්ෂණ පද්ධතියේ වෙනත් ආරක්ෂක කඩකිරීමක් බරපතල මෙහෙයුම් හෝ මූල්‍ය පාලනයන් කඩවීමකට හේතු වන අතර අපගේ මෙහෙයුම්, වාණිජමය කටයුතු හෝ මූල්‍ය ක්‍රියාවලි කඩා කප්පල් කිරීමකට හේතු වියහැක.

සයිබර් ප්‍රහාර ආරක්ෂාව කඩකිරීම් CPSTL හි මෙහයුම් කෙරෙහි සැලකියයුතු අහිතකර බලපෑමක් තිබිය හැකිය. ආපදා පිළියම් කළමනාකරණ මධ්‍යසථාන (DRMC) ව්‍යාපෘතිය තවමත් ක්‍රියාත්මක අතර අප රඳාපවත්වන සයිබර් ප්‍රහාර සෑම හදිසි වර්ගයේ ප්‍රහාර කලින් අපේක්ෂා කිරීමට හෝ වැලැක්වීමට තරම් මූලාශයක් හෝ තාක්ෂණික විදග්ධතාවක් නොමැත. එමෙන්ම එවැනි ප්‍රහාරයන් හෝ එය වැලැක්වීමට ගනු ලබන අමතර ආරක්ෂක ක්‍රියාමාර්ගයක් අපගේ මෙහෙයුම් ප්‍රතිඵල, මූල්‍ය තත්ත්වය හෝ මුදල් ප්‍රවාහයට අහිතකර බලපෑම් ඇති විය හැක.



# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

2007 අංක 7 දරන සමාගම් පනතේ ප්‍රතිපාදනයන්ට අනුව පිළියෙල කළ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සමාගමේ කටයුතු පිළිබඳව වූ වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය සතුටින් ඉදිරිපත් කර සිටී.

මෙය අධ්‍යක්ෂවරුන් විසින් 2018 මාර්තු 07 දින අනුමත කරන ලදි.

### ප්‍රධාන කටයුතු

සමාගමේ ප්‍රධාන කටයුතු වන්නේ ශ්‍රී ලංකාවේ ඛණිජ තෙල් තොග ගබඩා කිරීමේ හා බෙදාහැරීමේ කටයුතු පහසු කිරීම සඳහා පිහිටුවන ලද පොදු භාවිත පහසුකම් සහ 2003 ඔක්තෝබර් 13 දිනැති අංක 1310-8 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ වඩාත් පූර්ණ ලෙස විස්තර කර ඇති තෙල් පර්යන්තය. ගබඩා පහසුකම්, නළ මාර්ග, සහ ඉන්ධන ප්‍රවාහන මෙහෙයුම් සමාලෝචනය සහ මූල්‍ය හුවා දැක්වීම්, වාහන යනාදියෙන් සමන්විත ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ ගබඩා කිරීමේ හා බෙදාහැරීමේ යටිතල පහසුකම් අයිතිකාරත්වය සමග ක්‍රියාත්මක කිරීමත් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් භුක්ති විඳින මුතුරාජවෙල සහ කොලොන්නාවේ ස්ථාපිතයන් දිවයින පුරා පිහිටි තොග ගබඩා සහ අදාළ පහසුකම් කොළඹ වරායේ පිහිටි තෙල් පහසුකම් භාවිත කිරීමට අයිතිය සහ / හෝ බදු අයිතිය, එකස්ථාන පාවෙන බෝයාව සිට මුතුරාජවෙල ස්ථාපනය දක්වා වූ කොළඹ වරායේ සිට කොලොන්නාව ස්ථාපනය දක්වා නළ මාර්ගය ශාඛා සිට පාරිභෝගිකයින්ගේ සීමා දක්වා ගාලු වරායේ සිට මාගල්ල තොග ගබඩාව දක්වා නළ මාර්ගය ඉහත සඳහන් කළ ස්ථාපන සහ තොග තෙල් ගබඩා තුළ පිහිටි නළ මාර්ගයත් අයිති සහ /හෝ කාර්යයන් සහ/ හෝ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට අයත්ය.

### මෙහෙයුම් සමාලෝචනය සහ මූල්‍ය හුවාදැක්වීම්

රු. 2,799,571,815ක ශුද්ධ ලාභයක් සමඟ රු. 14,176,146,910ක ආදායමක් මෙහෙයුම්වලින් පෙන්වා ඇත.

| විස්තරය | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|
| පිරිවැටුම් | 14,176,146,910 | 12,663,444,509 |
| බදු පෙර ඉපයීම් | 3,273,309,403 | 2,330,073,120 |
| බදු පසු ලාභය / (අලාභය) | 2,799,571,815 | 1,738,629,426 |

### ප්‍රකාශිත ප්‍රාග්ධනය

2017 දෙසැම්බර් 31 දිනට ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 7,500,000,000/- කි. කොටස් අයිතිය බෙදීයාම පහත දැක්වෙන පරිදි වේ.

| | සාමාන්‍ය කොටස් |
|---|---|
| ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව | 500,000,000 |
| ලංකා ඉන්දියන් තෙල් සමාගම | 250,000,000 |

### දේපල, පිරියත හා උපකරණ

වසර තුළ දේපල, පිරියත හා උපකරණ වල වෙනස්වීම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 10 යටතේ දක්වා ඇත.

### ලාභාංශ

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා කොටසකට රු.0.54ක අතුරු ලාභාංශයක් අධ්‍යක්ෂ මණ්ඩලය නිර්දේශ කරති.

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (ඉතිරි කොටස)

### ආයතනික පරිත්‍යාග

වසර තුළදී රු. 6,114,277/- ක පරිත්‍යාග සහ ශිෂ්‍යත්ව ගෙවීම් සමාගම සිදුකර ඇත.

### 2017 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂවරුන්

2017 දෙසැම්බර් 31 දිනට සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි විය;
ධම්මික රනතුංග
උදිත නිරෝෂන ගුණවර්ධන
කකුල්තොටුවගේ දෝන රෝස්මේරි ඕල්ගා
අනුප් ජයින්
ශ්‍යාම් බෝරා
රංධීර් සින්
රණවීර ආරච්චිරාලලාගේ නිමල් ජයසුන්දර
හේරත් මුදියන්සේලාගේ සංජීව ලූෂාන්ත විජේරත්න

### අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය

අධ්‍යක්ෂවරුන් විසින් ලබාගත් ගෙවීම් මූල්‍ය ප්‍රකාශනවල විස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත.

### සම්බන්ධතා ලේඛනය

2007 අංක 7 දරන සමාගම් පනතේ ප්‍රතිපාදනයන්ට අනුව සමාගම සම්බන්ධතා ලේඛනයක් පවත්වාගෙන යයි. 2007 අංක 7 දරන සමාගම් පනතේ 192 (2) වගන්තියේ විධිවිධාන පරිදි අධ්‍යක්ෂවරුන් ප්‍රකාශයන් සිදුකර ඇත. සමාලෝචිත වර්ෂයේදී අදාළ සටහන් සම්බන්ධතා ලේඛනයේ තබා ඇත.

### ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරු තම දැනුමේ සහ විශ්වාසයේ තරමට, රජය සහ සේවකයින් සම්බන්ධයෙන් සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා දමා හෝ පොත්වල ප්‍රතිපාදනය කර ඇති බවට අධ්‍යක්ෂවරු සෑහීමට පත්වෙති.

### අඛණ්ඩතා පැවැත්ම

ව්‍යාපාර මෙහෙයුම් කරගෙන යාමට සමාගමට ප්‍රමාණවත් සම්පත් තිබෙන බවට අධ්‍යක්ෂවරුන්ට විශ්වාසය. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා අඛණ්ඩතා පැවැත්ම පදනම යොදා ගැනීම යෝග්‍ය බව අධ්‍යක්ෂවරු සලකා ඇත.

### ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්

සමාගම වෙත ප්‍රමාණවත් බලපෑම් ඇති කරන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කළ යුතු ගැලපීම් අවශ්‍ය කරන මූල්‍ය ප්‍රකාශවල සටහන් අංක 23 යටතේ දක්වා ඇති ඒවා හැර ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදු වූ වැදගත් සිදුවීම් නොමැත.

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (ඉතිරි කොටස)

**විගණකවරු**

19 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව සමාගමේ විගණකවරු වශයෙන් විගණකාධිපති හෝ ඔහු විසින් නම්කළ අයෙකු සමාගමට පත්කිරීම අවශ්‍ය වේ.

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ විගණනය අර්නස්ට් ඇන්ඩ් යං වරලත් ගණකාධිකාරී සමාගමේ සහයෝගය ඇතිව විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් කරගෙන යන ලදී. මූල්‍ය ප්‍රකාශවල විස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ විගණකවරුන්ට ගෙවන ලද ගාස්තු හෙළිදරව් කර ඇත.

අධ්‍යක්ෂවරුන් දැනුවත්ව සිටින පරිදි, ඉහත හෙළිදරව්කළ පරිදි හැර විගණකවරන් සමාගම සමග කිසිම (විගණකවරුන් වශයෙන් හැර) සම්බන්ධතාවක් නොමැත. විගණනකවරුන්ට සමාගමේ හෝ සමූහයේ සමාගම්වල අයිතියක් නොමැත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආචාරධර්ම මාලාව අනුව ඔවුන් ස්වාධීන බවට තහවුරු කර ඇත.

**වාර්ෂික මහ සභා රැස්වීම**

සමාගමේ වාර්ෂික මහ සභා රැස්වීම 2019 මාර්තු 1 දින සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ වෙනුවෙන්

පී.එස්. විතානගේ
**සභාපති**

කේ.ඩී.ආර්. ඕල්ගා
**අධ්‍යක්ෂ**

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ගිණුම්කරණ පද්ධති ලේකම් කාර්යාල සේවා (පුද්ගලික) සමාගම
**සමාගමේ ලේකම්වරු**

# විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

## සංයුතිය

විගණන හා කළමනාකරණ කමිටුව සාමාජිකයින් 02කින් සමන්විත වන අතර, ඔවුන් අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් පත්කරන විධායක නොවන අධ්‍යක්‍ෂවරුන් වේ.

- කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය (භාණ්ඩාගාර නියෝජිත) - සභාපතිවරිය
- අනුජ් ජයින් මහතා (ලංකා අයි.ඕ.සි නියෝජිත) - සාමාජික

රාජ්‍ය වාණිජ ආයතනවල විගණන කමිටු පවත්වා ගෙනයාමට අදාළ ව නිකුත් කර ඇති භාණ්ඩාගාර චක්‍රලේඛවල නියම කර ඇති වගකීම්, බලතල හා විශේෂිත යුතුකම්වල අවකාශය ආවරණය වන පරිදි විගණන කමිටුව ප්‍රඥාප්තිය සකස් කොට ඇත.

## විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්ය

කමිටුව විසින් ක්‍රියාවලින්හී විශ්වාසනියත්වය, යොදාගනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ක්‍රමවල අනුරූපතාව සහ සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සහතික කිරීම සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම සහ අනාවරණයන්හි ප්‍රමාණවත්බව තුළ සමාගම විසින් යොදාගනු ලබන මූල්‍ය වාර්තාකරණ ක්‍රමය සමාලෝචනය කරයි. එමෙන්ම, මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා, සමාගම් පනතේ සහ අනෙකුත් අදාළ මූල්‍ය වාර්තාකරණ රෙගුලාසි සහ අවශ්‍යතාවල තොරතුරු අවශ්‍යතාවන්ට සමාගමේ අනුකූලතාවයද කමිටුව විසින් සමාලෝචනය කරයි. තවද, මෙම කමිටුව විසින් අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණවත්බව සමාලෝචනය කරන අතර බාහිර විගණකවරුන්ගේ ස්වාධීනත්වය සහ කාර්යසාධනය ඇගයීමට ලක් කරයි. කමිටුව විසින් අනුමැතිය සහ සහතිකය සඳහා මූල්‍ය ප්‍රකාශන නිර්දේශ කරයි. කමිටුව සමාගමට අනාවරණය වන අවදානම් සමාලෝචනය කර සමාගම විසින් ගනු ලබන පියවර අනුමත කරයි. එවිට එකී අවදානම්වලින් ඇතිවන බලපෑම් කළමනාකරණය කර අවම කරයි.

## අභ්‍යන්තර විගණකවරු

වත්කම් සුරක්ෂිත බවට සහ මූල්‍ය වාර්තාකරණ ක්‍රමය මල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත්කිරීම සමඟ විශ්වාසී බවට අධ්‍යක්‍ෂවරුන් වෙත සාධාරණ සහතිකය ලබාදීම සඳහා සැලසුම් කර ඇති ගිණුම්කරණ ක්‍රම සහ මූල්‍ය පාලනයේ ඵලදායිත්වය ඇගයීම සඳහා අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ විෂයපථය කමිටුව සමාලෝචනය කරයි. අභ්‍යන්තර විගණන කාර්යය සමාගම තුළ ස්ථාපිත කර ඇත. විගණන නිර්දේශ පසුව ක්‍රියාත්මක කරන බව සහතික කිරීමට පසු විපරම් සමාලෝචන කලින් කල පැවැත්වීමට උපලේඛන ගත කර ඇත.

## ව්‍යවස්ථාපිත විගණන

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි සංශෝධනයට අනුකූලව විගණනයේ ස්වභාවය, ප්‍රවේශය සහ විෂයපථය සමාලෝචනය කිරීමට ශ්‍රී ලංකා ජාතික විගණන කාර්යාලයේ ව්‍යවස්ථාපිත විගණකවරු සමඟ කමිටුව කටයුතු කරයි. මතුවන ගැටළුවලට සහ ක්‍රියාත්මක අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වයට ප්‍රතිචාරාත්මකව කළමනාකාරිත්වය විසින් ගනු ලබන පියවර ද සාකච්ඡා කරයි.

## රැස්වීම්

කමිටුව වෙත පවරන ලද කාර්ය ඉටු කිරීමට සමාලෝචිත වසර තුළ, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් දහතුනක් (13) පවත්වනු ලැබ ඇති අතර එය පහත පරිදි වේ.

වසර තුළ, කමිටු රැස්වීම්වල සහභාගිත්වය පහත පරිදි වේ.

| අංකය | දිනය | කමිටුවේ ශක්තිය | සහභාගි වූ ගණන | සාමාජිකයින්ගේ නම් |
|---|---|---|---|---|
| 01. | 16.02.2017 | 03 | 02 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය<br>සුධර්මා කරුණාරත්න මහත්මිය |
| 02. | 10.03.2017 | 03 | 02 | කේ.ඩී.ආර්. ඕල්ගා<br>අනුජ් ජයින් මහතා |

# විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව (ඉතිරි කොටස)

| | | | | |
|---|---|---|---|---|
| 03. | 14.08.2017 | 03 | 03 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය<br>අනුප් ජයින් මහතා<br>නිමල් ජයසුන්දර මහතා |
| 04. | 18.08.2017 | 03 | 03 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය<br>අනුප් ජයින් මහතා<br>නිමල් ජයසුන්දර මහතා |
| 05. | 07.09.2017 | 03 | 02 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය<br>අනුප් ජයින් මහතා |
| 06. | 15.09.2017 | 03 | 03 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය<br>අනුප් ජයින් මහතා<br>නිමල් ජයසුන්දර මහතා |
| 07. | 18.09.2017 | 03 | 03 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය<br>අනුප් ජයින් මහතා<br>නිමල් ජයසුන්දර මහතා |
| 08. | 21.09.2017<br>(LIOC) | 03 | 02 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය<br>අනුප් ජයින් මහතා |
| 09. | 30.10.2017 | 03 | 03 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය<br>අනුප් ජයින් මහතා<br>නිමල් ජයසුන්දර මහතා |
| 10. | 18.11.2017 | 03 | 03 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය<br>අනුප් ජයින් මහතා<br>නිමල් ජයසුන්දර මහතා |
| 11. | 24.11.2017 | 03 | 03 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය<br>අනුප් ජයින් මහතා<br>නිමල් ජයසුන්දර මහතා |
| 12. | 05.12.2017 | 03 | 03 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය<br>අනුප් ජයින් මහතා<br>නිමල් ජයසුන්දර මහතා |
| 13. | 14.12.2017 | 03 | 03 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය<br>අනුප් ජයින් මහතා<br>නිමල් ජයසුන්දර මහතා |

### විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්යභාරය

ක්‍රියාත්මක කළහැකි කාර්යයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා ක්‍රමෝපායික ගැටළු පිළිබඳ තීරණ හා නිර්දේශ කිහිපයක් සිදුකර ඇත.

- අභ්‍යන්තර පාලන ක්‍රමයේ ප්‍රමාණවත් බව කළමනාකරණය, විගණකාධිපති සහ අභ්‍යන්තර විගණකවරු සමඟ සමාලෝචනය කිරීම.
- මූල්‍ය ප්‍රකාශනවල විනිවිදභාවය, අවබෝධ කර ගැනීමේ හැකියාව සහ විශ්වාසනියත්වය සහතික කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ සාධාරණව ඉදිරිපත් කිරීම සහතිකකිරීමට මූල්‍ය ප්‍රකාශන ක්‍රියාවලිය පාලනය කිරීම.
- අලාභ ලබන ඒකක නැවත සකස් කිරීම සඳහා ක්ෂණික සුදුසු කාර්යයන් යෝජනා කිරීම හෝ නිර්දේශ කිරීම සහ දරන ලද අලාභය සඳහා හේතු සහ බලපෑම හඳුනාගැනීම සහ විස්තරාත්මක විශ්ලේෂණ සහ අධ්‍යයන කිරීම.

# විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව (ඉතිරි කොටස)

- වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩසටහන, සැලකියයුතු විගණන සොයාගැනීම් සහ කාර්යය සැලැස්ම සමාලෝචනය.
- අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය විස්තීර්ණ සහ ඉදිරියට යන බව සහතික කරමින් පිළිගත් මට්ටමක් දක්වා අවදානම අවම කිරීම සඳහා අවදානම් සහ පිලියම් කටයුතු හඳුනා ගැනීම.
- ඉහළ සිට ආරම්භ කරමින් ශක්තිමත් සහ ඵලදායී අභ්‍යන්තර පාලනය සමඟ ආයතනය පුළුල් බැඳීමක් ඇති ආයතනයක් නිර්මාණය.
- නීති සහ රෙගුලාසි, සදාචාරය, බැඳියා පිළිගැටුම් සහ විෂමාචාරය සහ වංචාව විමර්ෂණය කිරීම සමඟ අනුකූලතාවයට අදාළ ආයතනික ප්‍රතිපත්ති සමලෝචනය.
- තත්ත්වය, ප්‍රගතිය සහ නව සංවර්ධනයන් මෙන්ම ගැටළුකාරී ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ජ්‍යේෂ්ඨ කළමනාකරණය සමඟ අඛණ්ඩ සන්නිවේදනය.

## අවසන් කිරීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS/LKAS) අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කෙරේ. මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම යටතේ සකස් කෙරේ. සමාගමේ කටයුතු එහි ප්‍රතිපත්ති සමඟ අනුකූලව පාලනය කරන බවට සහ සමාගමේ වත්කම් විධිමත් ලෙස ගණනය කරන බවට සහ ප්‍රමාණවත් පරිදි සුරක්ෂිත කරන බවට සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අභ්‍යන්තර පාලනය තුළින් සාධාරණ සහතිකයක් ලබා දෙන බවට විගණන කමිටුව සෑහීමට පත්වෙති.



**කේ.ඩී.ආර්.ඕල්ගා**
**සභාපතිණිය**
**විගණන හා කළමනාකරණ කමිටුව**

# මූල්‍ය තොරතුරු



විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. POE/A/CPSTL/2017/FR/01 — ඔබේ අංකය / உமது இல. / Your No — දිනය / திகதி / Date // செப்ரெம்பர் 2018

**ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පරයන්ත සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව**

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම් හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම් වේ.

### 1.3 විගණකයේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුලත් වේ.

මාගේ තත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

පහත් දැක්වෙන නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

I. සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) වෙතින් ලැබිය යුතු යැයි සඳහන් වටිනාකම හා එයට අනුරූපීව සංස්ථාවේ මූලය ප්‍රකාශන වල ගෙවිය යුතු යැයි සඳහන් වටිනාකම අතර රු මිලියන 670.93 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර මේ තුළ රු මිලියන 548.66 ක මතභේදයට තුඩුදුන් වටිනාකමක් ද විය. කෙසේ වෙතත් මූල්‍ය ප්‍රකාශන වල හානිකරණයන් සඳහා රු මිලියන 163.62 ක වෙන් කිරීමක් පමණක් සිදු කර ඇත.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

ii. ලංකා ඉන්දියානු තෙල් සමාගමෙන් (LIOC) ලද ශේෂ තහවුරු කිරීම් වලට අනුව, සමාගමට ගෙවිය යුතු වටිනාකම රු මිලියන 432.77 ක් වූ අතර ඊට අනුරූපීව සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල පෙන්වනු ලබන වටිනාකම රු මිලියන 475.40 කි. එහෙයින්, එම ශේෂයන් දෙක අතර එකඟ නොවූ වටිනාකම රු මිලියන 42.63 කි.

iii. තොග අයිතමයන් සඳහා රු. මිලියන 142.92 ක් වෙන් කිරීමේ පදනම මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය නොකර තිබූ අතර විගණනය සඳහා ද ඉදිරිපත් නොකරන ලදී.

iv. සමාලෝචිත වර්ෂයේ අවසාන වන විට ආදායම් බදු හා එකතු කළ අගය මත බදු (VAT) වල ගෙවිය යුතු වටිනාකම හා සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන පරිදි එකතු කළ අගය මත ලැබිය යුතු ගිණුමේ ඇති වටිනාකමත් ඊට අනුරූපීව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව පවත්වාගෙන යන වාර්තාවල පෙන්නුම් කරනු ලබන වටිනාකමත් අතර රුපියල් මිලියන 436.78 ක වෙනසක් නිරීක්ෂණය විය. එබැවින් එම ශේෂයන් වල නිරවද්‍යතාව, සම්පූර්ණත්වය හා පැවැත්ම පිළිබඳ විගණනයේදී ගැටළු සහගත විය.

v. 2008 හා 2010 වර්ෂවල පැවැති අයකර නොගත් අතිරික්ත ගෙවීම් වූ උපයන විට ගෙවීම බදු (PAYE) හා යෙදවුම් මත වූ එකතු කළ අගය මත බදු (Input VAT) පිළිවෙලින් රු. මිලියන 6.8 ක් හා රු. මිලියන 8.06 ක් නැවත අයකර නොගැනීම විගණනයේදී ගැටළු සහගත විය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මේ සම්බන්ධව කිසිදු වෙන් කිරීමක් සිදුකර නොමැත.

vi. රඳවා ගැනීමේ බදු (WHT) හා නිමවුම් මත වූ එකතු කළ අගය මත බදු (Output VAT) වල ගෙවිය යුතු වටිනාකම් පිළිවෙලින් රු මිලියන 19.09 ක් හා 13.91 ක් වන අතර එම ගෙවුම් ශේෂයන් පියවීමේ විශ්වාසනියත්වයෙන් තොරව වර්ෂයක් පසා අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශන වල ඉදිරියට ගෙනැවිත් ඇති බැවින් එම වටිනාකම් වල නිරවද්‍යතාවය පිළිබඳව විගණනයේදී ගැටළු සහගත විය.

vii. රුපියල් මිලියන 5,045 ක ආසන්න වටිනාකමකින් යුක්ත වූ සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති වත්කම් ප්‍රමාණයත් ඒවායේ ඵලදායී ආර්ථික ජීව කාලය යලි තක්සේරු කිරීමකින් තොරව LKAS 16 හි ඇති ප්‍රතිපාදන වලට අනුව ගිණුම්ගත කරමින් සමාගම විසින් භාවිතා කරයි. තවද සමාගම ආරම්භයේ සිටම එහි වත්කම් ප්‍රත්‍යාගණනය කර නොමැති අතර ඒ සඳහා යෝග්‍ය ප්‍රත්‍යාගණන ප්‍රතිපත්තියක්ද ස්ථාපනය කර නොමැත. එබැවින් මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ජංගම නොවන වත්කම් මගින් එහි සාධාරණ වටිනාකම පිළිඹිඹු නොවේ.

viii. වටිනාකම රු මිලියන 36.3 ක එකතුවකින් යුත් ගණුදෙනු හතරක් පෙර වර්ෂයේ ගැලපුම් ලෙස LKAS 08 ට අනුව මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගත යුතු අතර එම ගණුදෙනු සළකා බලන වර්ෂයේ ගණුදෙනු ලෙස හඳුනාගෙන ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස, සළකා බලන වර්ෂයේ ලාභය හා සළකා බලන වර්ෂය අවසානයේ රඳවාගත් ඉපයුම් රු මිලියන 19.12 කින් අධි තක්සේරු වී හා අවතක්සෙරු වී ඇත.

ix. සමාගම විසින් එහි ව්‍යවසාය සම්පත් සළසුම් පද්ධතිය (ERP) වන SAP පද්ධතයට ඇතුලත් කර ඇති තොග අයිතම වර්ග 250 කට අයත් විශාල තොග ඒකක ප්‍රමාණයක වටිනාකම් පද්ධතියට ඇතුලත් කර නොමැත. එබැවින් තොග අයිතම අගය කිරීමේ නිරවද්‍යතාවය හා සම්පූර්ණත්වය පිළිබඳව විගණනයට තහවුරු කර ගැනීමට නොහැකි විය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.4 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.1.1 වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය අනුව මම පහත සඳහන් පරිදි වේ.

(අ) විගණන මතය සඳහා පදනම, විගණනයේ විෂය පථය සහ සීමාවන් ඉහත සඳහන් පරිදි වේ.

(ආ) මගේ මතය අනුව :

විගණනයට අවශ්‍ය වන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මම ලබාගත් අතර, මගේ පරීක්ෂණයෙන් පෙන්වා ඇති පරිදි, සමගම විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ගෙන ඇත.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතෙහි 151 වන වගන්තියේ නියමයන් සමඟ අනුකූල වේ.

**පාර්ලිමේන්තුවට වාර්තා කරන්න**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව මා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ වාර්තාව නියමිත වේලාවට සභාගත කරනු ඇත.

එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| 2017 දෙසැම්බර් 31 දිනට | සටහන | 2017 රු: | 2016 රු: |
|---|---|---|---|
| **වත්කම** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත හා උපකරණ | 10 | 16,754,748,458 | 16,799,855,205 |
| අස්පෘශ්‍ය වත්කම් | 11 | 277,797 | 7,609,019 |
| වෙනත් මූල්‍ය වත්කම් | 14.1 | 444,255,366 | 441,724,050 |
| | | 17,199,281,621 | 17,249,188,274 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 12 | 407,496,049 | 413,049,408 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු | 13 | 9,071,571,994 | 6,021,067,151 |
| වෙනත් මූල්‍ය වත්කම් | 14.2 | 1,838,973,439 | 1,920,169,313 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 15.1 | 1,474,120,011 | 2,455,417,182 |
| | | 12,792,161,492 | 10,809,703,053 |
| **මුළු වත්කම** | | 29,991,443,113 | 28,058,891,327 |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| **ප්‍රාග්ධනය සහ සංචිතය** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 16 | 7,500,000,000 | 7,500,000,000 |
| ප්‍රාග්ධන සංචිතය | 16.1 | 979,000,000 | 979,000,000 |
| රඳවාගත් ඉපයීම් | | 16,684,197,986 | 14,371,811,934 |
| **මුළු හිමිකම්** | | 25,163,197,986 | 22,850,811,934 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| **නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්** | 17 | 1,473,989,898 | 1,234,070,802 |
| විලම්භිත බදු වගකීම් | 8.1 | 1,017,152,375 | 1,005,757,215 |
| පොලී සහිත ණය සහ ණය ගැනීම් | 18 | - | 911,050,854 |
| | | 2,491,142,273 | 3,150,878,871 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළෙඳ සහ වෙනත් ගෙවියයුතු දෑ | 19 | 1,845,584,533 | 1,311,033,498 |
| පොලී සහිත ණය සහ ණය ගැනීම් | 18 | - | 599,114,311 |
| ගෙවියයුතු ආදායම් බදු | | 491,518,321 | 147,052,713 |
| මුළු වගකීම් | | 2,337,102,854 | 2,057,200,522 |
| මුළු හිමිකම් සහ වගකීම් | | 29,991,443,113 | 28,058,891,327 |

මෙම මූල්‍ය වාර්තා 2007 අංක 07 දරන සමාගම් පනතේ නියමයන්ට අනුකූල වන බව සහතික කරමි.

**මුදල් කළමනාකරු**

මෙම මූල්‍ය වාර්ථා පිලියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැදේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරනු ලැබුයේ,

**අධ්‍යක්ෂ** **සභාපති/අධ්‍යක්ෂ**

පිටු අංක 75 සිට 103 දක්වා ඇති සටහන් සහ ගිණුම් ප්‍රතිපත්ති මෙම මූල්‍ය වාර්තාවලම අඩංගු කොටසක් වේ.

2018 මාර්තු 07 දින
කොළඹ

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2017 රු | 2016 රු |
|---|---|---|---|
| ආදායම | 3 | 14,176,146,910 | 12,663,444,509 |
| සෘජු වියදම් | | (7,400,983,212) | (6,668,940,700) |
| **දළ ලාභය** | | 6,775,163,699 | 5,994,503,809 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 4 | 457,796,444 | 483,200,474 |
| පරිපාලන වියදම් | | (4,025,018,806) | (4,071,225,562) |
| **මෙහෙයුම් ලාභය** | | 3,207,941,337 | 2,406,478,721 |
| මූල්‍ය ආදායම | 5.1 | 189,440,805 | 90,369,796 |
| මූල්‍ය වියදම් | 5.2 | (124,072,738) | (166,775,397) |
| **බදු පෙර ලාභය** | 6 | 3,273,309,403 | 2,330,073,120 |
| ආදායම් බදු වියදම් | 7.1 | (473,737,588) | (591,443,694) |
| **වසර සඳහා ලාභය** | | 2,799,571,815 | 1,738,629,426 |
| **පසුගිය කාලපරිච්ඡේදයන් හි ලාභ හෝ අලාභවලට නැවත වර්ගීකරණය නොකළ යුතු වෙනත් විස්තීර්ණ ආදායම** | | | |
| නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් මත වූ ආයුගණක ලාභය/ අලාභය | 17 | (94,946,584) | 243,863,733 |
| වෙනත් විස්තීර්ණ ආදායම් මත බදු | 8.1 | 12,760,821 | (33,409,331) |
| වර්ෂය සඳහා බදු අඩුකරන ලද වෙනත් විස්තීර්ණ ආදායම | | (82,185,763) | 210,454,402 |
| **වර්ෂය සඳහා බදු අඩුකරන ලද මුළු විස්තීරණ ආදායම** | | 2,717,386,052 | 1,949,083,828 |
| **කොටසක ඉපයුම** | 9.2 | 3.73 | 2.32 |

පිටු අංක 75 සිට 103 දක්වා ඇති සටහන් සහ ගිණුම් ප්‍රතිපත්ති මෙම මූල්‍ය වාර්තාවලම අඩංගු කොටසක් වේ.

# ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

| 2017 දෙසැම්බර් 31 දිනට | ප්‍රකාශිත ප්‍රාග්ධනය රු | ප්‍රාග්ධන සංචිතය රු | රඳවාගත් ඉපයීම් රු | එකතුව රු |
|---|---|---|---|---|
| **2016 ජනවාරි 1 දිනට ශේෂය** | 7,500,000,000 | 979,000,000 | 12,910,228,106 | 21,389,228,106 |
| වසර සඳහා ලාභය | - | - | 1,738,629,426 | 1,738,629,426 |
| වෙනත් විස්තීර්ණ ආදායම | - | - | 210,454,402 | 210,454,402 |
| මුළු විස්තීතර්ණ ආදායම | - | - | 1,949,083,828 | 1,949,083,828 |
| ගෙවූ ලාභාංශය | - | - | (487,500,000) | (487,500,000) |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 7,500,000,000 | 979,000,000 | 14,371,811,934 | 22,850,811,934 |
| වසර සඳහා ලාභය | - | - | 2,799,571,815 | 2,799,571,815 |
| වෙනත් විස්තීර්ණ ආදායම | - | - | (82,185,763) | (82,185,763) |
| මුළු විස්තීර්ණ ආදායම | - | - | 2,717,386,052 | 2,717,386,052 |
| ගෙවූ ලාභාංශය | - | - | (405,000,000) | (405,000,000) |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 7,500,000,000 | 979,000,000 | 16,684,197,986 | 25,163,197,986 |

පිටු අංක 75 සිට 103 දක්වා ඇති සටහන් සහ ගිණුම් ප්‍රතිපත්ති මෙම මූල්‍ය වාර්තාවලම අඩංගු කොටසක් වේ.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2017<br>රු | 2016<br>රු |
|---|---|---|---|
| **මෙහෙයුම් කාර්යයන්ගෙන් ජනිත වූ (භාවිතා කළ) මුදල් ප්‍රවාහ** | | | |
| ආදායම් බදු වියදම්වලට පෙර ලාභය | | 3,273,309,403 | 2,330,073,120 |
| **ගැලපුම්** | | | |
| මූල්‍ය ආදායම | 5.1 | (189,440,805) | (90,369,796) |
| මූල්‍ය වියදම | 5.2 | 124,072,738 | 166,775,397 |
| සේවක ණය හානිකරණය සඳහා ඉඩහැරීම් | | (2,304,574) | 2,203,697 |
| තොග හා වෙනත් ලැබීයයුතු දෑ හානිකරණය සඳහා ඉඩහැරීම් | | 9,792,534 | (41,257,622) |
| දේපල, පිරියත හා උපකරණ විකිණීම මත අලාභය /(ලාභය) | 4 | (3,594,938) | (51,245,219) |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා වෙන්කිරීම | | 242,188,768 | 204,224,090 |
| ක්ෂයවීම් | 10.2 | 878,355,612 | 800,940,058 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | 11.2 | 7,331,222 | 9,740,642 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය (අලාභය)** | | 4,339,709,960 | 3,331,084,367 |
| තොගවල වැඩිවීම/ (අඩුවීම) | | (4,640,443) | (33,513,691) |
| වෙළෙඳ සහ වෙනත් ලැබියයුතු දෑ හි වැඩිවීම/ (අඩුවීම) | | (3,050,103,575) | 1,172,661,197 |
| වෙනත් මූල්‍ය වත්කම්වල වැඩිවීම/ (අඩුවීම) | | 80,969,132 | (79,064,121) |
| වෙළෙඳ සහ වෙනත් ගෙවියයුතු දෑ හි වැඩිවීම/ (අඩුවීම) | | 534,551,035 | (338,412,405) |
| **මෙහෙයුම්වලින් ජනිත වූ / (භාවිතා කළ) මුදල්** | | 1,900,486,109 | 4,052,755,347 |
| ගෙවූ ආදායම් බදු | | (105,115,999) | (136,988,654) |
| මූල්‍ය වියදම් | 5.2 | (124,072,738) | (174,930,901) |
| ගෙවූ නිශ්චිත ප්‍රතිලාභ | 17 | (97,216,256) | (111,923,886) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ / (භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | | 1,574,081,115 | 3,628,911,907 |
| **ආයෝජන කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ** | | | |
| දේපල, පිරියත හා උපකරණ අත්කර ගැනීම් | 10.1 | (833,289,951) | (913,411,535) |
| දේපල, පිරියත හා උපකරණවලින් ලද මුදල් | | 3,636,025 | 51,271,409 |
| මූල්‍ය ආදායම | 5.1 | 189,440,805 | 90,369,796 |
| **ආයෝජන කාර්යයන්ගෙන් ජනිත වූ (භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහ** | | (640,213,121) | (771,770,330) |
| **මූල්‍ය කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ** | | | |
| ණය ආපසු ගෙවීම් | | (1,398,850,854) | (773,504,627) |
| ගෙවූ ලාභාංශ | | (405,000,000) | (487,500,000) |
| **මූල්‍ය කාර්යයන්ගෙන් ජනිත වූ (භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | | (1,803,850,854) | (1,261,004,627) |
| මුදල් හා මුදලට සමාන දෑ හී ශුද්ධ වැඩිවීම/ (අඩුවීම) | | (869,982,860) | 1,596,136,950 |
| වසර ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ | 15.2 | 2,344,102,871 | 747,965,921 |
| **වසර අවසානයේදී මුදල් හා මුදලට සමාන දෑ** | 15.2 | 1,474,120,011 | 2,344,102,871 |

පිටු අංක 75 සිට 103 දක්වා ඇති සටහන් සහ ගිණුම් ප්‍රතිපත්ති මෙම මූල්‍ය වාර්තාවලම අඩංගු කොටසක් වේ.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## 1. සංස්ථාපිත තොරතුරු

### 1.1 පොදු

2003 ඔක්තෝබර් 08 වන දින සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සීමාසහිත වගකීම ඇති සමාගමක් වන අතර සමාගම ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කර ඇත. සමාගමේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තේ සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්, නිමාව, කොලොන්නාව යන ස්ථානයෙහිය.

### 1.2 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් කටයුතු වල ස්වභාවය

වර්ෂය තුළ, සමාගමේ මූලික ක්‍රියාකාරකම් වූයේ ඛනිජ තෙල් නිෂ්පාදනයන් ගබඩා කිරීම සහ බෙදාහැරීමයි.

### 1.3 මව් අස්තිත්වය සහ අවසාන පාලන පාර්ශවය

අධ්‍යක්ෂ වරුන්ගේ මතය අනුව, සමාගමෙහි අවසාන මව් ව්‍යාපාරය වනුයේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කරන ලද ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවයි.

### 1.4 නිකුත්කිරීම සඳහා බලය පවරන දිනය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් මූල්‍ය ප්‍රකාශණ නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතය අනුව 2018 මාර්තු 07 දින බලය පවරනු ලැබීය.

## 2. පිළියෙල කිරීමේ පදනම

### 2.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන් වලින් සමන්විත වූ සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියමකරනු ලැබූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS/ LKASs) වලට අනුකූලව සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ නියමයන්ට අනුකූලව පිළියෙල කොට ඉදිරිපත්කර ඇත.

#### 2.1.1 මැනීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පහත අයිතමයන් හැර සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත.

- නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සඳහා වන වගකීම් ආයුගණක ක්‍රම අනුව තක්සේරුකර වර්තමාන අගයට හඳුනාගෙන ඇත.

#### 2.1.2 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් සහිතව දිගටම පවත්වාගෙන යාමට සමාගමේ හැකියාව පිළිබඳව අධ්‍යක්ෂවරුන් තක්සේරුවක් ලබා දී ඇති අතර අනාගතයේ දැකිය හැකි නිශ්චිත කාලයක් සඳහා ව්‍යාපාරයේ අඛණ්ඩව රැඳී සිටීමට සම්පත් තිබීම පිළිබඳව තෘප්තිමත් භාවයට පත්ව ඇත. එසේම අඛණ්ඩ පැවැත්මක් සහිතව දිගටම පවත්වාගෙන යාමට සමාගමේ හැකියාව පිළිබඳ සැලකිය යුතු මට්ටමේ සැකයක් ඇතිකළ හැකිව තිබෙන යම් ප්‍රමාණාත්මක අවිනිශ්චිතභාවයක් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත්ව නොමැති අතර ඔවුන් ඈවර කිරීමට හෝ සමාගමේ මෙහෙයුම් කටයුතු නවතාලීමට අදහස් නොකරයි. එම නිසා මූල්‍ය ප්‍රකාශන දිගටම අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙල කරනු ඇත.

### 2.2 ක්‍රියාකාරී සහ ඉදිරිපත්කිරීමේ මුදල් වර්ගය

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත්තේ සමාගමේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කරන මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

### 2.3 සංසන්දනාත්මක තොරතුරු

සමාගම විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සංගතතාවයෙන් යුක්තව යොදාගෙන ඇති අතර, ඒවා පසුගිය වර්ෂයේ දී භාවිතා කළ ඒවා සමග සංගතතාවයෙන් යුක්ත වේ. මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 24 දී ඇති තොරතුරු ද ඇතුළත්ව පසුගිය වසරේ සංඛ්‍යා සහ වාක්‍යාංශ වත්මන් ඉදිරිපත් කිරීමට අනුකූල වීම සඳහා අවශ්‍ය විට නැවත සකස් කර ඇත.

### 2.4 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන් ඇස්තමේන්තු සහ උපකල්පන

ගිණුම්කරණ ප්‍රතිපත්තිවල භාවිතයට සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් වල වාර්තා කරන ලද ගණන්වලට බලපාන විනිශ්චයන් ඇස්තමේන්තු සහ උපකල්පන කළමණාකරණය විසින් සිදු කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අවශ්‍ය වේ. මෙම උපකල්පනයන් හා ඇස්තමේන්තුවල අවිනිශ්චිතතාවයන් වත්කම් සහ වගකීම් වල ධාරණ වටිනාකම් වලට අනාගත කාලසීමාවන් සඳහා බලපාන සැලකියයුතු ගැලපීමක් අවශ්‍ය වන ප්‍රතිඵල ඇතිකිරීමට හේතු වනු ඇත.

ඇස්තමේන්තු හා උපකල්පනයන් අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු වලට සිදුකරන වෙනස් කිරීම් ඇස්තමේන්තුවට වෙනස්කිරීම් සිදුකළ කාලසීමාවේදී සහ එය බලපාන ඕනෑම අනාගත කාලවලදී හඳුනාග නු ලැබේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේ දී, සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගන්නා ලද වටිනාකම් මත වඩාත්ම සැලකියයුතු බලපෑමක් ඇති ඇස්තමේන්තු කිරීමේ, අවිනිශ්චිතතාවයේ සහ තීරණාත්මක විනිශ්චයන් සම්බන්ධ ක්ෂේත්‍රයන් පහත පරිදි වේ.

**(අ) නිශ්චිත සේවක ප්‍රතිලාභ වගකීම**

නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් පාරිතෝෂිකවල පිරිවැය මෙන්ම වර්තමාන අගය ආයුගණක මිණුම් ක්‍රම භාවිතා කරමින් නිශ්චය කරනු ලැබේ. වට්ටම් අනුපාත, අනාගත වැටුප් වැඩිවීම්, සහ වෙනත් අදාළ දත්තයන් පිළිබඳව උපකල්පන සිදුකිරීම ආයුගණක මිනුම් ක්‍රමය තුළ ඇතුලත් වේ. සේවක ප්‍රතිලාභයන්ගේ දීර්ඝ කාලීන ස්වභාවය හේතුවෙන් එකී ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ. එසේම තවදුරටත් උපකල්පනයන්ගේ විස්තරත් සමාගම ඉහත මූලික උපකල්පනයන් සම්බන්ධයෙන් කළමනාකරණය විසින් ඒවායේ සංවේදීතාවය පිළිබඳව සිදුකරන ලද විශ්ලේෂණයක් සහ සංවේදීතා විශ්ලේෂණයේ ප්‍රතිඵල සටහන් 17.2 සහ 17.4 දක්වා ඇත.

**(ආ) වෙළෙඳ ලැබිය යුතු දෑ හානිකරණය**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනට වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය වී ඇති බවට විෂය මූලික සාක්ෂි පවතින්නේ ද යන්න සමාගම තක්සේරු කර බලයි. දැනට පවතින ලැබිය යුතු දෑවල දැනට පවත්නා තත්වය සහ ණය අයකරගැනීම පිළිබඳ අතීත අත්දැකීම් පදනම් කරගෙන හානිකරන අලාභය ගණනය කරයි. වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ හානිකරණ අලාභය සටහන් 2 .5. 11 සහ 13 හි හෙළිදරව් කර ඇත.

**(ඇ) ආදායම් බදු සහ විලම්භිත බදු**

සමාගම ආදායම් බදුවලට යටත් වේ. ආදායම් බදු සඳහා වෙන් කිරීම තීරණය කිරීමේ දී සැලකිය යුතු විනිශ්චයන් අවශ්‍ය වේ. අවසාන බදු තීරණය අවිනිශ්චිත වන බොහෝ ගණුදෙනු ඇත. අතිරේක බදු ගෙවීමට සිදුවේද යන ඇස්තමේන්තුව මත පදනම්ව අපේක්ෂිත බදු ගැටළු මත ආයතනය බදු වගකීම් හඳුනාගනී. මෙම කරුණුවල අවසාන ප්‍රතිඵලය මුල් අවස්ථාවේ දී වාර්තාකල ගණන් වලින් වෙනස් වන විට, එවැනි වෙනස්කම් ජංගම මෙන්ම එවැනි තීරණයක් ගන්නා කාල පරිච්ඡේදයේ විලම්භිත බදු වත්කම් සහ වගකීම් වලට බලපායි. වැඩිදුර තොරතුරු සටහන් 07 සහ 08 හි හෙළිදරව් කර ඇත.

## 2.5 වැදගත් ගිණුම් ප්‍රතිපත්ති සාරාංශය

### 2.5.1 විදේශ විනිමය පරිවර්තනය

සමාගමේ ක්‍රියාත්මක සහ වාර්තා කිරීමේ මුදල වන රුපියල් වලින් මෙම මූල්‍ය වාර්තා ඉදිරිපත් කරයි. විදේශ විනිමය වලින් සිදුවෙන ගනුදෙනු, ගනුදෙනුව සිදුවන දිනයේ පැවති අනුපාතයට ක්‍රියාත්මක මුදලින් මූලිකව වාර්තා කරයි. විදේශ විනිමය වලින් දක්වා ඇති මූල්‍ය වත්කම් සහ වගකීම් වාර්තා කරන දිනයේ පවතින අනුපාතයට ක්‍රියාත්මක මුදලට හරවයි. සියලු වෙනස්කම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ගනී. විදේශ විනිමයකින් ඓතිහාසික පිරිවැයට මනිනු ලබන මූල්‍ය නොවන අයිතමයන් මූලික ගනුදෙනුව දිනයේ පැවති විනිමය අනුපාතයට පරිවර්තනය කරනු ලැබේ. විදේශ විනිමයකින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය නොවන අයිතමයන් සාධාරණ අගය තීරණය කල දිනයේ පැවති විනිමය අනුපාතයට පරිවර්තනය කරනු ලැබේ.

### 2.5.2 අයභාරය හඳුනා ගැනීම

ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒම නිශ්චිත විට සහ ආදායම විශ්වාසවන්ත ලෙස මැනිය හැකි විට අයභාරය හඳුනාගනී. ලබාගත් හෝ ලැබිය යුතු ප්‍රතිශ්ඨාවේ සාධාරණ අගයෙන් වෙළඳ වට්ටම්, ආපසු එවුම්, ප්‍රතිදාන සහ විකුණුම් බදු (එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බද්ද) අඩු කොට අයභාරය මනිනු ලැබේ.

ආදායම් ප්‍රමාණය විශ්වාසවන්තව මැනිය හැකිවිට,අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුලට ගලා ඒමේ සම්භාවිතාවයක් ඇතිවිට සහ පහත විස්තර කර ඇති ආකාරයට සමාගමේ සෑම ක්‍රියාකාරකමක් සඳහාම අදාළ විශේෂිත ගති ලක්ෂණයන් සපුරා ඇතිවිට, සමාගම විසින් ආදායම හඳුනාගනී. විකිණීමට අදාළ සියලු අවිනිශ්චිතතාවයන් විසඳන තුරු, ආදායම් ප්‍රමාණය විශ්වාසවන්තව මැනිය හැකි සේ නොසලකයි.

**(අ) සේවාවන් සැපයීම**

සේවාවන් සැපයූ හෝ ඉටුකළ ගිණුම් කාලපරිච්ඡේදය තුළ සේවාවන් සැපයීමෙන් ජනිතවන ආදායම හඳුනාගනී.

*පර්යන්ත ගාස්තුව*

ලංකා ඛනිජතෙල් සංස්ථාව, ලංකා ඉන්දියන් තෙල් සමාගම සහ භාණ්ඩාගාරය අතර 2003 වර්ෂයේ දී අත්සන් කළ පසුව 2011 වර්ෂයේ දී සංශෝධනය කළ, පොදු භාවිතා කරන්නන්ගේ ගිවිසුම අනුව අලෙවිකරණ සමාගම් වලින් අයකරුවාගත් මෙහෙයුම් පිරිවැය වලින් සමන්විත වේ. එය ඔවුන්ට හිමි ඛනිජතෙල් නිෂ්පාදනයන් හුවමාරුවන අවස්ථාවේ දී හඳුනාගැනේ. විකුණනු ලබන ඛනිජතෙල් නිෂ්පාදිතයන් ලීටරයකට යන අනුපාතය යටතේ මනිනු ලැබේ.

*මෙහෙයුම් ආන්තිකය*

මිල සූත්‍රයේ පූර්ව නිශ්චිත අනුපාතයන් මත පදනම්ව මෙහෙයුම් දායකත්වය හඳුනාගැනේ. විකුණනු ලබන ඛනිජතෙල් නිෂ්පාදිතයන් ලීටරයකට යන අනුපාතය යටතේ මෙහෙයුම් දායකත්වය මනිනු ලැබේ.

*ප්‍රවාහන ආදායම*

දුම්රිය, වාහන, නළමාර්ග සහ බවුසර් ගනුදෙනුකරුවන් වෙනුවෙන් දරණ ලද ප්‍රවාහන පිරිවැය අයකර ගැනීමයි. ලීටර පරිමාව සහ ගමන් කරන ලද දුර ප්‍රමාණය මත පදනම්ව ආදායම හඳුනාගැනේ.

*ණය පොළිය*

මිල සූත්‍රයේ පූර්ව නිශ්චිත අනුපාතයන් මත පදනම්ව, සමාගම විසින් දරන ලද පොළිය යලි අයකරගැනීම මත ගණනය කරමින් ණය පොළිය හඳුනාගැනේ. විකුණනු ලබන ඛනිජතෙල් නිෂ්පාදිතයන් ලීටරයකට යන අනුපාතය යටතේ ණය පොළිය මනිනු ලැබේ.

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - LKAS 1 ,මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත්කිරීම, අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශවල තුළනාත්මක ප්‍රමාණ නැවත වර්ගීකරණය**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන මූල්‍ය වර්ෂය සඳහා සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හී මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදි වෙනසට අනුකූලව සකස් කර ඇති නැවත වර්ගීකරණය පහත වගුවෙන් අනාවරණය කරන අතර පවත්නා වසරේ ඉදිරිපත් කිරීම තහවුරු කිරීමට පෙර වසරේ සැසැඳුම්වල නැවත වර්ගීකරණය දැක්වේ.

| | සටහන | 2016 රු. | නැවත වර්ගීකරණය | නැවත වර්ගීකරණය කළ පරිදි |
|---|---|---|---|---|
| ආදායම | 3 | 12,663,444,509 | - | 12,663,444,509 |
| සෘජු වියදම් | | (6,661,689,016) | (7,251,684) | (6,668,940,700) |
| **දළ ලාභය** | | 6,001,755,493 | - | 5,994,503,809 |
| වෙනත් මෙහෙයුම් ආදායම | 4 | 483,200,474 | - | 483,200,474 |
| පරිපාලන වියදම් | | (4,071,225,562) | | (4,071,225,562) |
| විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් | | (7,251,684) | 7,251,684 | - |
| **මෙහෙයුම් ලාභය** | | **2,406,478,721** | | **2,406,478,721** |

* අලෙවිකරණ ක්‍රියාවලියන්ට CPSTL සහභාගි නොවන බැවින්, විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් මනාව ඉදිරිපත් කිරීම සඳහා සෘජු වියදම් නැවත වර්ගීකරණය කර ඇත.

**ආ) මූල්‍ය ආදායම**

පොළිය උපචිත වනවිට,සඵල පොළී ක්‍රමය භාවිතා කරමින් මූල්‍ය ආදායම හඳුනාගැනේ.

**ඇ) වෙනත්**

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනාගැනේ.

දේපල, පිරියත හා උපකරණ සහ ආයෝජන ඇතුළුව වෙනත් ජංගම නොවන වත්කම් විකිණීමෙන් හටගන්නා අයභාර ස්වභාවයේ ශුද්ධ ලාභ සහ අලාභ, විකිණීමෙන් ලද මුදල් වලින් වත්කම් වල ධාරණ අගය සහ ආශ්‍රිත විකිණීමේ වියදම් අඩු කිරීමෙන් පසු ආදායම් ප්‍රකාශයේ ගිණුම් තබනු ලැබේ.

අමතර ක්‍රියාකාරකම්වල සිට ප්‍රධාන ආදායම් උත්පාදනය කරන ක්‍රියාකාරකම් දක්වා සහ ප්‍රමාණාත්මක නොවන සමාන ගනුදෙනු සමූහයකින් හටගන්නා ලාභ සහ අලාභයන්, ශුද්ධ පදනම මත එකට එකතුකර වාර්තාකොට ඉදිරිපත් කරනු ලබයි.

### 2.5.3 වියදම් හඳුනාගැනීම

ව්‍යාපාරය හඳුනා ගැනීමේ දී සහ දේපල, පිරියත හා උපකරණ කාර්යක්ෂම තත්ත්වයෙන් නඩත්තු කිරීමේ දී දරන ලද සියළු වියදම් කාලපරිච්ඡේදයේ ආදායම් ප්‍රකාශයට අයකරනු ලැබේ.

### 2.5.4 බදුකරණය

කාලපරිච්ඡේදය සඳහා වන බදු වියදම ප්‍රවර්තන සහ විලම්භිත බදු වලින් සමන්විත වේ. වෙනත් විස්තීර්ණ ආදායම් හෝ සෘජුවම ස්කන්ධයට අදාළව හඳුනාගන්නා අයිතමයන් සම්බන්ධයෙන් හැරෙන්නට බදු කාලපරිච්ඡේදය සඳහාවන ලාභයට හඳුනාගනී. මෙහිදී බදු,පිළිවෙලින් වෙනත් විස්තීර්ණ ආදායම හා සෘජුවම ස්කන්ධයට ද හඳුනා ගනී.

#### ප්‍රවර්තන බදු

ප්‍රවර්තන සහ පෙර කාලපරිච්ඡේදයන් සඳහා ප්‍රවර්තන අදායම් බදු වත්කම් සහ වගකීම් බදු අධිකාරීන්ගෙන් අයකර ගැනීමට අපේක්ෂිත හෝ බදු අධිකාරීන්ට ගෙවීමට ඇති ප්‍රමාණයන්ට මනිනු ලැබේ. ප්‍රමාණය ගණනය කිරීමට යොදාගන්නා බදු අනුපාතයන් සහ බදු නීති, වාර්තාකරන දින ක්‍රියාත්මකව පවතින හෝ ප්‍රමාණාත්මකව නීතිගතකර ඇති ඒවා වේ.

ආදායම් බදු වෙන්කිරීම පදනම් ව ඇත්තේ මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇති පරිදි සහ අදාළ බදු රෙගුලාසි වලට අනුකූලව ගණනය කරනු ලබන ආදායම් සහ වියදම් මූලිකාංග මතය.

සෘජුවම ස්කන්ධයට හඳුනාගන්නා ලද අයිතමයන්ට අදාළ ප්‍රවර්තන ආදායම් බද්ද ස්කන්ධය තුලම හඳුනාගත යුතු අතර විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනා නොගත යුතුය.

#### විලම්භිත බදු

වත්කම් සහ වගකීම් වල බදු පදනම සහ මූල්‍ය වාර්තා කරන පරමාර්ථ සඳහා වන ධාරණීය අගයන් අතර, වාර්තා කරන දිනට පවතින තාවකාලික වෙනස මත, වගකීම් ක්‍රමය භාවිතා කරමින්, විලම්භිත බදු වෙනස් කිරීම සිදුකරයි.

ව්‍යාපාර සංයෝජනයක් නොවන ගනුදෙනුවක දී, වත්කමක් සහ වගකීමක් මූලික හඳුනාගැනීමකින් හටගන්නා විලම්භිත ආදායම් බදු වගකීම් ඇතිවිට සහ ගනුදෙනුව සිදුවන අවස්ථාවේ දී ගිණුම්කරණ ලාභයට හෝ බදු අයවන ලාභ හෝ පාඩු වලට බල නොපාන, තාවකාලික වෙනස්කම් ඇතිවිට හැර සියලුම බදු අයවන තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වගකීම් හඳුනාගනු ලබයි.

අඩුකල හැකි තාවකාලික වෙනස්කම් වලට අදාළ විලම්භිත බදු වත්කම ව්‍යාපාර සංයෝජනයක් නොවන ගනුදෙනුවක දී වත්කමක් සහ වගකීමක් මූලික හඳුනාගැනීමකින් හටගන්නේ නම් සහ ගනුනෙුව සිදුවන කාලයේදී ගිණුම්කරණ ලාභයට හෝ බදු අයවන ලාභ හෝ පාඩුවලට බල නොපාන්නේ නම්, අඩුකලහැකි තාවකාලික වෙනස්කම්, ඉදිරියට ගෙනයනු ලබන භාවිතා නොකල බදු වත්කම් සහ භාවිතා නොකල බදු අලාභ භාවිතා කිරීම සඳහා බදු අයවන ලාභ ඇතිවීම සිදුවිය හැකි වන විට, සියලුම අඩුකල හැකි තාවකාලික වෙනස්කම්, ඉදිරියට ගෙනයනු ලබන භාවිතා නොකල බදු වත්කම් සහ භාවිතා නොකල බදු අලාභ සඳහා විලම්භිත බදු වත්කම් හඳුනාගනු ලබයි.

විලම්භිත බදුවත්කම් වල ධාරණ අගය සෑම වාර්තා කරන දිනටම සමාලෝචනය කරන අතර භාවිතා කල යුතු විලම්භිත බදු වත්කම මුළුමනින්ම හෝ කොටසක් ඉඩදීම සඳහා ප්‍රමාණවත් බදු අයවන ලාභයක් පවතින බවට තවදුරටත් සම්භාවිතාවක් නොමැති විට විලම්භිත බදු වත්කම අඩුකල යුතුය.

වත්කම උපලබ්ධි වනවිට හෝ වගකීම පියවනවිට වාර්තා කරන දිනට ක්‍රියාත්මකව පවතින හෝ ප්‍රමාණවත්ව නීතිගතකර ඇති බදු අනුපාතයන් (සහ බදු නීති) පදනම් කරගත් වර්ෂය සඳහා යොදාගන්නා බදු අනුපාතයන්ට අනුව විලම්භිත බදු වත්කම් සහ වගකීම් මනිනු ලැබේ.

### විකුණුම් බදු (එකතුකල අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බද්ද)

අධිකාරීන්ගෙන් අයකරගත නොහැකි, වත්කම් හෝ සේවාවන් මිල දී ගැනීමේ දී දරන ලද, අදාළ පරිදි විකුණුම් බදු ඇතුලත් අගයට වත්කමේ පිරිවැයෙහි හෝ වියදම් අයිතමයෙහි කොටසක් ලෙස සහ ලැබිය යුතු සහ ගෙවිය යුතු ලෙස හඳුනාගන්නා විට හැර, අනෙකුත් විකුණුම් බදු අඩුකිරීමෙන් පසු ආදායම්, වියදම් සහ වත්කම් හඳුනාගනු ලබයි. බදු අධිකාරීන් වෙනුවෙන් ලැබිය යුතු සහ ගෙවිය යුතු විකුණුම් බදු ගණන මූල්‍ය තත්ව ප්‍රකාශයේ ලැබිය යුතු සහ ගෙවිය යුතු දෑවල ඇතුලත් කරනු ලබයි.

## 2.5.5 මූල්‍ය සාධන පත්‍ර - මූලික හඳුනා ගැනීම සහ පසුකාලීන මැනිම

### 2.5.5.1 මූල්‍ය වත්කම්

සමාගමේ මූල්‍ය වත්කම් වලට මුදල් හා කෙටිකාලීන තැන්පතු, වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ සහ ආශ්‍රිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු ගණන් ඇතුලත් වේ.

### මූලික හඳුනාගැනීම සහ මැනීම

ශ්‍රීලගිප්‍ර 39 හි විෂය පථය තුල ඇති මූල්‍ය වත්කම් ලාභාලාභ තුලින් සාධාරණ අගයට දක්වන මූල්‍ය වත්කම්, ණය සහ ලැබිය යුතු මුදල්, කල්පිරෙන තෙක් තබාගන්නා ආයෝජන, විකිණීමට ඇති මූල්‍ය වත්කම් හෝ ඵලදායී ඉදිරි රැකුමක් ඇති ඉදිරි රැකුම් සාධන පත්‍ර ලෙස යොදවා ඇති ව්‍යුත්පන්න ලෙස සුදුසු පරිදි වර්ගීකරණය කරයි. සමාගම විසින් එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය මූලික හඳුනාගැනීමේ දී තීරණය කරයි.

සියලු මූල්‍ය වත්කම් ඒවායේ සාධාරණ වටිනාකමට හඳුනාගන්නා අතර, ලාභාලාභ තුලින් සාධාරණ අගයට නොදක්වන වත්කම් සම්බන්ධයෙන් සෘජුවම හඳුනාගත හැකි ගනුදෙනු පිරිවැය ද ඊට එකතු කරයි.

වෙළෙඳපොලේ රෙගුලාසි හෝ සම්ප්‍රදායන්ට (සාමාන්‍ය ආකාරයේ වෙළෙඳාම්) අනුව පිහිටුවා ගන්නාලද, කාල පරාසයක් තුළ වත්කම් බෙදාහැරීම අවශ්‍යවන මූල්‍ය වත්කම් ගැනීම් හෝ විකිණීම් වලදී, ඒවා වෙළෙඳ දිනට, එනම් සමාගම වත්කම් මිලට ගැනීම් හෝ විකිණීම් සිදුකරන දිනට, හඳුනාගනු ලබයි.

### පසුකාලීන මැනීම

මූල්‍ය වත්කම් පසුකාලීනව මැනීම, පහත දැක්වෙන ආකාරයට ඒවායේ වර්ගීකරණය මත පදනම් වේ.

**අ) ණය සහ ලැබිය යුතු**

ණය සහ ලැබිය යුතු මුදල් ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන අතර සක්‍රීය වෙළෙඳපොලක් තුළ ලැයිස්තුගත නොකල ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහිත වේ. මූලික මැනීමෙන් පසු එවැනි මූල්‍ය වත්කම් පසුකාලීනව සඵල පොළී අනුපාත ක්‍රමය (EIR) භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට හානිකරණය අඩුකර මිනුම් කරයි. අත්පත්කර ගැනීම මතවූ යම් වට්ටමක් හෝ අධිමිලක් සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය තීරණය කරනු ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම් තුළ ඇතුලත් කර හානිකරන අලාභ ආදායම් ප්‍රකාශය තුළ මූල්‍ය පිරිවැයෙහි ඇතුලත් කරයි.

### ඉවත් කිරීම

මූල්‍ය වත්කමක් (හෝ අදාල වන විටදී මූල්‍ය වත්කමකින් කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක්) ඉවත් කරනු ලබන්නේ:

- වත්කමෙන් මුදල් ප්‍රවාහයන් ලැබීමට ඇති හිමිකම කල් ඉකුත්ව ගොස් ඇති විට.
- සමාගම විසින් මුදල් ප්‍රවාහයන් ලැබීමට සමාගමට ඇති අයිතිය පවරා ඇති විට, හෝ මාරු කිරීම් වැඩපිළිවෙලක් යටතේ ලබාගත් මුදල් ප්‍රවාහයන් මුළුමනින්ම සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව තුන්වන පාර්ශවයක් වෙත ගෙවීමට බැඳීමක් ඇතිකරගෙන ඇතිවිටක සහ එක්කෝ (අ) සමාගම විසින් සැලකිය යුතු ලෙස වත්කම සම්බන්ධ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා ඇති විට, නැතහොත් (ආ) සමාගම විසින් සැලකිය යුතු ලෙස වත්කම සම්බන්ධ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා හෝ රඳවා තබාගෙන නොමැති වුව ද වත්කමෙහි පාලනය පවරා ඇති විට.

සමාගම විසින් වත්කමෙන් මුදල් ප්‍රවාහයන් ලැබීමට ඇති අයිතිය පවරා ඇති විට හෝ මාරුකිරීම් වැඩ පිළිවෙලකට එළඹ සැලකිය යුතු ලෙස වත්කම සම්බන්ධ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා හෝ රඳවා තබාගෙන නොමැතිව හෝ එහි පාලනය පවරා නොමැතිව ඇති විට වත්කම හඳුනාගනු ලබන්නේ ඒ සඳහා සමාගමේ අඛණ්ඩ මැදිහත්වීම් මට්ටම අනුවය.

එවැනි විටදී, සමාගම විසින් ආශ්‍රිත වගකීමක්ද හඳුනාගනු ලබයි. සමාගම විසින් රඳවා තබාගත් හිමිකම් සහ බැඳීම් පෙන්නුම් වන පදනමක් මත පවරන ලද වත්කම සහ ආශ්‍රිත වගකීම මිණුම් කරනු ලබයි.

අඛණ්ඩ මැදිහත්වීම පවරන ලද වත්කම මත ඇපයක ස්වරූපයක් ගන්නා අතර, එය වත්කමෙහි මුල් ධාරණ අගය සහ ආපසු ගෙවීමට සමාගමට අවශ්‍යවන, උපරිම මුදල් ප්‍රමාණය යන අගයන්ගෙන් වඩා අඩු අගයට මිණුම් කරයි.

### මූල්‍ය වත්කම් වල අගය හානිකරණය

මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් සමූහයක අගය හානිකරණය වී තිබේ ද යන්න පිළිබඳව විෂයානුකූලව සාක්ෂි තිබේද යන්න, සමාගම සෑම වාර්තාකරන දිනකටම තක්සේරු කරයි. වත්කමෙහි මූලික හඳුනාගැනීමට පසුව සිදුව ඇති සිදුවීම් එකක් හෝ කිහිපයක ප්‍රතිඵලයක් වශයෙන් (සිදුව ඇති අලාභ සිද්ධියක්)

ඇතිවීමත්, එකී අලාභ සිද්ධිය සිදුවීම මගින් මූල්‍ය වත්කම හෝ මූල්‍ය වත්කම් සමූහයේ, විශ්වාස වන්තව මිනුම් කළහැකි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් මත බලපෑමක් ඇතිකරනවිට, හානිකරණය පිළිබඳ විෂයානුකූල සාක්ෂි ඇත්නම් පමණක් මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් සමූහයක හානිකරණය සිදුවී ඇතැයි සලකනු ලබයි. ණයගැනීමක් හෝ ණයගැතියන් සමූහයක් සැලකියයුතු මූල්‍ය දුෂ්කරතාවයන් අත් විඳිමින් සිටිනවිට, පොළිය හෝ මුල් මුදල නොගෙවීම, ගෙවීම පැහැර හැරීම, ඔවුන් බුන්වත්භාවයට හෝ වෙනත් මූල්‍ය අසංවිධානාත්මක තාවයන්ට පත්වනු ඇතිවිට, සහ පැහැර හැරීම සමග සහසම්බන්ධවන හිගවල හෝ ආර්ථික තත්වයන්ගේ වෙනසක් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ මැනියහැකි අඩුවවීමක් නිරීක්ෂණ දත්ත මගින් පෙන්නුම් කරන අවස්ථාවලදී, වැනි ඇඟයීම් හානිකරණය වීම පිළිබඳ සාක්ෂි වලට ඇතුලත් කල හැක.

## ක්‍රමක්ෂය පිරිවැයට පවත්වා ගන්නා මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගන්නා මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් සමාගම විසින් පළමුව තක්සේරු කරනු ලබන්නේ, තනි තනිව සුවිශේෂවන මූල්‍ය වත්කම් සඳහා තනි තනිව හානිකරණය වීම පිළිබඳ විෂයානුකූල සාක්ෂි පවතින්නේද යන්න පිළිබඳ හෝ තනි තනිව සුවිශේෂී නොවන මූල්‍ය වත්කම් සඳහා සාමූහිකව හානිකරණය වීම පිළිබඳ විෂයානුකූල සාක්ෂි පවතින්නේද යන්න පිළිබඳවයි. තනි තනිව තක්සේරු කළ මූල්‍ය වත්කම් සඳහා හානිකරණය වීම පිළිබඳ විෂයානුකූල සාක්ෂි නොමැති බවට සමාගම විසින් නිශ්චය කර ගන්නේ නම්, ඒවා සුවිශේෂී වුවත්, නැතත්, සමාන ණය අවදානම් ගතිලක්ෂණ පවතින මූල්‍ය වත්කම් සමූහයක් එයට ඇතුලත් කොට, හානිකරණය වීම සඳහා හානිකරණ අලාභයක් ඇත්නම් හෝ එය අඛණ්ඩව පවතින බව හඳුනා ගත්තේ නම්, එකී වත්කමේ හානිකරණය වීම පිළිබඳ සාමූහික තක්සේරුවට ඇතුලත් නොකරයි.

හානිකරණය වීමේ අලාභයක් ඇති බවට විෂයානුකූල සාක්ෂි ඇති විට අලාභයේ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ගේ (තවමත් ඇතිවී නොමැති අනාගත අපේක්ෂිත ණය අලාභ හැර) වර්තමාන අගය අතර වෙනස මගිනි. ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ගේ වර්තමාන අගයන්, මූල්‍ය වත්කමේ සඵල පොලී අනුපාතයට වට්ටම් කරනු ලැබේ. ණයක් සඳහා විචල්‍ය පොළී අනුපාතිකයක් නැත්නම්, ඕනෑම හානිකරණය වීමේ අලාභයක් මිනුම් කිරීම සඳහා වන වට්ටම් අනුපාතය වන්නේ ප්‍රවර්තන සඵල පොළී අනුපාතයයි.

ඉඩහැරීමේ ගිණුමක් භාවිත කිරීම හරහා වත්කමේ ධාරණ අගය අඩුවන අතර අලාභය ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ. පොළී ආදායම, අඩුවූ ධාරණ අගය මත අඛණ්ඩව උපචිත වන අතර, හානිකරණය මැනීමේ කාර්යය අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් සඳහා භාවිත කළ පොළී අනුපාතය භාවිතයෙන් පොලිය උපචිත කිරීම සිදු කරයි. පොළී ආදායම ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ කොටසක් ලෙස වාර්තා කරයි. අනාගත අයකරග ැනීම සම්බන්ධයෙන් යථාර්තවාදී අපේක්ෂාවක් නොමැතිවිට සහ සියලු අතිරේක ඇප උපලබ්ධි වී හෝ සමාගමට පැවරී ඇති විට, ණය සහ ණය ආශ්‍රිත ඉඩහැරීම් සමාගම ලියාහරියි.

හානිකරණය හඳුනාගත් පසු ඇති වූ සිදුවීමක් නිසාවෙන්, පසු වසරකදී හානිකරණ අලාභය ඉහළයාම හෝ පහළ යාම සිදුවෙයි. අනාගත ලියාහැරීමක් පසුව නැවත අයකරගතහොත්, අයකරග ැනීම ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැයට බැර කරයි.

## 2.5.5.2 මූල්‍ය වගකීම්

වෙළඳ ගෙවිය යුතු දෑ, ආශ්‍රිත පාර්ශවයන්ට ගෙවිය යුතු දෑ, බැංකු අයිරා සහ පොලි සහිත ණය ගැනීම් සමාගමේ මූල්‍ය වගකීම් වලට ඇතුලත් වේ.

### මූලික හඳුනා ගැනීම සහ මැණීම

ශ්‍රීලගිප්‍ර 39 යේ විෂය පථය තුළ වූ මූල්‍ය වගකීම්, ලාභාලාභ තුලින් සාධාරණ අගයට තබාගන්නා මූල්‍ය වගකීම්, ණය සහ ණයට ගැනීම් සහ ඵලදායි ඉදිරි රැකුමක් සඳහා යොමුකරන ලද ව්‍යුත්පන්නයන්, සුදුසු පරිදි වර්ග කෙරේ. සමාගම මූලික හඳුනාග ැනීමේ දී මූල්‍ය වගකීම් වර්ග කිරීම තීරණය කරයි.

සියලු මූල්‍ය වගකීම් මූලිකව සාධාරණ අගයට හඳුනාගන්නා අතර, ණය සහ ණයට ගැනීම් ක්‍රමක්ෂය පදනමට තබාගනී. ඍජුව හඳුනාගතහැකි ගනුදෙනු පිරිවැය මීට ඇතුලත් වේ. මූලික සාධාරණ අගය සහ නාමික අගය අතර යම් වෙනසක් ඇත්නම්, එය මෙහෙයුම් කල්බදු ආදායම් කොටසක් වශයෙන් ඇතුලත් කරන අතර, අදාල කාලසීමාව පුරාවට සරල මාර්ග ක්‍රමයට හඳුනාගනු ලබයි.

### පසුකාලීන මැනීම

පහත සඳහන් පරිදි මූල්‍ය වගකීම් මැනීම ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී:

**ආ) ණය සහ ණය ගැනීම්**

මූලික හඳුනාගැනීමට පසුව පොළී සහිත ණය සහ ණය ගැනීම් සඵල පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට පසු කාලීනව මනිනු ලැබේ. සඵල පොලී අනුපාත ක්‍රමක්ෂය පිරිවැය ක්‍රියාවලිය තුළ මෙන්ම වගකීම් ඉවත්කිරීම් සිදු කරනවිට ආදායම් ප්‍රකාශය තුළ ලාභ අලාභ හඳුනාගැනේ.

අත්පත් කරගැනීමේ දී ඇති වූ යම් වට්ටමක් සහ අධිමිලක් සහ සඵල පොලී අනුපාතයේ සංකලනික කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගෙන ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ. සඵල පොලී අනුපාත ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුළ ඇතුලත් කරයි.

### ඉවත් කිරීම

වගකීම යටතේ ඇති බැඳියාව පියවා ඇති විට හෝ අවලංගුකර ඇතිවිට හෝ කල් ඉකුත්ව ඇතිවිට මූල්‍ය වගකීමක් ඉවත් කෙරේ. සැලකිය යුතු ලෙස වෙනත් කොන්දේසි මත එම ණය දෙන්නාගෙන්ම හෝ පවතින වගකීමක කොන්දේසි සැලකිය යුතු ලෙස නවීකරණය කිරීමෙන් හෝ දැනට පවතින මූල්‍ය වගකීමක් වෙනසක් මගින් ප්‍රතිසම්පාදනය කලවිට, එවැනි හුවමාරුවක් හෝ නවීකරණයක් මුල් වගකීම ඉවත් කිරීමක් ලෙස සහ නව වගකීමක් හඳුනා ගැනීමක් ලෙස සලකනු ලබන අතර අදාළ ධාරණ අගයන්ගේ වෙනස ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

### 2.5.6 සාධාරණ අගය මැනීම

මැනීම කරන දිනට නිසිලෙස කරන ගනුදෙනුවක දි වෙළෙඳපොල පාර්ශවකරුවන් අතර වත්කමක් විකිණීමට ලැබෙන මුදල් හෝ වගකීමක් පැවරීමට ගෙවනු ලබන මිල සාධාරණ අගය වේ. වත්කමක් විකිණීම හෝ වගකීම පැවරීමට වන ගනුදෙනුව

- වත්කම හෝ වගකීම සඳහා වන ප්‍රධාන වෙළෙඳපොලේ දී

  හෝ

- ප්‍රධාන වෙළෙඳපොලක් නැතිවිට දී වත්කම හෝ වගකීම සඳහා වන වඩාත්ම වාසිදායක වෙළෙඳපොලේදී

සිදුවේය යන පූර්ණ නිගමනය මත සාධාරණ අගය මැනීම රඳා පවතී

ප්‍රධාන හෝ වාසිදායක වෙළෙඳපොල සමාගමට ඇතුලත් විය හැකි වෙළෙඳපොලක් වියයුතුය.

වෙළෙඳපොලට සහභාගීවන්නන් තමන්ට ආර්ථික වශයෙන් වඩාත්ම වාසිදායක ලෙසට හැසිරේය යන උපකල්පනය කරමින් වත්කම හෝ වගකීම මිල කිරීමේ දී වෙළෙඳපොලට සහභාගීවන්නන් කරනු ලබන උපකල්පන මත පදනම්ව සාධාරණ අගය මනිනු ලැබේ.

ඉහළම හා හොඳම භාවිතය යොදාගනිමින් හෝ ඉහළම සහ හොඳම භාවිතය යොදාගනු ඇතැයි සැලකෙන වෙනත් වෙළෙඳපොලට සහභාගීවන්නෙකුට විකිණීමෙන් වෙළෙඳපොලට සහභාගීවන්නෙකුට ඇති ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කිරීමේ හැකියාව මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මැනීමේ දී සැලකිල්ලට ගනු ලැබේ.

ඇගයුම් කිරීමේ දී අදාල නිරීක්ෂණය කලහැකි යෙදවුම් භාවිතය උපරිම කරමින් සහ නිරීක්ෂණය කල නොහැකි යෙදවුම් භාවිතය අවම කරමින් අවස්ථාවට යෝග්‍ය ශිල්පක්‍රම සමාගම යොදාගනී.

සාධාරණ අගය මනිනු ලැබූ හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරනු ලැබූ සියලුම වත්කම් හා වගකීම් සාධාරණ අගය මැනීමට සමස්තයක් වශයෙන් වැදගත් පහළම මට්ටමේ යෙදවුම් මත පදනම්ව, සාධාරණ අගය ධූරාවලිය තුල පහත සඳහන් පරිදි වර්ග කරනු ලබයි.

- මට්ටම 1 - සමාන වත්කම් හෝ වගකීම් සඳහා ක්‍රියාකාරී වෙළෙඳපොලෙහි ලැයිස්තුගත (නොගැලපූ) මිල ගණන්
- මට්ටම 2 - සාධාරණ අගය මැනීමට වැදගත් ඍජුව හෝ වක්‍රව නිරීක්ෂණය කල හැකි පහළම මට්ටමේ යෙදවුම් සඳහා වන ඇගයීම් ක්‍රම
- මට්ටම 3 - සාධාරණ අගය මැනීමට වැදගත් සාධාරණ අගය හෙළිදරව් කිරීම සඳහා නිරීක්ෂණය කල නොහැකි පහළම මට්ටමේ යෙදවුම් ඉහත විස්තරකර ඇති ආකාරයට ස්වභාවය, ගුණාංග, වත්කම් හා වගකීම් වල අවධානම් සහ සාධාරණ අගය ධූරාවලියේ මට්ටම පදනම් කරගෙන සමාගම වත්කම් හා වගකීම් පන්තීන් තීරණය කර ඇත.

### 2.5.7 තොග

යල් පැන ගිය සහ සංසරණය අඩු අයිතමයන් සඳහා ප්‍රමාණවත් පරිදි වෙන්කිරීමක් කල පසු, පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු වටිනාකමට තොග ආගණනය කෙරේ. සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු තුළ තොග සහ විකිණිය හැකි මිලක් නිම කිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය සහ විකිණීම සිදුකිරීමට අත්‍යවශ්‍ය වන ඇස්තමේන්තුගත පිරිවැය අඩුකල පසු ශුද්ධ උපලබ්ධි අගය වේ.

තොග වර්තමාන තත්ත්වයට සහ ස්ථානයට ගෙන ඒමේ දී දරන ලද පිරිවැය, සූත්‍රය භාවිතා කිරීමෙන් ගිණුම්ගත කරනු ලැබේ.

| | | |
|---|---|---|
| පාරිභෝජන ද්‍රව්‍ය, මෝටර් රථ අමතර කොටස් හා අළුත්වැඩියාව සඳහා වන සාමාන්‍ය ද්‍රව්‍ය | - | බරතැබූ සාමාන්‍ය පදනම මත ගැනුම් පිරිවැයට |
| නිමි තොග | - | සත්‍ය ගැනුම් පිරිවැයට |

### 2.5.8 දේපල,පිරියත සහ උපකරණ

එදිනෙදා නඩත්තු කිරීමේ පිරිවැය හැර, පිරිවැයේ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණය අඩුකල පසු අගයට දේපල, පිරියත සහ උපකරණ දක්වා ඇත. හදුනාගැනීමේ නිර්මාපකය සපුරාලන්නේ නම් දේපල, පිරියත සහ උපකරණවල කොටසක් ප්‍රතිසම්පාදනය කිරීමේ පිරිවැය, දැරූවිට එවැනි පිරිවැයට ඇතුලත් වේ.

තව දුරටත් අසම්පූර්ණ තත්ත්වයේ පවතින, භාරගත් කාර්යයන් මත ගෙවන ලද, සියලුම අගයන් කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩවලින් පෙන්නුම් කරයි.

අවිනිශ්චිත ජීව කාලයක් පවතින බවට සැලනෙ නිසාවෙන් ඉඩම් ක්‍ෂය නොකරයි. සෑම වත්කමකම පිරිවැය, එකී වත්කම්, භාවිතා කිරීමට හැකි තත්ත්වයට පත්වූ දින සිට ඇරඹෙන පරිදි වන ඒවායේ ඵලදායී ජීවිත කාලය ඒවායේ සුන්බුන් අගයට දක්වා බෙදාහැරීම සඳහා සරල මාර්ග ක්‍රමය මත ක්‍ෂයවීම් ගණනය කරයි. වත්කම් විකිණීමේ දී වත්කම ඉවත්කරන දින සිට ක්‍ෂයවීම් අවසාන කරයි.

වත්කම්වල සුන්බුන් අගය, ඵලදායී ජීවිත කාලයක් සහ ක්ෂය ක්‍රමය සමාලෝචනය කොට යෝග්‍ය වන්නේ නම්, අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේ දීම ගලපනු ලබයි.

වත්කමක ධාරණ අගය එහි අපේක්ෂිත අයකරගත හැකි අගයට වඩා වැඩි වන්නේ නම්, වත්කමක ධාරණ අගය වහාම එහි අයකර අගය දක්වා කපා හරිනු ලබයි.

විකිණීමෙන් ලද මුදල් ධාරණ අගය සමග සැසඳීමෙන් විකිණීම මත ලාභ අලාභ තීරණය කරනු ලබන අතර ඒවා ආදායම් ප්‍රකාශයෙහි ඇතුලත් කරනු ලබයි.

### 2.5.9 අස්පෘශ්‍ය වත්කම්

**ආ) ආයතන සම්පත් සැලසුම්කරන (ERP) පද්ධතිය සහ ආයතන සම්පත් සැලසුම්කරන (ERP) බලපත්‍ර ගාස්තු**

මිලට ගත් මෘදුකාංග සඳහා බලපත්‍ර ලබාගැනීමේ දී දරණ ලද පිරිවැය බලපත්‍ර ගාස්තු මගින් පෙන්නුම් කරයි. බලපත්‍ර ගාස්තු පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය අඩුකොට ගෙන යයි. බලපත්‍රවල පිරිවැය ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය වන වසර 5 පුරා බෙදාහැරීම සඳහා සරල මාර්ග ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය ගණනය කරයි.

### 2.5.10 මුදල් හා මුදල් සමාන දෑ

අතැති මුදල් ඉල්ලුම් තැන්පතු සහ පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ හැකි සහ වටිනාකම වෙනස්වීම සම්බන්ධයෙන් නොසැලකියයුතු තරමේ අවදානමක් සහිත, ඉහළ ද්‍රවශීලතාවයන් ඇති කෙටිකාලීන ආයෝජන වශයෙන් මුදල් හා මුදල් සමාන දෑ අර්ථකථනය කරනු ලබයි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වන්නේ අතැති මුදල් සහ පියවිය යුතු බැංකු අයිරාව අඩුකල පසු ඉතිරිවන බැංකු තැන්පතු වලිනි. මාස තුනක් හෝ ඊට අඩු කල්පිරීම් සහිත ආයෝජනද මුදල් හා මුදල් සමාන දෑ ලෙස සලකනු ලැබේ.

### 2.5.11 මූල්‍ය නොවන වත්කම් හානිකරනය

අවිනිශ්චිත ජීව කාලයක් සහිත වත්කම් ක්‍රමක්ෂය වීමට භාජනය නොකරන අතර, හානිකරනයවීම සම්බන්ධව පරීක්ෂා කරනු ලබයි. ධාරණ අගය අයකරගැනීමට නොහැකි වනු ඇති බවට සිදුවීම් හෝ අවස්ථාවන්ගේ වෙනස්කම් පෙන්නුම් කරන විට දී, ක්‍රමක්ෂය සඳහා භාජනය වන වත්කම් හානිකරනය සඳහා සමාලෝචනය කරනු ලැබේ. වත්තමක ධාරණ අගය එහි ආපසු අයකරගත හැකි අගය ඉක්මවන ප්‍රමාණයට හානිකර අලාභය හඳුනාගනු ලැබේ. ආපසු අයකරගත හැකි අගය වන්නේ වත්කමේ සාධාරණ අගයෙන් එය විකිණීමට යන පිරිවැය අඩුකල පසු ලැබෙන අගය සහ භාවිත අගය යන දෙකෙන් වඩා වැඩි අගයයි. හානිකරනය තක්සේරු කිරීම සඳහා වෙන් වෙන්ව හඳුනාගත හැකි මුදල් ප්‍රවාහයන් (මුදල් ජනනය කරන ඒකක) ඇති පහළම මට්ටම් වලට වත්කම් කාණ්ඩ කරනු ලැබේ.

### 2.5.12 වෙන්කිරීම්

සමාගමට, අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් වර්තමාන බැඳීමක් (නීතිමය හෝ සම්ප්‍රයුක්ත) පවතින විට, මෙම බැඳීම් නිරාකරණය කිරීමට ආර්ථික ප්‍රතිලාභ හි බැඳුණු සම්පත් පිටතට ගලායාමේ සම්භාවිතාවක් ඇති විට සහ බැඳීමේ ප්‍රමාණය පිළිබඳව විශ්වාසදායක ලෙස ඇස්තමේන්තුවක් කලහැකි විටක, වෙන්කිරීම් හඳුනාගනු ලැබේ. වෙන්කිරීම මුළුමනින්ම හෝ කොටස් ප්‍රතිපූර්ණ කිරීමට සමාගම අපේක්ෂා කරනවිට, එම ප්‍රතිපූර්ණය සැබවින්ම නිශ්චිත නම් පමණක්, එය අඩුකල පසු ලැබෙන අගයට ආදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කරනු ලැබේ. මුදලේ කාල වටිනාකම සැලකිය යුතු වන්නේ නම්, වෙන්කිරීම් තීරණය කරනු ලබන්නේ, අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් මුදලේ කාල වටිනාකම පිළිබඳ ප්‍රවර්තන වෙළෙඳපොල තක්සේරුකිරීම් සහ යෝග්‍ය විටදී වගකීමට විශේෂිත වන අවදානම පෙන්නුම් කරන බදු පෙර අනුපාතයට වට්ටම් කිරීමෙහි වට්ටම් කිරීම භාවිතා කරන විට, කාල පරාසය හේතුවෙන් වෙන්කිරීමෙහි සිදුවන ඉහළයාම, පොළී වියදම් ලෙස හඳුනා ගැනේ.

### 2.6 සේවක ප්‍රතිලාභ

**අ) නිශ්චිත ප්‍රතිලාභ බැඳීම - පාරිතෝෂික**

'ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය' භාවිතා කරමින් සෑම මූල්‍ය වර්ෂයකදීම, ආයුගණකයකුගේ අවවාද අනුව සමාගම විසින් නිශ්චිත සැලසුමක් ලෙස සලකනු ලබන පාරිතෝෂික බැඳීම්වල පොරොන්දු වූ විශ්‍රාම ප්‍රතිලාභවල වර්තමාන අගය ගිණුම් කරනු ලබයි. ආයුගණක ලාභ සහ අලාභ ඒවා හටගන්නා කාලසීමාව තුලදී වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනාගනු ලබයි. වගකීම මූල්‍යනය කරනු නොලැබේ.

***ආයුගණන ලාභ සහ අලාභ හඳුනාගැනීම***

ආයුගණන ලාභ සහ අලාභ ඒවා හටගන්නා වර්ෂය තුලදී වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනාගනු ලබයි.

**ආ) නිශ්චිත දායක සැලසුම්**

සමාගම නිශ්චිත දායක සැලසුමක් ද ක්‍රියාත්මක කරයි. නිශ්චිත දායක සැලසුම සඳහා ගෙවිය යුතු දායකය, සේවකයන් විසින් සමාගමට සැපයූ සේවයට සමානුපාතික වන අතර,'කාර්යමණ්ඩල වියදම්' යටතේ වාර්තා කරයි. නොගෙවූ දායක මුදල් වගකීමක් ලෙස වාර්තා කරයි. සමාගම පහත සඳහන් යෝජනාක්‍රම සඳහා දායක වේ.

***සේවක අර්ථසාධක අරමුදල***

සමාගම හා සේවකයා විසින් පිළිවෙලින් සේවකයාගේ මාසික දළ වැටුපෙන් (අතිකාල රහිතව) 15% සහ 10% බැගින් සේවක අර්ථසාධක අරමුදලට දායක වේ.

***සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල***

සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් පවත්වාගෙන යන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට සේවකයාගේ මාසික දළ වැටුපෙන් (අතිකාල රහිතව) 3% ක් සමාගම දායක වේ.

**ඇ) වෛද්‍ය ප්‍රතිලාභ යෝජනාක්‍රමය**

2017 සැප්තැම්බර් දක්වා, CPSTL සේවකයින් සඳහා වෛද්‍ය ප්‍රතිලාභ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ සකසුරුවම් සමිතිය තුළින් පාලනය කරන ලදී. 2017 ඔක්තෝබර් සිට ක්‍රියාත්මක වන පරිදි, CPSTL එහි සේවකයින් සඳහා රක්ෂණ සමාගමකින් සමූහ වෛද්‍ය රක්ෂණ ඔප්පුව ලබාගෙන ඇති අතර රක්ෂණ සමාගමට ගෙවූ රක්ෂණ වාරිකය ලාභ හා අලාභ ගිණුමට අය කෙරේ.

## 2.7 නිකුත් කරන ලද නමුත් තවම බලාත්මක නොවන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවල බලපෑම

නව ගිණුම් ප්‍රමිත සමහරක් සහ පවතින ප්‍රමිත වලට සංශෝධන වැඩි දියුණු කිරීම් ප්‍රකාශයට පත්කොට ඇති වුවත් 2017 මාර්තු 31 ගිණුම් කාලපරිච්ඡේදය සඳහා අනිවාර්ය නොවේ. ඒවායින් කිසිවක් සමාගම විසින් පෙර භාවිතා කර නොමැත.

### ශ්‍රීලමුවාප්‍ර 9 මූල්‍ය සාධන පත්‍ර

2014 දෙසැම්බර් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින්, මූල්‍ය සාධන පත්‍ර ව්‍යාපෘතිවල සියලුම අවධීන් ප්‍රතිබිම්බනය කරන ශ්‍රීලමුවාප්‍ර 9 මූල්‍ය සාධන පත්‍ර වල අවසාන පිටපත නිකුත් කර ඇති අතර, එය මූල්‍ය සාධන පත්‍ර හදුනාගැනීම සහ මැණීම සඳහා වන ශ්‍රීලගිප්‍ර 39 වෙනුවට ඉදිරිපත් කර ඇත. හානිකරනය වර්ගීකරණය සහ මැණීමේ සහ මතු සුරක්ෂණ ගිණුම්කරණය පිළිබඳ නව අවශ්‍යතාවයන් ප්‍රමිතිය මගින් හදුන්වා දී ඇත. පෙර භාවිතයට අවසර ලබාදෙමින්, 2018 ජනවාරි 01 දායින් පසුව ඇරඹෙන වාර්ෂික කාලපරිච්ඡේදයන් සඳහා බලාත්මක වේ. අතීතයට බලපාන ලෙස භාවිත කිරීම අවශ්‍ය වේ. නමුත් සංසන්දනාත්මක තොරතුරු අනිවාර්ය නොවේ. ශ්‍රීලමුවාප්‍ර 9 මගින් වියහැකි බලපෑමේ ප්‍රමාණය කළමනාකරණය විසින් තීරණය කල යුතුව ඇත.

### ශ්‍රීලමුවාප්‍ර 15 ගනුදෙනුකරුවන් සමග ඇති ගිවිසුම් වලින් අයභාරය

ගණුදෙනුකරුවකු සමග ඇති ගිවිසුම් මගින් ජනනය වන ආකාරයේ සහ මුදල් ප්‍රවාහයන්ගේ ස්වභාවය, ප්‍රමාණය, කාලය සහ අවිනිශ්චිතතාවය පිළිබඳව මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට ප්‍රයෝජනවත් තොරතුරු වාර්තා කිරීම සඳහා ආයතනයක් විසින් අනුගමනය කලයුතු මූලධර්ම සකස්කිරීම මෙම ප්‍රමිතියේ අරමුණ වේ. ශ්‍රීලමුවාප්‍ර 15 2018 ජනවාර් 01 දින බලාත්මකවන අතර ශ්‍රීලමුවාප්‍ර 15 මගින් විය හැකි බලපෑමේ ප්‍රමාණය කළමනාකරණය විසින් තීරණය කල යුතුව ඇත.

### ශ්‍රීලමුවාප්‍ර 16 කල්බදු

2016 ජනවාරියේ දී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් කල්බදු ගිණුම්කරණය සඳහා ශ්‍රීලමුවාප්‍ර 16 කල්බදු බව ප්‍රමිතය නිකුත්කර ඇත. නව ප්‍රමිතය මගින් කල්බදු දීමනාකරුවන් සඳහා කල්බදු ගිණුම්කරණය සැලකියයුතු ලෙස වෙනස් කර නැත. කෙසේ නමුත් කල්බදු ගිණුම් කරුවන්ට ඔවුන්ගේ ශේෂපත්‍ර වල පාවිච්චි කිරීමට ඇති අයිතිය අනුරූපිත වත්කමක් ලෙස ගෙන,වගකීම් ලෙස හදුනාගැනීමට අවශ්‍යවේ. සියලුම හදුනාගත් කල්බදු සඳහා කල්බදු ගැණුම් කරුවන් විසින් එක් ආකෘතියක් යොදාගතයුතු නමුදු 'කෙටිකාලීන' කල්බදු සහ 'අඩු වටිනාකම්' සහිත වත්කම් හදුනා ගැනීමට, තෝරාග ැනීමක් කල හැක. සාමාන්‍යයෙන් හදුනාගත් කල්බදු සඳහා ලාභ හෝ අලාභ හඳුනාගැනීමේ රටාව, වර්තමානයේ මූල්‍ය කල්බදු ගිණුම්කරණයට සමානවනු අති අතර, පොලී සහ ක්ෂය වියදම් ලාභාලාභ ප්‍රකාශයේ වෙන්වෙන්ව හදුනාගනු ලබයි.

2019 ජනවාරි 01 දායින් පසුව ඇරඹෙන වාර්ෂික කාලපරිච්ඡේදයන් සඳහා රශ්‍රීලමුවාප්‍ර 16 බලාත්මක වේ. පෙර භාවිතයට අවසර ඇති නමුදු අයිතීත්වය විසින් ජාමුවාප්‍ර 15 භාවිතයට පෙර නොවිය යුතුය. අතීතයට බලපාන ලෙස භාවිත කිරීම හෝ වැඩි දියුණු කරන ලද ක්‍රමවේදයන් යොදා ගනිමින් ප්‍රමිතය භාවිත කිරීම සඳහා කල්බදු ගැනුම් කරුට තෝරාගත හැක. ප්‍රමිතයේ සංක්‍රාන්ති ප්‍රතිපාදනයන් යම් සහනයක් සලසයි.

ශ්‍රීලමුවාප්‍ර 16 මගින් වියහැකි බලපෑමේ ප්‍රමාණය කලමණාකරණය විසින් තීරණය කල යුතුව ඇත.

### ශ්‍රීලගිප්‍ර 07 මුදල් ප්‍රවාහ ප්‍රකාශයට සංශෝධන

මූල්‍ය ක්‍රියාකාරකම්වල හෙළිදරව් කිරීම් වැඩිදියුණු කිරීමේ සහ වාර්තාකරන අස්ථිත්වයේ ද්‍රවශීලතා තත්ත්වය පිළිබඳව භාවිතාකරන්නන්ට හොඳින් වටහා ගැනීමට උදව් කිරීමට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් 2016 සැප්තැම්බර් මස ශ්‍රීලගිප්‍ර 07 මුදල් ප්‍රවාහ ප්‍රකාශයට සංශෝධනයක් නිකුත් කර ඇත. නව අවශ්‍යතාවයන් යටතේ මුදල් ප්‍රවාහයන් සහ මුදල් නොවන අයිතමයන්ගේ වෙනස්කම් වැනි මූල්‍ය ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් වශයෙන් අස්ථිත්වයන්ගේ මූල්‍ය වගකීම්වල සිදුවන වෙනස්කම් අස්ථිත්වයන් විසින් හෙළිදරව් කල යුතුය. (උදා: විදේශ විනිමය චලනයන් හේතුවෙන් ඇතිවන ලාභ සහ අලාභ) සංශෝධනයන් 2017 ජනවාරි 01 දින බලාත්මක වේ.

### අගිප්‍ර 12 ආදායම් බදු ට සංශෝධන

2016 සැප්තැම්බර් මස දී අගිප්‍ර 12 ට සංශෝධනයන් ඉදිරිපත් කිරීම තුලින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ගිණුම්කරණය සඳහා සාධාරණ අගයටත්, බදු කටයුතු සඳහා පිරිවැයටත් මනින ලද ණය සාධන පත්‍රවල විලම්බිත බදු වත්කම් සඳහා වන ගිණුම්කරණ ක්‍රමය පැහැදිලි කරයි. සංශෝධනයන් 2017 ජනවාරි 01 දින බලාත්මක වේ. සංශෝධන යොදා ගැනීමෙන් සමාගමේ මූල්‍ය ප්‍රකාශ වලට බලපෑමක් ඇතිවනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

## 2.7.1 පොදු භාවිත පහසුකම් කොටස් හිමියන්ගේ ගිවිසුම හා කොටස් විකුණුම් මිලට ගැනීමේ ගිවිසුම කල් ඉකුත් වීම

ලංකා ඛනිජතෙල් සංස්ථාව, ලංකා ඉන්දියන් තෙල් සමාගම පීඑල්සී, සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් කොටස් හිමියන්ගේ ගිවිසුම සහ කොටස් විකුණුම් මිලට ගැනීමේ පොදු භාවිත පහසුකම් ගිවිසුම 2008 දෙසැම්බර් 31 දා කල් ඉකුත් විය. එම ගිවිසුම අලුත් කිරීම හෝ දීර්ඝ කිරීම තවම අවසන් කොට නොමැති අතර එය ගිවිසුමේ කොන්දේසි සහ සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් අනුමත කරන ලද යම් පසුකාලීන වෙනස්කම් සැලකිල්ලට ගැනීමෙන් පසු මෙම ගිවිසුමට අදාළ ආදායම් වියදම් මෙම මූල්‍ය ප්‍රකාශවල ගිණුම්ගත කර ඇත.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන් (ඉතිරි කොටස)

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | | 2017 රු | 2016 රු |
|---|---|---|---|
| **3.** | **ආදායම්** | | |
| **3.1** | **ප්‍රධාන ආදායම** | | |
| | පර්යන්ත ආදායම | 7,306,421,290 | 6,622,880,272 |
| | මෙහෙයුම් ආන්තිකය | 3,264,482,431 | 2,958,442,733 |
| | ප්‍රතිපූර්ණය කළහැකි ණය පොළිය | 708,163,767 | 642,628,413 |
| | | 11,279,067,487 | 10,223,951,417 |
| | **සේවා සැපයීම** | | |
| | ප්‍රවාහන ආදායම | 2,663,173,275 | 2,439,493,091 |
| | තෙල් නැව් මෙහෙයුම් | 233,906,148 | - |
| | | 2,897,079,423 | 2,439,493,091 |
| | **මුළු ආදායම** | 14,176,146,910 | 12,663,444,509 |
| **4** | **වෙනත් මෙහෙයුම් ආදායම** | | |
| | කාර්ය මණ්ඩල ණය සහ වෙනත් දෑ සඳහා පොලිය | 352,767,469 | 315,980,353 |
| | දේපල, පිරියත හා උපකරණ විකිණීම මත ලාභය | 3,594,938 | 51,245,219 |
| | කුලී ආදායම් | 9,451,537 | 9,557,417 |
| | මුදාහැරීමේ ගාස්තු | 1,050,000 | 2,700,000 |
| | විද්‍යාගාර පරීක්ෂණ ගාස්තු | 51,377,845 | 41,750,932 |
| | පුද්ගලික ටැංකිරථ රියදුරන්ට/පොටර්වරුන්ට පුහුණුව | 7,232,797 | 5,068,773 |
| | සුන්බුන් අලෙවිය | 7,964,028 | 17,768,012 |
| | ගිනි නිවීමේ උපකරණ සේවා | 7,050,482 | 9,997,033 |
| | ක්‍රමාංකන ගාස්තු | 7,435,089 | 6,216,158 |
| | විවිධ ආදායම | 5,725,684 | 18,869,344 |
| | සංචාරක බංගලා ආදායම | 840,425 | 882,205 |
| | ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු | 3,306,150 | 3,165,029 |
| | | 457,796,444 | 483,200,474 |
| **5.** | **මූල්‍ය ආදායම වියදම්** | | |
| **5.1** | **මූල්‍ය ආදායම** | 164,547,193 | 84,761,790 |
| | ප්‍රති ආයොජන (REPO) මත පොළිය | 24,893,612 | 5,608,006 |
| | ස්ථාවර තැන්පතු ආයෝජන මත පොළිය | 189,440,805 | 90,369,796 |
| **5.2** | **මූල්‍ය පිරිවැය** | | |
| | බැංකු ණය පොළිය | 124,072,738 | 166,775,397 |
| | | 124,072,738 | 166,775,397 |

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන් (ඉතිරි කොටස)

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | | 2017 රු | 2016 රු |
|---|---|---|---|
| **6.** | **බදු පෙර ලාභය** | | |
| | ***පහත දෑ අයකිරීමෙන්/බැරකිරීමෙන් පසු*** | | |
| | **සෘජු වියදම්වල ඇතුළත් දෑ** | | |
| | පුද්ගලික පිරිවැය | 2,403,087,576 | 2,329,533,369 |
| | වසර සඳහා ක්ෂයවීම් ගාස්තු | 755,314,575 | 694,018,639 |
| | පරිපාලන වියදම්වල ඇතුළත් දෑ | | |
| | අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික | 7,479,373 | 5,322,273 |
| | අධ්‍යක්ෂවරු සඳහා ගාස්තු | 2,305,000 | 2,030,000 |
| | පුද්ගලික පිරිවැය | 2,783,783,740 | 3,130,050,416 |
| | නිශ්චිත ප්‍රතිලාභ බැඳීම : වසර සඳහා ගාස්තුව | 242,188,768 | 204,224,090 |
| | විගණන ගාස්තුව - පවත්නා වසර | 1,800,000 | 1,766,371 |
| | වසර සඳහා ක්ෂයවීම් ගාස්තු | 123,041,041 | 106,921,418 |
| | වසර සඳහා ක්‍රමක්ෂය ගාස්තු | 7,331,222 | 9,740,641 |
| | වෙළෙඳ හා අනෙකුත් ලැබීම් හි හානිකරණය සඳහා අත්තිකාරම් | (2,705,842) | 11,645,362 |
| | තොග සඳහා වෙන්කිරීම | 10,193,802 | (50,699,287) |

**7.** **බදු වියදම්**

2017 දෙසැම්බර් 31 සහ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ආදායම් බදු වියදම්වල ප්‍රධාන සංරචක පහතින් දැක්වේ :

| | | 2017 රු | 2016 රු |
|---|---|---|---|
| **7.1** | **ආදායම් ප්‍රකාශය** | | |
| | ප්‍රවර්තන ආදායම් බද්ද | | |
| | ප්‍රවර්තන බදු වියදම් | 472,786,727 | 182,283,884 |
| | පෙර වර්ෂය වෙනුවෙන් ප්‍රවර්තන බදු ඌණ / අධි වෙන්කිරීම | (23,205,120) | 45,781,512 |
| | විලම්භිත බදු | | |
| | විලම්භිත බදු අයකිරීම /(බැර) (සටහන 8) | 24,155,981 | 363,378,298 |
| | ආදායම් ප්‍රකාශනයේ වාර්තාකරන ආදායම් බදු වියදම /(බැර) | 473,737,588 | 591,443,694 |

**7.2 2017 දෙසැම්බර් 31 සහ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා බදු වියදම හා ගිණුම්කරණ ලාභය ව්‍යවස්ථාපිත බදු අනුපාතයෙන් ගුණ කිරීමෙන් ලද ලාභය අතර සැසැඳුම පහත දැක්වේ :**

| | 2017 රු | 2016 රු |
|---|---|---|
| බදු පෙර ගිණුම්කරණ ලාභය | 3,273,309,403 | 2,330,073,120 |
| ඉඩ නොදෙන ලද සමස්ථ අයිතමයන් | 1,325,643,704 | 1,277,272,984 |
| ඉඩ දෙන ලද සමස්ථ අයිතමයන් | (1,783,288,276) | (1,591,594,363) |
| | 2,815,664,831 | 2,015,751,741 |
| පොළී ආදායම | 542,208,274 | 406,350,149 |
| මුළු ව්‍යවස්ථාපිත ආදායම | 3,357,873,104 | 2,422,101,890 |
| අඩුකළා : ඉදිරියට ගෙනා භාවිතාකළ බදු අලාභ | (232,124,899) | (847,735,662) |
| බදුකළහැකි ලාභය | 3,125,748,205 | 1,574,366,228 |
| බදුකළහැකි ලාභය සඳහා ආදායම් බදු | 472,786,727 | 182,283,884 |
| **ප්‍රවර්ථන ආදායම් බදු වියදම්** | 472,786,727 | 182,283,884 |

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන් (ඉතිරි කොටස)

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | මූල්‍ය තත්ව ප්‍රකාශය | | විස්තීරණ ආදායම ප්‍රකාශය | | වෙනත් විස්තීරණ ආදායම | |
|---|---|---|---|---|---|---|
| | 2017 රු | 2016 රු | 2017 රු | 2016 රු | 2017 රු | 2016 රු |
| **8.1 විලම්භිත බදු** | | | | | | |
| **විලම්භිත බදු වත්කම්, වගකීම්, සහ ආදායම් බදු පහත දෑ සමඟ සම්බන්ධ වේ:** | | | | | | |
| **විලම්භිත බදු වගකිම්** | | | | | | |
| බදු අරමුණ සඳහා ප්‍රාග්ධන දිමනා | 1,258,921,406 | 1,246,080,289 | 12,841,117 | 356,420,749 | - | - |
| අස්පෘශ්‍ය වත්කම් | 37,336 | 1,042,436 | (1,005,100) | (692,530) | - | - |
| | 1,258,958,742 | 1,247,122,725 | | | | |
| **විලම්භිත බදු වත්කම්** | | | | | | |
| තොග | 19,208,216 | 18,183,253 | (1,024,963) | 1,371,327 | - | - |
| වෙන්කිරීම් | 24,493,908 | 25,338,449 | 844,541 | (8,132,674) | - | - |
| නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් | 198,104,242 | 169,067,700 | (16,275,721) | (63,913,598) | (12,760,821) | 33,409,331 |
| බදු අලාභයෙන් බලපෑම | - | 28,776,108 | 28,776,108 | 78,325,025 | - | - |
| | 241,806,367 | 241,365,510 | | | | |
| විලම්භිත ආදායම් බදු -ආදායම | | | | | | |
| ශුද්ධ විලම්භිත බදු වගකිම/(වත්කම්) | 1,017,152,375 | 1,005,757,215 | 24,155,981 | 363,378,298 | (12,760,821) | 33,409,331 |

**8.2** ඵලදායි බදු අනුපාතයක් භාවිතා කරමින් විලම්භිත බදු ගණනය කර ඇත. බදු අයකළහැකි ආදායමේ වෙනස් මට්ටම්වලට භාවිතා කළ විවිධ බදු අනුපාත හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට රු. 812,449/- ක වැඩි වූ විලම්භිත බදුඇතිකරමින්, බදු අනුපාතය 13.7% සිට 13.44% දක්වා අඩුවී ඇත.

**9.** කොටසක ඉපයීම්

**9.1** කොටසක ඉපයිම ගණනය කරනු ලබන්නේ සාමාන්‍ය ස්කන්ධ ප්‍රාග්ධන හිමිකරුවන්ට ආරෝපිත කාල පරිච්ඡේදය සඳහා වන ශුද්ධ ලාභය වර්ෂය තුළ බර තැබූ සාමාන්‍ය කොටස් ගණනින් බෙදීමෙනි. මෙම පරිච්ඡේදය සහ පෙර කාල පරිච්ඡේදය තුළ හිඟව පවත්නා සාමාන්‍ය කොටස්වල සාමාන්‍ය බරතබන ලද සංඛ්‍යාව ප්‍රසාද දිමනාව වැනි මුලාශ්‍රයන්හී අනුරූප වෙනසක් නොමැතිව හිඟව පවත්නා සාමාන්‍ය කොටස් සංඛ්‍යාව වෙනස් වි ඇති සිදුවීම් සඳහා ගලපනු ලැබේ.

**9.2** කොටසක ඉපයීම ගණනය කිරීම සඳහා භාවිතා කළ ආදායම් සහ කොටස් දත්ත පහතින් දැක්වේ.

| | 2017 රු | 2016 රු |
|---|---|---|
| ලවය වශයෙන් යොදාගත් සංඛ්‍යාවන් | | |
| කොටසක මූලික ඉපයීම් සඳහා සාමාන්‍ය කොටස් හිමියන්ට හිමිවන ශුද්ධ ලාභය | 2,799,571,815 | 1,738,629,426 |
| හරය වශයෙන් යොදාගත් සාමාන්‍ය කොටස් සංඛ්‍යාව | | |
| මූලික කොටසක ඉපයුමට අදාළ වන නිකුත්ව ඇති බරතැබූ සාමාන්‍ය කොටස් ගණන | 750,000,000 | 750,000,000 |
| කොටසක මූලික ඉපයුම | | |
| කොටසක ඉපයුම | 3.73 | 2.32 |

## මූල්‍ය ප්‍රකාශන වලට සටහන් (ඉතිරි කොටස)

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| පිරිවැයට | 2017.01.01 දිනට ශේෂය රු | එකතුකිරීම් රු | බැහැරකිරීම් රු | 2017.12.31 දිනට ශේෂය රු |
|---|---|---|---|---|
| **10. දේපල, පිරියත හා උපකරණ** | | | | |
| **10.1 දළ ධාරණ අගය** | | | | |
| සින්නක්කර ඉඩම් | 4,497,001,663 | | | 4,497,001,663 |
| සින්නක්කර ගොඩනැගිල්ල | 1,546,400,639 | 136,731,142 | | 1,683,131,781 |
| ගබඩා ටැංකිය | 6,490,993,653 | 50,884,475 | | 6,541,878,128 |
| මෝටර් රථ | 1,221,840,429 | 532,925,880 | (1,925,000) | 1,752,841,309 |
| නළ මාර්ග | 7,386,343,576 | 56,733,589 | | 7,443,077,165 |
| ලිබඩු, සවිකිරීම් හා උපකරණ | 2,067,209,127 | 125,625,603 | (56,000) | 2,192,778,730 |
| පරිගණක | 163,671,957 | 7,914,394 | | 171,586,351 |
| තනි/ ද්විත්ව ශීර්ෂ බෝයාව | 2,800,409,453 | 2,800,409,453 | | |
| පොම්ප සහ ග්‍රැන්ට්‍රි | 1,454,452,620 | 45,130 | | 1,454,497,750 |
| ක්ෂයකළ හැකි වත්කම්වල මුළු පිරිවැය | 27,628,323,118 | 910,860,213 | (1,981,000) | 28,537,202,331 |
| නොනිමි ප්‍රාග්ධනය | 797,543,868 | 522,228,210 | (599,798,471) | 719,973,606 |
| | 28,425,866,986 | 1,433,088,423 | (601,779,471) | 29,257,175,937 |

| පිරිවැයට | 2017.01.01 දිනට ශේෂය රු | වසර සඳහා වියදම රු | බැහැරකිරීම් රු | 2017.12.31 දිනට ශේෂය රු |
|---|---|---|---|---|
| **10.2 ක්ෂයවීම්** | | | | |
| සින්නක්කර ගොඩනැගිල්ල | 534,538,342 | 48,148,117 | | 582,686,459 |
| ගබඩා ටැංකිය | 2,274,511,285 | 158,533,789 | | 2,433,045,074 |
| මෝටර් රථ | 1,116,399,930 | 77,940,065 | (1,925,000) | 1,192,414,995 |
| නළ මාර්ග | 2,654,116,151 | 273,872,738 | | 2,927,988,888 |
| ලිබඩු, සවිකිරීම් හා උපකරණ | 1,789,779,856 | 68,138,153 | (14,913) | 1,857,903,096 |
| පරිගණක | 148,307,668 | 6,754,767 | | 155,062,435 |
| තනි/ ද්විත්ව ශීර්ෂ බෝයාව | 2,155,470,283 | 160,547,288 | | 2,316,017,571 |
| පොම්ප සහ ග්‍රැන්ට්‍රි | 952,888,267 | 84,420,695 | | 1,037,308,962 |
| | 11,626,011,781 | 878,355,612 | (1,939,913) | 12,502,427,480 |

| | 2017 රු | 2016 රු |
|---|---|---|
| **10.3 ශුද්ධ පොත් වටිනාකම** | | |
| සින්නක්කර ඉඩම් | 4,497,001,663 | 4,497,001,663 |
| සින්නක්කර ගොඩනැගිල්ල | 1,100,445,323 | 1,011,862,298 |
| ගබඩා ටැංකිය | 4,108,833,054 | 4,216,482,368 |
| මෝටර් රථ | 560,426,315 | 105,440,500 |
| නළ මාර්ග | 4,515,088,277 | 4,732,227,425 |
